සැඟවුණු බොදු මග යළි පුබුදන

# හෙළ බොදු පියුම

ශ්‍රී බු. ව 2557ක් වූ පොසොන් මස (ව්‍යවහාරික වර්ෂ 2013 ජූනි)

20 වෙනි කලාපය



## මැරෙන බහුතරය

### සතර අපායට යන හැටි.....

සැඟව ගිය බොදු මග යළි රැගෙන සෑම පුන් පොහෝ දිනකම එළිදකින දහම් සංග්‍රහය

# සෙතක් ශාන්තියක්ම වේවා !





වසා සිටිනා ලොවේ අවිදුවෙ මෝහයේ බැමි කඳ ඉරා
නසා තුන් දොස් මහා තෙරුවන් ගුණ බලෙන් මෙත් සිත දරා
අසා බුදු බණ සවි සතට මහ සුවය ගෙන දෙන හද පුරා
කසාවත යළි බැබළ වේවා උතුම් වූ මොක් පුර කරා

ගුණේ සහ අගුණයේ ඇති නිසි වෙනස සත හට දැනේවා
පණේ සැම විට ඇති නොතිර බව දහම් නැණසට පෙනේවා
බණේ කියවෙන බවය නසනා තිලකුණට සිත ගෙනේවා
අනේ නොකියන සුවය සලසන නිවන් පුර මග තැනේවා

මහා කල්පයෙ පහළ වූ සිවු බුදුවරුන්ගේ අනුහසින්
පිහා වස් දොස් සතට සෙත දෙන දම් ඇසේවා බුදු බසින්
බහා තුන් දොස් සසර ගෙනියන දවා යළි නොඑනා ලෙසින්
වහා රැව් පිළි රැව් නැගේවා නිවන් දෙන දම් සිවු දෙසින්

ලොවට වින දෙන පව්වු කම් හැම සිත්වලින් පහ කෙරේවා
අවට ඇති විස කිරණ දුරු වී සෙත් කිරණ බල පිරේවා
පවට බර වුණු සිත් සතන් නිසි දම් බලෙන් මග හැරේවා
මුවට නැග එන දම් නදින් යළි නිවන් දොරටුව ඇරේවා

සොවින් තැවෙනා සතට සුව දෙන මුනි දහම් හඬ ඇසේවා
හදින් නැගෙනා මහා ගිනි දැල් ඒ බලෙන් ගෙන නැසේවා
ලොවින් අකුසල් පුරව ගන්නා තුන් පලේ දොර වැසේවා
බවෙන් බවයේ රිදුම් තනනා කෙලෙස් නොම මුණ ගැසේවා

දහම් සුවඳින් ලොවම නැහැවී සවි සතන් සිත සැන සෙනා
පහන් සිතිවිලි හද නැගේවා සසර දුක දුරු කරවනා
අහන්නට ඇති බුදු වදන් මහ සඟ මුවින් යළි යළි තනා
ලිහන්නට දුක දෙවන බව බැමි දම් අසාවා හැම දෙනා

දනන් පීඩා කරවනා නෙක කුරිරු කරදර නොවේවා
ගණන් සියවස් සැඟව ගිය සුව දෙවන දම් ඔසු පෙවේවා
තනන් එමගින් නිවන් පුර මග කෙලෙස් මළ කඳ දැවේවා
දිනන් තුන් ලොව නිවන් සුවයෙන් සියලු සත ලොව නිවේවා

සිතින් සිතකට සාප කරනා සිතක් සත හට නොම යෙදී
ගතින් සිදුවන පාප කම් හැම එම බලෙන් එන්නට නොදී
මෙතින් මෙත කර සතන් එකිනෙක හදවතින් ගුණයට ඇදී
බැතින් සෙත ගෙන දුක නිවේවා අමා මහ නිවනට වැදී

පබැඳුම - නිහිඟඳ චන්දන සිරිවර්ධන

# පහන් දැල්ලෙන් නිවන් දකින හැටි...



චතුරාර්ය සත්‍යය පිළිබඳව අවබෝධයක් නැති කමත්, මනස මුල්වෙලා හෝ සතරමහා භූතයන්ගේ සංකලනයෙන් ගොඩනැඟුන කාම, රූප, අරූප කියන තුන් භවයට හෙවත් ලෝකයට ඡන්දරාගයෙන් ඇලුම් කිරීමත් නිසා, ඒ තුන් ලෝකය තුළ සැරිසරමින් සත්ත්වයා අනන්ත අප්‍රමාණ දුකක් වෙහෙසක් විඳින්නේ, සැප මාත්‍රයන් නිච්ඡ වූ සාර වූ දෙයක් කියල හිතන් ඉන්න නිසා. බෝසතාණන් වහන්සේලා අසංඛ්‍ය කල්ප ලක්‍ෂ ගණනින් පාරමී පුරා බුද්ධත්වයට පත්වීමෙන් පහළ කරගත් ඒ මහා ප්‍රඥාවෙන්, බුද්ධ ඥානයෙන් චතුරාර්ය සත්‍යය ලොවට හෙළි කළා. ඒ මායා ලෝකයෙන් මිදෙන මග වූ, අරි අටඟි මගත් දේශනා කළා.

නිවන ආවරණය කරන පංචනීවරණ නම්, කාමච්ඡන්දය, ව්‍යාපාදය, ථීන මිද්ධය ... ආදී වශයෙන්, පොත පතින් හෝ ධර්ම ශ්‍රවණයෙන් හෝ දැන ගත්තත් ඒ කිව්වෙ මොනවද කියල, එදිනෙදා ජීවිතයේදී කරන කියන කටයුතුවලට ගළපල තෝරා බේරා ගන්න ඕන. ඒ අනුව, සැප මාත්‍රයක බැඳී සිටින ලෝකයාට ඉන් මිදෙන්න අපහසු වෙලා තියෙන ගැටළු කීපයක් පිළිබඳවත් මින් පෙර විග්‍රහ කළා. යැපීමට අත්‍යවශ්‍ය ආහාර, ඇඳුම්, ඉඳුම් හිටුම්, බෙහෙත් ආදිය වැඩි වෙහෙසක් නැතුව ලබාගන්න පුළුවන්නම්, අභියෝග ජය ගන්න පහසුයි. ඒවා ලබා ගන්න, උපයාගත යුතු ධන හතක් පිළිබඳවත් පැහැදිලි කළා.

දැන් ඉතින් ලොකු මුදලකුත් වැය නොකර, නිවන් දකින්න අනුගමනය කරන්න පහසු මගක් සකස් කරගන්න හැටි බලමු. සමහර අය කරන්නන් වාලේ කරනව වුණත් සිහි බුද්ධියෙන් කල්පනා කරල, ඥාන සම්ප්‍රයුක්තව කළොත් නිවන් දකින මගක් වෙන වටිනා දේවල් මේ සමාජයේ තියෙනවා. බොහෝ බෞද්ධ නිවෙස්වල බුදුන්ට කියල පහනක් පත්තු කරනවා. ගාථා කිය කියා ඉන්න වෙලාවක් නැත්නම්, පහන පත්තු කරල ''සාදු! සාදු! සාදු!'' කියල රැකියාවට යනවා. මේ ක්‍රියාවම ඥාන සම්ප්‍රයුක්තව කළොත් ඒක නිවන් දකින මගක් වෙනවා.

පහන් දැල්ල කියන්නෙ මොකක්ද? සත්ත්වයෙක්, පුද්ගලයෙක් නෙවෙයි. නමුත් දැල්ල කියන වචනයෙන් හඳුන්වන යමක් පේන්න තියෙනවා. පහනක් තියෙන නිසයි පහන් දැල්ලක් පේන්නෙ. පහන ඇතුළෙ තෙල් තියෙනවා. ඒ තෙල්වලින් පෙඟුන පහන් වැටියක් (තිරයක්) තියෙනවා. මේ තිරේ අගට ගින්දර ටිකක් දුන්නම පහන දැල්වීමේ ක්‍රියාවලිය ආරම්භ වෙනවා. ඒක පටන් ගන්නෙ කොහොමද කියල විමසල බලමු. තිරය අගට ගින්දර ටික ළං කළාම තිරේ අග තියෙන තෙල් ටික රත්වෙලා, තෙල් වාෂ්ප බවට පත් වෙනවා. තෙල්වලට වඩා තෙල් වාෂ්ප සැහැල්ලුයි. වාෂ්ප වුන තෙල් බිංදු තිරෙන් ගිලිහෙනවා. ඒවා අවට වාතය සමග එකතුවෙලා ගිනි අරගෙන වාතයත් සමගම ඉහළ යනවා. ඉහළ යන ගිනි බිංදුවල තියෙන තෙල් ටික දැවිල ඉවර වුණාම නිවිල යනවා. නමුත් පහනෙ තෙල් තියෙන තුරු තිරේ දිගේ තෙල් ඇදිල එන නිසා, තෙල් වාෂ්ප වෙවී ගිනිගෙන ඉහළ යන ක්‍රියාවලිය නොකඩවා සිද්ධ වෙනවා. ඒ නිසා තිරේ අගිස්සෙ ඉඳල අඟලක් දෙකක් ඉහළට යනතුරු, ගිනිගෙන ඉහළ යන ගිනි බිඳු සමූහයක් දිස් වෙනවා. ඒ නිසා ගිනි බිඳු නිවි නිවී යන බව පේන්නෙ නෑ. මේ ඉතා කුඩා ගිනි බිඳු පියවි ඇසට පේන්නෙ නෑ. ප්‍රඥාවෙන් කල්පනා කරල බැලුවොත් මේ ක්‍රියාවලිය තේරුම් ගන්න පුළුවන්.

මේ ගිනි බිඳු සමූහය, එක එකක් අතරෙ හිඩැසක් නොපෙනෙන තරම් ළංව පිහිටන නිසා අපට පේන්නෙ එක ලොකු ගිනි බිංදුවක් වගේ. උදාහරණ විදියට මිදුලෙ වැලි අතුරල තියෙනවා. ඒ වැලි ඔක්කොම එක තැනකට ගොඩ ගැහුවොත් අපි ඒකට වැලි කැට කියල කියන්නෙ නෑ. වැලි ගොඩක් කියල කියනවා. නමුත් එතන තියෙන්නෙ අතුරල තිබුණ වැලිම තමයි. ඒ වගේ ගිනි බිඳු එක ගොඩක තියෙන කොට ඒකට ගිනි බිංදු නොකියා ''පහන් දැල්ල'' කියල නමක් දෙනවා. පහන් දැල්ල කිව්වෙ සත්වයෙකුට, පුද්ගලයෙකුට නෙවෙයි. ඒකාකාරව මොහොතක්වත් නොපවතින, නමුත් එසේ පවතින බවක් පියවි ඇසට පෙනෙන, දැවි දැවී ඉහළ ගොස් නිවී යන තෙල් බිඳු සමූහයක ක්‍රියාවලියකට. ඒක මායා රූපයක්, හේතු ඵලයක්.

එහෙම නම් පහන් දැල්ල කියන්නෙ, පහනෙ තියෙන තෙල්, පහන් තිරය, අවට තියෙන වාතය, ගින්දර කියන හතර එකතු වෙලා සිද්ධවන ක්‍රියාවලියක් හේතුවෙන් හටගත් ඵලයක්. තෙල් ඉවර වුණත් දැල්ල නිවෙනවා, තිරයක් නැත්නම් දැල්ල නිවෙනවා, වාතය හොඳින් නොතිබුණත් දැල්ල නිවෙනවා, ගින්දර නොලැබුණොත් දැල්ලක් ඇතිවෙන්නෙ නෑ. මේ පහන දැල්වෙන කොට තෙල් ඉවර වෙන්න නොදී, නැවත නැවත තෙල් එකතු කළොත් දොළොස් මාසයක් වුණත් නොනිවී පවතින පහන් දැල්ලක් ඇති සේ පේනවා. නමුත් පළමු මාසයේ පහනට දැමූ තෙල්වල හේතුඵල තමයි ඒ මාසයේ දකින පහන් දැල්ල. දෙවෙනි මාසයේ පහනට දැමූ තෙල්වල හේතුඵලය තමයි ඒ මාසයේ දකින පහන් දැල්ල. මේ මේ හේතු නිසයි, මේ මේ ඵල ඇති වෙන්නෙ, මේ හේතු නැත්නම් මේ ඵලයත් නෑ කියන චතුරාර්ය සත්‍යය මේ පහන උපමා කරගෙන දකින්න පුළුවන්.

චතුරාර්ය සත්‍යය කියන්නෙ දුක, දුකට හේතුව, දුක නැති කිරීම, දුක නැති කිරීමේ මාර්ගය කියල කොච්චර කඩපාඩම් කළත්, මේ න්‍යාය ධර්මය තේරෙන්නෙ නෑ. සසර දුක ගැන කියන්න ඕන කරන දහමක් තමයි චතුරාර්ය සත්‍යය. ඒ නිසා තමයි දුක, දුකට හේතුව ... ආදී වශයෙන් කියන්නෙ. මූලික න්‍යාය තමයි මේ හේතුව ඇති කල්හි මේ ඵලය හට ගනී, මේ හේතුව නිරුද්ධ කිරීමෙන් මේ ඵලය නිරුද්ධ වේ කියන එක.

අපේ ජීවිතයත් මේ පහන් දැල්ල වගෙයි කියන කථාව විග්‍රහ කරල තේරුම් ගන්න ඕන. සංඛ්‍යාවකින් කියන්න බැරි තරම් දීර්ඝ කාලයක් දුක් වේදනා, සැප වේදනා, මධ්‍යස්ථ වේදනා (උපේක්‍ෂා) විඳිමින් සසර ගමනක අපි ඇවිත්

තියෙනවා. ඇවිත් තියෙනවයි කියන වචනය පාවිච්චි කරන්නෙ, මේ කාරණාව පැහැදිලි කරන්න ඕන කරන ව්‍යවහාර භාෂාවේ හැටියට. එහෙම නැතිව සත්වයෙක්, පුද්ගලයෙක් කියන අර්ථයෙන් නෙවෙයි. දැන් විදුලිය විසන්ධි වෙලා තිබිල ආවම අපි කියනව ලයිට් ඇවිල්ල කියල. හැබැයි ලයිට් කිව්වෙ සත්වයෙකුට, පුද්ගලයෙකුට නෙවෙයි. අන්න ඒ වගේ තේරුම් ගන්න ඕන.

අවිද්‍යා තණ්හා සහගත බලාපොරොත්තු ඇතිව, පෙර සසර ගමනේදී ලෝභ, ද්වේෂ, මෝහ කියන අකුසල් සිත් සහ අලෝභ, අද්වේෂ, අමෝහ කියන කුසල් සිත් මුල් කරගෙන සිතින්, කයින්, වචනයෙන් රැස් කරපු සංඛාර (හිතපු, කියපු, කරපු දේවල්) අප්‍රමාණයි. මේ සංඛාර නිසා හටගත් කර්ම ශක්තිය පහනෙ තෙල්වලට උපමා කරන්න පුළුවන්. මේ මස් ලේ සහිත ශරීරය, තෙල් පෙඟුන වැටියට (තිරයට) උපමා කරන්න පුළුවන්. පහන් තිරය දිගේ පහනෙ තියෙන තෙල් ඇදිල එනව වගේ, මේ ශරීරය උපයෝගී කරගෙන ක්‍රියාත්මක වෙන්නෙ, පෙර සසරෙදී රැස් කරගත්තු කර්ම ශක්තිවල විපාකයන්.

දැන් ''මම'' කියල කියනවා. මම කියල කෙනෙක් අනාදියේ පටන් හිටියද? මම ය කියල ස්ථිරව පවතින සත්වයෙක් ඉන්නවා කියන අවිද්‍යා සහගත දෘෂ්ටිය හේතුවෙන්, මේ මගේ ඇස, කන, නාසය, ... ආදී ඉඳුරන්ට ගෝචර වන රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ කියන ඒවා ආස්වාද විඳින්න වටිනා හරවත් දේවල්ය කියල හිතා ගන්නවා. ඒත් මට ඕනෑ හැටියට රැස්කරගෙන පවත්වගෙන ආස්වාද විඳින්න ඕන කියන අවිද්‍යා තණ්හා සහගත බලාපොරොත්තුව හේතුවෙන් ශක්තියක් ගොඩනැගෙනවා. ඒ ශක්තිය ක්‍රියාත්මක වෙලා එබඳු ආස්වාද විඳීමේ උපකරණ හැටියට ඇස, කන, නාසය, දිව, කය, මන කියන උපකරණ පොදියක් ගොඩ නගා ගැනීම සිද්ධ වෙනවා. (මේ පිළිබඳව නානාක්ෂණික කර්ම ශක්තිය යනුවෙන් හෙළ බොදු පියුම 5, 6 කලාපවල පැහැදිලි කර ඇත.)

මඩවලට තවත් නමක් තමයි කළල කියන්නෙ. මවුපියන්ගේ සංවාසයෙන් ඇතිවුණ ''කාම මඩ'', මෙබඳු කර්ම ශක්තියක් (කාම ආස්වාද විඳීමේ කැමැත්ත) නිර්මාණය කරල ඇස, කන ... ආදී ඉඳුරන් ගොඩනගා ගැනීමට සුදුසු පරිසරයක් වෙනවා. ගහක වැලක බීජයක් වුණත් තෙතමනය, හිරු එළිය, වාතය, පොහොර පස් ආදී අවශ්‍ය පරිසරය එකක්වත් අඩුනම් පැළවෙන්නෙ නෑ. ඒ වගේ කාම බලාපොරොත්තුවලින් ගොඩනැගුණ ශක්තිය ක්‍රියාත්මක වෙන්නත් සුදුසු කාම පරිසරයක් ඕන කරනවා. ඒ කාම බලාපොරොත්තුව, නැත්නම් අවිද්‍යාවත් තෘෂ්ණාවත් මූලික වුණ විකෘති දැනීම හෙවත් විඤ්ඤාණය ඒ කාම මඩේ බැස ගැනීමෙන් කළලය වැඩෙනවා. අවිද්‍යා තණ්හාව නිසා හදාගත් පටිසන්ධි චිත්තය පහන දල්වීමට ආරම්භ කරන්න දුන්න ගින්දර ටිකට උපමා කරන්න පුළුවන්. ''මම'' ආරම්භ වුණේ ඔන්න ඔහොමයි. මවු කන බොන ආහාරවලින් ඕජස උරාගෙන දැන් කළලය වැඩෙනවා.

**දැන් පෙනෙන ''මම'' මීට වසර දහයකට ඉස්සර මොන වගේද? ඊට වසර තුන හතරකට කලින් මොන වගේද? ඊටත් කලින් මොන වගේද? මේ වගේ කාලය අනුව රූපය වෙනස් වීම ගැන හිතල**



**බලන්න.** ළදරු අවධියක් තිබුණා. ළමා අවධියක් තිබුණා. ගැටවර අවධියක්, තරුණ අවධියක් ආදී වශයෙන් ''මම'' කියන්නෙ වෙනස් වෙවී ආපු නාම රූපයක්. ඔය එක එක වයසෙදි සිතිවිලිත් වෙනස් වෙනවා. නාම කිව්වෙ හිත, රූප කිව්වෙ කය. ළදරුවා ළමයා වුණේ කවදද කියල ස්ථිරව කියන්න බෑ. ළමයා ගැටවරයා වුණේ කවදද කියල ස්ථිරව කියන්න බෑ. නමුත් එහෙම වෙනස් වීමක් පේනවා.

මේ ශරීරය ගොඩනැගිල සකස්වෙලා තියෙන ඇස, කන, නාසය ... ආදී කොටස් නැවත බෙද බෙදා බලන්න. ඇහි පිහාටු, ඇහි බැම්, ඇස් බෝලය, සිවිය, ලේ නහර ... වගේ කුඩා කොටස් විශාල ගණනක එකතුවක් තමයි ඇස කියන්නෙ. දැන් එයින් එක කොටසක් තවත් කුඩා කොටස්වලට බෙදා බැලුවොත්, ඇහි පිහාටුව කියන්නෙ කුඩා කෙඳි රාශියක්. ඒ කෙඳිත් නැවත බෙද බෙදා බැලුවම අන්තිමට කිසියම් ක්‍රම රටාවකට සකස් වෙච්ච ජීව සෛල පොදියක්. එහෙම නම් මේ ''මම'' කිව්වෙ විවිධ වර්ණ ඇති, විවිධ හැඩ ඇති, තද, මෘදු ස්වභාව ඇති ජීව සෛල පොදියක් කිසියම් ක්‍රම රටාවකට අනුව සකස් වීමක්.

**ගිනි බිඳු සමූහයක එකතුවට පහන් දැල්ල කියල නමක් දුන්න වගේ, ජීව සෛල පොදියක සකස් වීමකට තමයි ''මම'' කියල නමක් දුන්නෙ.** ඒ ජීව සෛල පොදිය හැදුනෙ අතීත කර්ම ශක්තියෙන් නිර්මාණය වූ විඤ්ඤාණය, මවු කන බොන ආහාරවලින් උරා ගත් ඕජසත්, උපන්නට පස්සෙ බාහිරින් ගත් සතර මහා ධාතුන්ගෙන් සකස්වුණ ආහාර පානත් කියන මේවායින්. පහනෙ තෙල් බිඳු පහන් වැටිය දිගේ ඇවිත් ගිනිගෙන නිවී ගියා වගේ, මේ ''මම'' ක්‍රියාත්මක වෙද්දී ජීව සෛල මැරි මැරී මළ මූත්‍ර, කෙළ, සෙම්, සොටු, දහඩිය ... ආදී වශයෙන් පිටවෙවී යනවා. පහන් දැල්ල පවතින්න සුළඟ උපකාර වුණා වගේ, කන බොන ආහාර පානවලින් යළි යළිත් අළුත් ජීව සෛල නිපදවමින් කය පවතිනවා. නයා හැව ඇරිය වගේ සත්ව සිරුරේ හැඩයෙන් මේ මැරෙන ජීවිත බිඳු පිටවෙන්නෙ නැති නිසා, මොහොතක් පාසා මැරෙන බව පේන්නෙ නෑ. මේ කය නිරතුරුව සෝදා පිරිසිදු නොකළොත් මළ සිරුරක දුගඳ මේ කයෙනුත් දැනෙන්න පටන් ගන්නවා. කර්ම ශක්තිය වැය වෙවී මුලින් කිව්ව විදියට කන බොන ආහාර පාන, ජීව සෛල බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය සිදුවෙනවා. පහනෙ තෙල් හිඟ වෙනකොට පහන් දැල්ල දුර්වල වෙනවා. කය දුබල වෙනවා. වැහැරෙනවා. මේ විදියට ළදරුවා මැරි මැරී තමයි ළමයා උපදින්නෙ. නමුත් ඒ වෙනස දකින්න කාලයක් ගත වෙනවා. මේ මැරි මැරී උපදින ක්‍රියාවලිය පියවි ඇහැට පේන්නෙ නෑ. ප්‍රඥාවෙන් දැකිය යුතු දෙයක්.

පුංචි ළමයි සබන් වැඩිපුර දිය කරපු වතුරට සිහින් බටයක් දාගෙන පිඹ පිඹ බුබුළු පිට කරනවා. මේ පෙණ බුබුලු හරිම ලස්සන වර්ණවත් රටා මව මවා පාවෙවී, සුළඟ හමන දිසාවට අනුව යනවා. ටික දුරක් ගිහින් නිකම්ම බිඳිල යනවා. ඒ පෙණ බුබුලු බටෙන් ගිලිහිලා ටික වෙලාවක් හෝ වෙනත් කෙනෙකුගේ ආධාරයක් නැතිව අහසේ පාවෙවී යන ලස්සන රූපයක් මවනවා. ඉතින් ඒක තනිවම සැරිසැරුව කියල ඒකට දෙවියෙක් කියල කියනවද? ඒකෙ ලස්සන රටා මවන්නෙ ඇතුළෙ යම්කිසි කෙනෙක් ඉඳලද? නෑ. සබන් පෙණවල තියෙන ලක්ෂණයක් අනුව, වාතය ටිකක්

බටෙන් දුන්නම ''බුබුල'' කියන රූපය හැදෙනවා. අවට වාතය හමා යන නිසා පාවෙනවා. හිරු එළිය වැටුනම, සුළඟ ඇති කරන චලනය අනුව විචිත්‍ර වර්ණ රූප රටා මතු වෙනවා. ටික වෙලාවකින් පෙණ බුබුලෙ වතුර වාෂ්ප වෙවී වාතයට එකතු වෙන නිසා, බුබුලෙ ඉතිරිවන සබන් වතුර ටිකට ඇතුළෙ පීඩනයයි, පිටත වාතයේ තෙරපුමයි සමබරව තියා ගැනීමේ හැකියාව නැතිවෙලා බිඳිල යනවා.

මෙන්න මේ වගේ ''මම'' කියන රූපය ක්‍රියාත්මක වුණාට, සත්වයෙක් පුද්ගලයෙක් කියල පිළිගැනීම සුදුසු නෑ. පහනේ දැල්ල පවතින්න අවට වාතය උපකාර වුණා වගේ, මේ ශරීරයේ පැවැත්මට කන බොන ආහාර පාන උපකාර වෙනවා. දැන් එහෙනම් ''මම'' කිව්වෙ, 1. පෙර සසරෙදී ගොඩනගපු සංඛාර අතරින් ප්‍රබලව වැඩී මතුවුණ සංඛාරවල කර්ම ශක්තිය 2. කාම මඩෙන් ගොඩනගා ගත් මස් ලේ සහිත කය 3. කන බොන ආහාර පාන කියන මේ තුනේ ක්‍රියාවලියක හේතු ඵලයට. මේ කය උපයෝගී කරගෙන ක්‍රියාත්මක වෙන්නෙ පෙර සසරෙදී ඇති කර ගත් ප්‍රසන්න හෝ අප්‍රසන්න සිතිවිලි, ක්‍රියා, වදන්වල විපාක නම්, ඒවා අපි කැමති හැටියට සිද්ධ වෙන්නෙ නෑ. ධර්මතාවය විසින් පරිසරය සකස් කරල දීල තියෙන්නෙ ඒ විපාක ක්‍රියාත්මක වීමට සුදුසු විදියට. ඒක හරියට සුළඟින් බාධා නොවන තැනක, තෙල් දමා පහනක් පත්තු කරල තිව්ව වගෙයි. සුළඟ ගැළපෙන තරමට ඇති තුරු, තිරයත් තෙලුත් තියෙනව නම් පහන නොනිවී පත්තු වෙනවා.

**මේ ශරීරය හරහා පෙර කර්ම ශක්තියේ විපාක ක්‍රියාත්මක වෙන කොට, ඒවා පෙර කරන ලද කර්මයක විපාක යයි නොදන්නා නිසා, අරමුණ ප්‍රසන්න නම් යළි යළිත් කැමැත්තෙන් බැඳෙනවා. විපාක අරමුණ අප්‍රසන්න නම් ද්වේෂයෙන් ගැටෙනවා.** නොදන්නා අරමුණු ආවම ඒ මොනවද, කොහොමද කියල මුළාවෙන් හඹා යනවා. මේ විදියට යළි යළිත් සංඛාර ගොඩනගනවා. ඒ හේතුවෙන් අළුතින් ගොඩනගන සංඛාර ක්‍රියාත්මක වෙන්න, විඤ්ඤාණයක් ගොඩ නැගීමෙන් මේ කය දිරල ගියත් යළි කයක් (ඇස, කන, නාසය, දිව, කය, මන කියන උපකරණ පොදියක්) උරුම වෙනවා.

එහෙනම් පහනේ තෙල් ඉවර වුණාම පහන් දැල්ල නිවී යනව වගේ, මේ ජීවිතය ක්‍රියාත්මක වෙද්දී හමුවන අරමුණු කෙරේ කැමැත්තෙන් (ඡන්දරාගයෙන්) නොබැඳී කටයුතු කරමින්, අභි සංඛාර ගොඩ නැගීම අත්හළොත්, මේ සසර ගමන මේ අත්බවෙන් අවසන් වෙනවා. මෙහෙම කිව්වට සියලු අභි සංඛාර එකවර නිරෝධ කරන්න බෑ. සංඛාර ගොඩනගන දහම් කොටස් තුනක් තියෙනවා, හීන දහම්, මධ්‍යම දහම්, ප්‍රණීත දහම් කියල. ළාමක වූ අකුසල් තමයි හීන දහම්. ඒවා තමයි අත්හරින්න ඕන. ප්‍රණීත දහම් කියන්නෙ ආර්‍යය මාර්ගය පූර්ණය කරගන්න ඕන කරන සත් තිස් බෝධිපාක්ෂික ධර්ම. ඒවා වැඩි දියුණු කර ගන්න ඕන. මධ්‍යම දහම් කියන්නෙ එදිනෙදා ජීවිතය පවත්වාගෙන යන්න ඕන කරන ආහාර පාන ගැනීම්, පිරිසිදු කර ගැනීම් ආදී වශයෙන් නොකර බැරිකමට කරන කටයුතු. මේ කය හේතු ඵලයක්. මේ කය ගොඩනැගීමට හේතු කාරක වුණ යම් කර්ම ශක්තියක් ඇත්ද, ඒ ශක්තිය ගෙවී අවසන් වෙනතුරු කායික දුක්ඛ විඳිමින් පවත්වා ගන්න සිද්ධ වෙනවා. අළුත් කයක් අවශ්‍ය නෑ. හේතුව නැත්නම් ඵලයත් නෑ. මේ විදියට පහන උපමා කරගෙන චතුරාර්‍යය සත්‍යය අවබෝධ කර ගන්න පුළුවන්.

පහන පත්තු කරල මේ ඔක්කොම කිය කියා ඉන්න ලොකු වෙලාවක් යනව කියල කෙනෙකුට දැන් හිතෙන්න පුළුවන්. නමුත් ඒක එහෙම නෑ. මේ විස්තරය දෙතුන් වතාවක් හරි කියවල හොඳින් තේරුම් අරගෙන සත්‍යය වටහා ගත්තොත් මේ කාරණා ක්ෂණයක් තුළ මෙනෙහි කරන්න පුළුවන්. ජීවිතය කියන්නෙ හරයක් නැති, දුකක් වෙහෙසක් දෙන මායා උගුලක් බව වටහා ගන්න උත්සාහ කරන්න. මෙහි සාරාංශය පමණක් හිතට ගත්තම ප්‍රමාණවත්. පහන් දැල්ල කියන්නෙ හේතු ඵලයක්. තෙල කියන හේතුව නැත්නම්, දැල්ල කියන ඵලය විද්‍යමාන වෙන්නෙ නෑ. ඒ වගේ ජීවිතය කියන්නෙ සංඛාර ක්‍රියාත්මක වීමේ හේතු ඵලයක්. සංඛාර නැති තැන ජීවිතය කියන ඵලය විද්‍යමාන වෙන්නෙ නෑ. සියලු සංඛාර අනිච්චයි, අපි කැමති විදියට පවතින්නෙ නෑ, පවත්වන්නත් බෑ. ඒ නිසා දුක් විඳින්න සිද්ධ වෙනවා. එබඳු සසර ගමනක හරයක් නෑ. අනන්ත දිගු සසර ගමනක මේ සංඛාර නමැති හේතු නිසා විපාක නමැති ජීවිත රැහැන ''මම'' කියල හිතාගත්ත නිසා ''මම'' කියල සත්වයෙක් ඉන්නවා කියන දෘෂ්ටියෙන් විශ්වාසයෙන් මිදෙන්න පහසු නෑ. නමුත් ප්‍රඥාවෙන් සත්‍යය වටහා ගත්තොත් අතහරින්න අපහසුත් නෑ.

බොහොම වටිනවයි කියල පරපුරෙන් ලැබුණ යම්කිසි රන්වන් බන්දේසියක් හෝ එවැනි දෙයක්, පරපුරෙන් ලැබුණ නිසා කෙනෙක් බොහොම ගෞරවයෙන් ආරක්ෂා කරනවා. නමුත් යම් දවසක ඒක උරගා බලන්න අවස්ථාවක් ලැබුණොත්, උරගා බැලුවම රත්තරන් නෙවෙයි නම්, එතකොටත් ගෞරවයෙන් ආරක්ෂා කරනවද? පරිස්සම් කරන්න වෙහෙස වුණ හැටි සිහිවෙන කොට, අනේ අනිච්චං, රැවටිච්ච රැවටිල්ලක්! කියල මහ ලැජ්ජාවක් ඇතිවෙනවා. මේ කයේ හැටිත්, ජීවිතේ හැටිත් ඔන්න ඔය වගේ රත්තරන් කියල හිතාගෙන උරගාල බලන්නෙ නැතුව තියාගෙන ඉන්න ලෝක සත්ත්වයා පුරුදු වෙලා ඉන්නවා.

සත්‍යය අවබෝධ වුණා නම්, මේ චතුරාර්‍යය සත්‍යය ලොවට දේශනා කළ උතුම් බුදුපියාණන් වහන්සේලාගේ අසමසම මහා ප්‍රඥාලෝකයට ගුණ උපහාර වශයෙන්, මේ සත්‍යය දුටු මාගේ ප්‍රඥා ලෝකය උපමා කොට මේ පහන් ආලෝකය පූජා කරමි! පූජා වේවා! පූජා කරමි, පූජා වේවා!! පූජා කරමි! පූජා වේවා!!! කියල බුද්ධ ගෞරවය ඇතිව පහනකින් බුදුන් පුදන්න පුළුවන්. මේ පූජාව ඔබගේ ප්‍රඥාලෝකය නිවන දක්වා පූර්ණ කිරීමට මෙහෙයවනවා.

ඇත්තටම පහන් පුදල නිවන් දැකපු අය ඉන්නවද? ඔව්. අපදාන පාලියේ උදාන ගාථාවලින් සේලා තෙරණිය මෙවැනි ප්‍රකාශයක් කරල තියෙනවා.

''........... අව පක්ෂයේ දිනක මම බෝධිය වැඳීමට ගියෙමි. සිත පහදවා ගෙන දොහොත් මුදුන් දී සොම්නස් සිතින් මෙසේ සිතුවෙමි. ඉදින් බුදුන් වහන්සේ අප්‍රමාණ ගුණ ඇත්තේ නම්, අසමසම පුද්ගලයෙක් නම්, මට පෙළහර දක්වා, මේ බෝධිය බබළාවා .....'' මා මෙසේ සිතත්ම බෝධිය බැබළිණ. සියල්ලම රන්වන් වූ හෙයින් හැම දිසාවක්ම ආලෝකවත් විය. මම සත් දිනක් පුරා එහි සිටියෙමි. සත්වන දින මම පහන් පූජාවක් කළෙමි. අසුන වටා පහන් පහක් දැල්වීමි. පසුදින හිරු උදාවන තෙක් මාගේ පහන් දැල්විණ. ....... සමාධි භාවනය හේතු කොටගෙන මම දිවැස පිරිසිදු කළෙමි. අභිඥාවෙන් පාරමී කෙළවරට පැමිණියෙමි. පහන් පහෙහි ප්‍රතිඵලය මෙයයි. (ථේරී ගාථා අට්ඨ කතා පිටු අංක 62, 63)

මෙහි සඳහන් කළේ එක් උදාහරණයක් පමණයි. පෙළ පොත්වලින් තවත් මෙබඳු පිංකම් කළ අය පිළිබඳ බොහෝ විස්තර දැනගන්න පුළුවන්.

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**ඩබ්. ඒ. තිළිණවතී**

**(විශ්‍රාමික මහජන බැංකු නිලධාරිනී )**

**කඩවත**

# සිවුවනක් පිරිසගේ ආරක්ෂාව සඳහා අනුමත වුණු... ආටානාටිය

ආටානාටිය සූත්‍රය පිළිබඳ කතා කිරීමේදී මෙය සඳහන් වන ත්‍රිපිටක මූලාශ්‍රය කුමක් පදනම් කරගෙන ගොඩනැගී ඇත්ද, මේ සූත්‍රය කා සඳහාද, යකුන්ට බණ කියන්න මේ සූත්‍රය භාවිතා කළාද, මෙමගින් ආරක්ෂාව සැලසෙන්නේ කුමන පුද්ගලයින්ටද, අරිය මග අනුගමනය කරන අයට අමනුස්ස කරදර ඇති විට ඒවා වළක්වා ගන්නේ කෙසේද, දෙවියන්ගෙන් උදව් ඉල්ලා ආටානාටිය කීම දේව සරණ යාමක් වන්නේ නැද්ද යනාදී කාරණා පිළිබඳ සොයා බැලිය යුතුය.

සූත්‍ර පිටකයේ දීඝ නිකායේ පාථික වග්ගපාලියේ සඳහන් වන ආටානාටිය සූත්‍රයේ සිංහල පරිවර්තන අද බොහෝ කොට දකින්න තියෙනවා. මෙහිදී පළමුවෙන්ම තේරුම් ගත යුතු කාරණයක් තියෙනවා. වර්තමානයේ නොයෙක් ප්‍රබන්ධවල මේ ආටානාටිය සූත්‍රය හරහා බුදුරජාණන් වහන්සේ දෙවියන්ට, යක්ෂයින්ට බණ අහන්න ආරාධනා කළ බවක් සඳහන් වෙනවා. නමුත් එය එසේ නොවූ බව කරුණු කාරණා සහිතව වටහා ගත යුතුයි. මේ සූත්‍රයෙන් බණ අහන්න ආරාධනා කරන්නෙ නෑ. බණ අහන්න ආරාධනා කරන්න වෙනම කොටසක් තියෙනවා. බණක් කීමට ප්‍රථම සමන්තා චක්කවාලේසු අත්‍රා ගච්ඡන්තු දේවතා ....... ආදී ලෙස ගාථාවක් කියන්නෙ, බණ අහල ස්වර්ගමෝක්ෂ සම්පත්තිය ලබා ගන්න කියල. අඩගහල මෙහෙන් වාඩිවෙලා මෙන්න මේ බණ ටික අහපල්ල කියල කියන ක්‍රමවේදයක් බුදු දහමේ සූත්‍රයක නෑ. මුල් කාලයේ මේ ගාථාව බණ අහල ස්වර්ගමෝක්ෂ සම්පත්තිය ලබාගන්න කියල දෙවි දේවතාවන්ට ආරාධනා වාක්‍යයක් ලෙස පවසා තියෙනවා. අදත් බණක් කියන්න ඉස්සෙල්ල මේ ගාථාව කියල විවිධ දෙවි දේවතා කොටස්වලට ආරාධනා කරන සිරිතක් තියෙනවා.

මේ ආටානාටිය සූත්‍රය පිළිබඳ විමර්ශනය කිරීමේදී කුමක් අරබයා දේශනා කළා දැයි කෙටියෙන් විමසා බැලීම වටිනවා. සතර වරම් මහා දෙවිවරුන්ගේ දේව මණ්ඩලයක ඇතිවුණු එක්තරා සාකච්ඡාවක් මුල් කරගෙන, මේ මනුස්ස ලෝකයේ සාසනය ඇසුරු කරගෙන දිවි ගෙවන, ආර්ය මාර්ගය පූර්ණ කරගන්න උත්සාහ කරන සිවුවනක් පිරිස (භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා) ගැන සිහි කරන දෙවි දේවතාවුන්ට දකින්න ලැබුණු ගැටළුවක් තිබුණා. ඒ තමයි **නීච, දේව ධර්මයක් (පාපයට ලැජ්ජා වීම, භය වීම දේව ධර්මයක්) අහන්නෙ නැති, දේව පාලනයට යටත් වෙලා කටයුතු නොකරන අමනුස්ස කොට්ඨාශ, දෙවියන් විසින් පනවා ඇති නීති කඩකරල විවිධාකාර අන්දමින් මනුස්සයින්ට කරදර කරනවා.** මේ අතර සිවුවනක් පිරිසටත් මේ කියන අමනුස්ස කරදර බලපානවා. මේ විදියට කරදර කරන අමනුස්ස කොට්ඨාසවලින් සමහරෙක් බුදුන් වහන්සේගේ ධර්මයට කැමති නෑ. බුදුන් වහන්සේගේ ධර්මය,



කෙනෙක් ප්‍රාණ ඝාතයෙන් වළක්වනවා, සොරකමින් වළක්වනවා, වැරදි කාම සේවනයෙන් වළක්වනවා, බොරු කීමෙන් වළක්වනවා ........ මේ ආදී කාරණා නිසා මේ ඇතැම් අමනුස්ස කොට්ඨාස බුදුන්ගේ ධර්මයට විරුද්ධයි. බුදුන් වහන්සේගේ ශ්‍රාවක පිරිසට කරදර බාධා කරන මෙවැනි අමනුස්සයින් නිසා විශාල පාඩුවක් මේ ලෝකෙට සිද්ධ වෙනවා. ඒ වගේම බුදු දහම තුළින් අපටත් මහා ලාභයක් ලැබෙනවා. මොකද යහපත් ගුණධර්ම ඇති අය නිසා දෙව්ලොව පිරෙනවා. එබඳු වටිනා දෙයකට කරදර කරන එක අපටත් පිරිහීමක්. මේ බුදු දහම ලෝකයේ බබළනව නම් කොච්චර වටිනවද ? මිනිස්සු ඒ මග අනුගමනය කරනව නම් කොච්චර උතුම්ද ? මෙබඳු දහම අදහන සිවුවනක් පිරිස ආරක්ෂා කරන්න ඕන, කරදර කරන අමනුස්සයින්ගෙන් බේරගන්න ඕන කියල දෙවියන් අතර සාකච්ඡා කෙරුණා. මේ කාරණය දැකල මේ අයුරින් දෙවියන්, දේව මණ්ඩලය තුළ සාකච්ඡා කරල යම් තීන්දුවක් ඇති කරගත්තා. මේ සඳහා නියම කරුණු කාරණා විග්‍රහ කරගන්න අපට පුළුවන් වෙන්නෙ ලොව්තුරා බුදුරජාණන් වහන්සේගෙන් පමණයි කියල තීන්දු කරගෙන, උන් වහන්සේ බැහැ දකින්න මේ සතර වරම් දෙවිවරුන් පිටත් වුණා. බුදුන් වහන්සේ එක්තරා රාත්‍රියක රජගහ නුවර ගිජ්ජකූට පර්වතයේ වැඩ වසන අවස්ථාවකදී සතර වරම් මහා දෙවිවරුන් මහා යක්ස සේනාවක්, මහා කුම්භාණ්ඩ සේනාවක් සහ මහා නාග සේනාවක් සිවු දිසාවේ රැකවල් කරවා, මධ්‍යම රාත්‍රියේ මුළු ගිජ්ජකූටයටම ආලෝකය විහිදුවා බුදුන් වහන්සේ වෙත පැමිණියා. මේ දේව මණ්ඩලයේ දේව පිරිස් එනකොට ඒකත් සිද්ධ වුනේ එක්තරා පාලන ක්‍රමයකට. ජනාධිපති මැති ඇමතිවරු ආදීන් එනකොට වෙනමම ආරක්ෂක මණ්ඩලයක් සමග එනව වගේ, මේ දෙවිදේවතාවන් වහන්සේලාත් වැඩියෙ ආරක්ෂාවක් ඇතිව. මොකද ඒ දැහැමි පාලන ක්‍රමයටත් විරුද්ධ අමනුස්ස පිරිස් බොහෝ කොට හිටියා. ඒක හරියට ධාර්මිකව රටක් පාලනය කරන මැති ඇමති රජවරුන්ටත් විරුද්ධ පාක්ෂිකයො ඉන්නව වගේ. සතුරු කරදරවලින් මිදෙන්න තමයි එහෙම ආරක්ෂාව ඇතිව එන්නෙ. මේ විදියට සතර දෙසින් ආරක්ෂාව තර කරල තමයි බුදුන් වහන්සේ වෙත ඇවිත් මේ ප්‍රශ්නය සැල කළේ.

ධර්මයට කැමති අකමැති අමනුස්සයින් සිටින බවත්, ඒ අතර බලවත් සහ නීච අමනුස්සයෝද සිටින බවත් බුදුන් වහන්සේට සැල කළා. සමාජය ආරක්ෂා කර ගැනීමේ අරමුණින් කොසොල් රජතුමා වැරදි වැඩ කරන මිනිස්සුන්ට දඬුවම් ලබා දෙනව වගේ, මේ අමනුස්ස ලෝකවල පාලනයත් දෙවියන් සතුව පවතින නිසා එසේ දඬුවම් හෝ අවවාද කර අමනුස්සයන් මෙල්ල කළ හැකි බවත්, නමුත් කොසොල් රජතුමාගේ රාජ්‍යයේ සිටින හොර දෙටුවෝ වගේ පිරිසක් මේ අමනුස්ස ලෝකයේ සිට සිවුවනක් පිරිසට විවිධාකාරයෙන් කරදර බාධා කරන බවත් සතරවරම් දෙවියන් බුදුන් වහන්සේට සැල කළා. ඔබ වහන්සේගේ ධර්මයට බොහෝ කොට ගරු කරන, ධර්මයේ ☞

වටිනාකම දන්නා අපට එවැනි අමනුස්සයෝ මේ සිවු පිරිසට කරන කරදර බාධා බලාගෙන සිටීම කළ නොහැකි බවත්, මේ සඳහා යස්ස සේනාධිපතිවරු 18 දෙනෙක් (යස්ස සේනාවන්ට අධිපති වන, චාතුර්මහාරාජිකය තුළ වැඩ වසන දේව කොට්ඨාශයක්) නිල වශයෙන් පත් කර ඇති බවත් සැල කළා. අමනුස්සයින්ගෙන් සිවුවනක් පිරිසට කරදර බාධා ඇති වන අවස්ථාවන්වලදී මේ ආටානාටිය සජ්ජායනා කරන ලෙස දන්වන ලෙසත්, එවිට ඔවුන්ට හිංගි හිංසා කරන අමනුස්ස කොට්ඨාස අප විසින් රැගෙන ගොස් අවවාද කර, දඬුවම් කර, හික්මවල ඔබ වහන්සේගේ අරිය මාර්ගය පූර්ණ කරගන්නා වූ ඒ සිවුවනක් පිරිසට ඒ කටයුත්ත නිදහසේ කරගන්න අවස්ථාව ලබා දෙන බවත් සතර වරම් දෙවිවරු බුදුන් වහන්සේට සැල කළා. ගෞතම බුද්ධ ශාසනයට මෙවැනි යහපතක් ඉටු කිරීමට අවස්ථාවක් ලබා දෙන ලෙස කරපු ඉල්ලීමක් තමයි සතර වරම් දෙවිවරු කළේ. බුදුන් වහන්සේ ඒ සඳහා අවසර ලබා දුන්නා. පසුවදා තම භික්ෂූන් වහන්සේලාට මේ සිද්ධිය ප්‍රකාශ කරල, ''උග්ගන්හාථ භික්ඛවේ ආටානාටියං රක්ඛං - පරියාපුණාථ භික්ඛවේ ආටානාටියං රක්ඛං'' යනාදී වශයෙන් දේශනා කරල මේ ආටානාටිය ආරක්ෂාව ඉගෙන ගන්නා ලෙසත්, නිතර සජ්ජායනා කරනා ලෙසත්, යම් අමනුස්ස කරදරයක් පැමිණි විට එමගින් මිදීමට මෙය උපකාරී වන බවත්, ඒ දේව මණ්ඩලයට අයත් පිරිස ඒ කර්තව්‍යය ඉටු කර දෙන බවත් භික්ෂූන් වහන්සේලාට දේශනා කළා. මේ තමයි ආටානාටිය සූත්‍රය ඇති වෙන්න තුඩු දුන් කතා සාරාංශය.

ඉතින් යක්කුන්ට බණ අහන්න අඬ ගහන්න මේ ආටානාටිය දේශනා කළේ නැති බවත්, යන්ත්‍ර මන්ත්‍රවල තියෙන යක්ෂ ප්‍රේත කොටස්වලට කරන ආකාරයේ අඬගැහිල්ලක් මේ බුද්ධ දේශිත සූත්‍රවල නැති බවත් තේරුම් ගත යුතුයි.

සමන්තා චක්කවාලේසු කියන ගාථාවෙත් සඳහන් වෙන ''අත්‍රා ගච්ඡන්තු දේවතා'' කියන කොටසින් කියවෙ-න්නෙත්, ඒ දේවතා කොට්ඨාසවලට කළ ආරාධනාවක් මිසක් නීච, දුෂ්ඨ අමනුස්සයින්ට කළ ආරාධනාවක් නෙවෙයි. නමුත් ඒ අමනුස්ස කොටස්වලටත් ඉන්න තැනක ඉඳල ඒ බණ අහන්න අවශ්‍ය පහසුකම සලසා දීම උතුම් ගුණයක්. හැබැයි අඬ ගහල ගෙන්න ගන්නෙ නෑ. ඉතින් මේ ආටානාටිය සූත්‍රය බොහොම හොඳ සූත්‍රයක්. මේක භාවිතයෙන් අමනුස්ස කරදරවලින් ආරක්ෂා විය හැකි බව දේශනා කළ බුදුන් වහන්සේ, සිවුවනක් පිරිසට මෙය අනුමත කළා. මේ ආටානාටිය සූත්‍රය කියල අන්තිමට දෙවියන්ටත් පුණ්‍යානු මෝදනාවක් කරන කොට ඒ සඳහා ඒ දෙවි දේවතාවෝ නිකම් බැල්මක් දැම්මත් ආටානාටිය කියන වෙලාවේ ඒ පිනත් අනුමෝදන් වෙලා සාදු කාර දීල යන්න යනවා. කරන්න පුළුවන් උදව්වක් තියෙනව නම් ඒකත් කරල දෙනවා. එහෙනම් **මේ ආටානාටිය සූත්‍රය තුළින් පිළිබිඹු වෙන්නෙ, බෞද්ධයින් අමනුස්සයින්ගෙන් ආරක්ෂා වෙන ක්‍රමවේදයක්.** බුදු දහම තේරුම් අරගෙන ඒ අනුව සත්‍යානුකූලව කටයුතු කරල යහපත් ආර්ය මාර්ගයට එන අයට මේ තුළින් පිහිටක් ආරක්ෂාවක් ලැබෙනවා.

මනුස්ස ලෝකය ආරක්ෂා කරන දෙවි දේවතාවන් මොහොතක් මොහොතක් පාසා බලාගෙන ඉන්නෙ, තමන්ට ඒ දේව මණ්ඩලයෙන් පැවරුණු රාජකාරිය ඉෂ්ට කරන්න. ලැබිච්ච රාජකාරියත් සමඟ ඔවුන් බුදු දහම කෙරෙහි බොහොම පැහැදීමක් ඇති නිසා තමයි ඒ විදියට ආරක්ෂා කරන්න බැඳිල ඉන්නෙ. ඒ වගේම බුද්ධ දේශිත සූත්‍රයකින් කිසිම අයෙකුට කිසිම අයුරකින් අවැඩක් අසාධාරණයක් නොවන බවත් තේරුම් ගන්න ඕන.

සක්‍ර දෙවියන්ගේ දේව සභාව හෙවත් සුදම් සභාවේ එක්තරා ක්‍රමවේදයක් තියෙනවා. එහි දේව පුත්‍රයෝ පසළොස්වක පෝය දවසට දිසා හතරට වෙන් වෙන්ව දෙමවුපියන්ට සලකන, අඹුදරුවන් දැහැමින් පෝෂණය කරන, යහපත් සේ කටයුතු කරන අවිහිංසාවාදී දැහැමි මනුස්සයින් ඉන්නවද කියල හොයල බලන්න යනවා. ඒ විදියට මාසෙ පෝය දවසට එන්නෙ දේව ඇමතිවරු. අනෙක් දේව පිරිස් පුර අටවක, අව අටවක කියන පෝය දිනවල එනවා. මේ ආකාරයට ඇවිත් උතුම් ගුණ ධර්ම ඇති පිරිස් පිළිබඳ තොරතුරු හොයල බලල ඊළඟ දේව මණ්ඩලය රැස් වෙන කොට, අහවල් ප්‍රදේශයේ මෙන්න මේ මේ පුද්ගලයො කියල, එවැනි යහපත් ගති පැවතුම් ඇති අය ගැන විස්තර අර දේව මණ්ඩලයට ඉදිරිපත් කරනවා. ඒ හරහා ඒ කතාව අහල දේව මණ්ඩලය එවැනි පිංවත් පිරිස් ආරක්ෂා කරන්න කියල නිගමනය කරල අණ කරනවා. මනුස්ස ලෝකයේ ආයුස බොහොම කෙටි නිසාත්, මේ වගේ උතුම් ගති පැවතුම් ඇති අය කවදා හරි මිය ගිය දාක බොහෝ විට උපදින්නෙ මේ දිව්‍ය ලෝකවල බව දන්න නිසාත් තමයි එවැනි ගති ගුණ ඇති අයව ආරක්ෂා කරන්න නියම කරන්නෙ. මේ සඳහා එක්තරා ලෝක පාලක දේව පිරිසක් වෙනම පත් කරල ඉන්නවා. මේක ධර්මයේ සඳහන් වෙන කතාවක්.

මේ වගේ බෞද්ධ ගුණ ධර්ම ඇති අයට දෙවියන්ගේ රැකවරණය ලැබෙනවා. දේවතා රක්ඛන්ති කිව්වෙ ඒකයි. ඒ වගේම තමයි යම් අයෙක් ආර්ය ධර්මය පූර්ණය කරල පැවිදි වෙන්න සැලසුම් කරල තියෙනව නම්, ඒ වගේ අදහසක් ගන්න කොටම මාරයා සමග සටනට බෞද්ධයෙක් සූදානම් වෙනව කියල දෙවි දේවතාවුන් ප්‍රීති නාදයක්, ඔල්වරසන් නාදයක් දෙනවා. පැවිදි තත්ත්වයට පත් වෙන කොට මාරයා සමග සටනට ගියා කියල සන්තෝස වෙලා නැවතත් ඔල්වරසන් දෙනවා. හෙතෙම ප්‍රතිපත්ති පුරල යම් දිනක අරිහත්වයට පත් වුණාම මාරයා සමග සටන් කරල ආර්ය උත්තමයෙක් ජය ගත්තා කියල තුන්වන ඔල්වරසන් දීම අකනිටා බඹ ලොවට යනකල් ඇහෙනවා. මේ විදියට **දෙවියන් අතරින් බෞද්ධයින් මුල් කරගෙන ඔල්වරසන් නාද 3 ක් එන බව** බුදුරජාණන් වහන්සේ පෙන්වා දීල තියෙනවා. මේ ආකාරයට දෙවි දේවතාවෝ බෞද්ධයන් කෙරෙහි බලනවා. නමුත් මනුස්ස චරිත අශුද්ධ නම් ඒ බැල්ම ඈත් වෙනවා. මනුස්සයින් මාන්නක්කාර නම්, අසත් පුරුෂ නම් මේ දෙවි දේවතාවුන්ගෙන් ලැබෙන ආරක්ෂාව ඈත් වෙනවා. යහපත් ගුණ ධර්ම ඇතිව, දස අකුසලයෙන් වෙන් වෙලා, පිරිසිදු සිතකින් යුතුව, මෙත්තා සහගත සිතක් වඩමින්, දානාදී පුණ්‍ය කර්ම සිදු කරමින්, පවුල්වල සමගියෙන් සමාදානයෙන් ඉඳල පැවිදි උතුමන්ට දෙමාපිය ගුරුවරු වැඩිහිටි ආදීන්ට සත්කාර කරමින්, අඹුදරුවන් පෝෂණය කරමින් ඉන්නව නම් මේ දෙවි දේවතාවුන්ගේ ආරක්ෂාව ලැබෙනවා. ගුණ ධර්ම අතින් අඩු පාඩු ඇති අය බොහෝ කොට හිටියත් අඩු පාඩු හදාගෙන ගුණ ධර්ම පුහුණු කර ගන්න ඒ අයට බැරි කමක් නෑ.

දෙවියන් කියන්නේ රාග, ද්වේශ, මෝහ තුරන් කරපු අය නොවුනත් පුණ්‍ය සෘද්ධියක් ඇති, දැහැමි පාලනයක් කරන පිරිසක්. මේ නිසා ධර්මයේ සරණ යන ශ්‍රාවකයින් අමනුස්සයින්ගෙන් ආරක්ෂා කිරීම දෙවියන්ගේ යුතුකමක් නිසා, ඒ කාරණය ඉටු කිරීමට බුදුන් වහන්සේගෙන් කළ ඉල්ලීමක් අනුව විශේෂයක් කරල, අවශ්‍යතාවය අනුව සජ්ජායනා කරන්න කියල ආටානාටිය සූත්‍රය ලබා දුන්නා.

අරිය මග පුහුණු කරන පුද්ගලයින්ටත් මේ වගේ අමනුස්ස කරදර බාධක එනව නම් පෘතග්ජන අය ගැන කවර කතාද ? යම් කෙනෙක් අරිය මග පූර්ණය කරමින් කොච්චර සැදැහැවත් වුණත්, ගුණ ධර්ම වැඩුවත්, දස අකුසල් ඉවත හැලුවත් අසත් පුරුෂයන් කරන නීචකම් අත්හරින්නෙ නෑ. ඒක නීචකමේ ස්වභාවය. සැරියුත් මහ රහතන් වහන්සේ නිරෝධ සමාපත්තියට සමවැදිල ඉන්න අවස්ථාවකදී නන්ද කියන යක්ෂයා ඇවිත් ටොක්කක් ඇන්න කතාවක් ධර්මයේ සඳහන් වෙනවා. ඒ ටොක්කෙ තරම කොච්චරද කියල හිතා ගන්නවත් බෑ. ඒ තරම් දරුණු විදියට තමයි ඒ ටොක්ක ඇනල තියෙන්නෙ. සාමාන්‍ය කෙනෙකුට ඇන්න නම් ජීවිතයත් විනාශ වෙනවා. නමුත් සැරියුත් මහ රහතන් වහන්සේ නිරෝධ සමාපත්තියට සමවැදිල හිටපු නිසා ඒ වේදනාව දැනිල නෑ. ශරීරයට

හානියක් වුණේ නෑ. මේ නන්ද කියන යක්ෂයා එසැනින් ඒ අත්භවයෙන් චුත වෙලා ගිහින් අට මහා නරකයක උපන් බවත් ධර්මයේ සඳහන් වෙනවා. මේ වගේ **අමනුස්සයින් අතරත් ධර්මයට ලැදි සහ ධර්මය නුරුස්සන අමනුස්සයින් ඉන්නවා.** නීචකමේ ස්වභාවයයි, ධර්මය කෙරෙහි පැහැදුණු අයගේ ස්වභාවයයි පැහැදිලි කරන්න අවශ්‍ය නෑ. මොකද සමාජයේ ජීවත් වෙන කොට අපිට ඔය කියන දෙපිරිසටම අයත් මනුස්සයින් දකින්න ඇසුරු කරන්න ලැබෙනවා.

දැන් කෙනෙකුට ප්‍රශ්නයක් මතු වෙන්න පුළුවන්, බුදු රජාණන් වහන්සේ දැහැනට සම වැදිල ඉන්න කොට අමනුස්ස කරදර ඇති වුණේ නැද්ද කියල. නැත්තෙ නෑ. ලොව්තුරා බුදු රජාණන් වහන්සේටත් නීච නිග්‍රහ කරපු අමනුස්සයෝ හිටියා. ලොව්තුරා බුදු වුණත් ඒවා එනවා. නමුත් උන් වහන්සේගේ බුද්ධ බලය නිසා කාගෙන්වත් පිළිසරණක් අවශ්‍ය නෑ. උපමාවකින් කියනව නම් කොස් ඇටයක් හිටවපු මුල් අවධියේ ඒ ඇටය නොයෙක් සතුන්ගෙන් විනාශයට ලක් වෙන්න පුළුවන්. සමහර විට කුරුල්ලන්ගෙන් ගොළුබෙල්ලන්ගෙන්, පණුවන්ගෙන් ආදී සතුන්ගෙන් හානි වෙන්න පුළුවන්. නමුත් පැළය හට ගත්තට පස්සෙ පැළය වටේට පොල් ලෙලි හෝ යම් දෙයකින් ආරක්ෂක වළල්ලක් බැඳල ආරක්ෂා කරගෙන සාත්තු කළාම ලොකු ගහක් බවට පත් වෙනවා. ඊට පස්සෙ කලින් වගේ ගොළුබෙලි ආක්‍රමණ, කුරුළු ආක්‍රමණවලින් තියා අලියෙකුටවත් පෙරලන්න බැරි තත්ත්වයට පත් වෙනවා. පැලේ කාලෙ ගොළුබෙල්ලෙකුට පවා විනාශ කරන්න පුළුවන්කම තිබුණත් මහ ගහක් බවට පත් වුණාට පස්සෙ එහෙම විනාශ කරන්න බෑ. මේ ආකාරයටම අරිය මග අනුගමනය කරන ළදරු අවස්ථාවේ කාම, රාග, ව්‍යාපාද දුරු කරල නැති නිසා, ඇලීමෙන් සහ ගැටීමෙන් සම්පූර්ණයෙන් ඉවත් වෙලා නැති නිසා ඇලීමට ගැටීමට හිත කම්පා වෙනවා. කාම, රාග, ව්‍යාපාද සම්පූර්ණයෙන් දුරු වෙන්නෙ අනාගාමී ඵලයේදී නිසා ඊට පහළ සිටින එනම්, සෝවාන් මාර්ග අනුගාමිකයෙක්, සෝවාන් මාර්ග ඵල ලාභියෙක්, සකෘදාගාමි මාර්ග අනුගාමිකයෙක් සකෘදාගාමී මාර්ග ඵල ලාභියෙක්, අනාගාමී මාර්ග අනුගාමිකයෙක් කියන අරිය මග තුළ සිටින අයෙක් වුණත් කාමරාග, ව්‍යාපාදයට හිත කම්පා වෙනවා. ඉතින් ඒ කාම-රාග ව්‍යාපාදයට හිත යොමු කරවන එක විතරයි අමනුස්සයින්ට කරන්න තියෙන්නෙ. කාම-රාග ව්‍යාපාද ඉක්මවූ පසු මාර පාක්ෂික අමනුස්සයින්ට ඔවුන්ගේ විෂය එතැන නොපවතින නිසා අනාගාමී, අරිහත්, පසේ බුදු සහ ලොව්තුරා බුදු යන උත්තමයන් වහන්සේලාව කම්පා කරවන්න ක්‍රමයක් නැති වෙනවා.

නමුත් කල්‍යාණ පෘතජ්ජනයාගේ පටන් සෝවාන්, සකෘදාගාමී, අනාගාමී යන ඵලවලට පත් වෙන කාලය අතරතුර එක් එක් අයගේ කර්ම ශක්තිය අනුව මාර පාක්ෂිකයන්ගෙන් පහර වදින්න පුළුවන්. හිතට පවා අරක් ගන්න හැකියාව තියෙනවා. ඊට හොඳම උදාහරණය සෝවාන් ඵලයේ හිටපු ආනන්ද හාමුදුරුවන්. බුදු රජාණන් වහන්සේ කල්පයක් වැඩ සිටින සේක්වා කියල ආනන්ද හාමුදුරුවන් ආරාධනා කළා නම්, පිරිණිවන් පෑමට නොදී තවත් ආයු කල්පයක් බුදු රජාණන් වහන්සේට වැඩ ඉන්න තිබුණු බව ධර්මයේ සඳහන් වෙනවා. නමුත් එසේ බුදුන් වහන්සේට ආරාධනා කිරීමට නොහැකි වෙන විදියට මාරයා ආනන්ද හාමුදුරුවන්ගේ මනස වහගෙන හිටපු බවත් ධර්මයේ සඳහන් වෙනවා. ඒ කියන්නෙ මාර දිව්‍ය පුත්‍රයාට සෝවාන් වෙච්ච පුද්ගලයාගේ මනස ආක්‍රමණය කරන්නත් හැකියාව තියෙනවා. ආනන්ද හාමුදුරුවන් බුදු රජාණන් වහන්සේ ඉදිරිපිට බණ අහමින් සිටින කොටත් එහෙම සිද්ධ වුණා නම් අනිත් අය ගැන කවර කතාද? (දීඝ නිකාය - මහා පරිනිබ්බාන සූත්‍රය)

එහෙනම් කාම රාග ව්‍යාපාදය තුළ ඉන්න පුද්ගලයාට ඒ තුළ ඉන්න තාක් කල් ඒකෙන් පහර ගහන්න හැකියාව තියෙනවා. නමුත් අනාගාමී ඵලයෙන් එහාට ගිය උත්තමයෙකුට ඒ විදියට මානසිකව පහර ගහන්න හැකියාවක් ලැබෙන්නෙ නෑ. මනසට රිංග ගන්න පුළුවන්කමක් නෑ. මනසට රිංග ගත්තොත් තමයි කරදර බාධක කරන්න අවස්ථාව ලැබෙන්නෙ. මේ වගේ වෙලාවට ආරක්ෂාවක් තියෙන්න ඕන. ඒ සඳහා මේ ලෝකෙ පුණ්‍ය සෘද්ධි ලබපු බුද්ධ පාක්ෂික දෙවි දේවතාවන් කොටසක් ඉන්නවා. ඒ ඉන්නෙ සතර වරම් දෙවියන් විසින් පත් කරපු යස්ස සේනාධිපතිවරුන් 18 දෙනා යටතේ කටයුතු කරන දේවතාවෝ. අනාගාමී ඵලයෙන් ඉහළට මාර්ග ඵල වැඩුණු උත්තමයන් වහන්සේලාට මේ අමනුස්සයන්ගෙන් කායික කරදර කරන්න පුළුවන් වුණත් මානසිකව කරදර කරන්න බෑ. එවැනි උත්තමයන්ට අමනුස්සයින්ගේ කරදරවලින් බේරෙන්න උදව් උපකාර අවශ්‍ය නොවුණත්, අනාගාමී ඵලයට එන තෙක් මග ඵල නොවැඩුණු උත්තමයන්ට මේ කරදරවලින් බේරෙන්න උදව් උපකාර අවශ්‍ය වෙනවා. ඒ නිසා බුදු රජාණන් වහන්සේ ශ්‍රාවකයන්ට මේ ආටානාටිය සූත්‍රය අවශ්‍ය වෙලාවට සජ්ජායනා කරන්න කියල අනුමත කළා.

දෙවියන්ගෙන් මේ විදියට ආධාර උපකාර ගැනීම දේව සරණ යාමක් නෙවෙයිද කියල දැන් කෙනෙකුට හිතෙන්න පුළුවන්. බුදු රජාණන් වහන්සේ කොතැනකවත් දෙවි දේවතාවන්ගෙ ආධාර උපකාර ලබා ගන්න එපා කියල දේශනා කරල නෑ. දෙවියන්ගෙන් ආධාර උපකාර ලබාගැනීම සරණ යාමක් වෙන්නෙ නෑ. සරලවම කියනව නම් කෙනෙකුගෙන් ආධාරයක් උපකාරයක් ලබාගැනීම සරණ යෑමක් නෙවෙයි. එහෙම හිතුවොත් අන්‍යාගමික වෛද්‍යවරයෙකු-ගෙන් ලෙඩකට බෙහෙතක් හේතක්වත් ගන්න බෑ. නමුත් කරපු උපකාරයට ප්‍රතිඋපකාර කිරීම යුතුකමක් බවත් සිහිතබා ගන්න ඕන. දෙවියන්ට පූජා වට්ටියක් තියල පුද පූජාවක් කළොත් මිථ්‍යා දෘෂ්ටිකයෙක් වෙනව කියල සමහර අය මේ කාරණය වැරදියට අර්ථ දක්වනවා. නමුත් **යමෙක් තමා උපයා ගත් දෙයින් කිසියම් දෙවි දේවතාවෙකුට ගරු සරු ඇතිව පුද පූජා කර ඇප උපස්ථානයක් කරනව නම් එයින් සතුටු වන ඒ දෙවි දේවතාවන් තමන්ව අත දරුවෙකු වගේ ආරක්ෂා කරන බවත්, දෙවි දේවතාවන්ගේ ආශිර්වාදය ලබන ඔහුට අභිවෘද්ධියක් මිස පිරිහීමක් නෑ** කියලත් බුදුන් වහන්සේ දේශනා කරල තියෙනවා. මේ නිසා දෙවි දේවතාවන්ට පුද පූජා තියන්න එපා කියල බුදුන් වහන්සේ කිසිම අවස්ථාවක දේශනා කරල නෑ. ඒ වගේම එදා වජ්ජී රාජ්‍යයේ පාලකයන් වෙලා හිටපු ලිච්ඡවී රජ දරුවන් අනුගමනය කරපු සප්ත අපරිහානි ධර්මවලින් හයවෙනි ධර්ම කාරණාව තමයි, මෙතෙක් කාලයක් පුද පූජා අනුග්‍රහයන් කළ දෙවි දේවතාවන්ට, පූජනීය ස්ථානවලට ඒ පිළිවෙත් නොපිරිහෙලා ඉටු කිරීම. මේ විදියට බුදුන් වහන්සේ සප්ත අපරිහානි ධර්ම අනුමත කරනව වගේම සංඝයා වහන්සේලාටත් අනුදන්න වදාරණවා. (වැඩි විස්තර මෙහි පලවන ''එදා සිටි පැරැන්නන් දේව රැකවරණය ලැබූ හැටි'' ලිපියෙන් ඉදිරිපත් කර ඇත.)

නමුත් නිවන සඳහා කිසිම කෙනෙක් පිළිසරණ කරගෙන බෑ. ඒකට ධර්මයේ පිළිසරණ වගේම, තම හිසට තමාමය සෙවණැල්ල කියල තමන්ටම තමයි ඒ පිළිවෙත් පුරාගෙන අරිය මඟ පූර්ණය කරගන්න වෙන්නෙ. ලෞකික පුණ්‍ය සෘද්ධි තියෙන දෙවි දේවතාවුන්ට ලෞකිකව උදව් උපකාර කරන්න පුළුවන් හැකියාවක් තියෙන නිසා ඔවුන් හැකි පමණින් ඒක ඉටු කරල දෙනවා. නමුත් එසේ උදව් උපකාර ගැනීම මිත්‍යා දෘෂ්ටික මාර්ගයක් කියල බුදුන් වහන්සේ දේශනා කළේ නෑ. ඒ නිසා මේ කරුණු කාරණා මේ විදියට පැහැදිලි කරන කොට ආටානාටිය පිළිබඳව යම් වැරදි අවබෝධයක් තිබුණ නම් ඒක පහව යන්න ඕන. ඒ වගේම ආටානාටිය කුමක් සඳහා භාවිතා කළ යුතුද යන්නත් වැටහෙන්න ඕන.


*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**ප්‍රසාද් ද සිල්වා**
**පරිපාලන නිලධාරී**
**ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය**

# රූපයට කරන කටු ගැසීම්, කටහඬ අල්ලා කරන ඇණ ගැසීම් ආදියෙන්

# ලෙඩ රෝග කරදර ඇති වන හැටි

*(පසුගිය කලාපයෙන් - නූල් පැන්නුම්, වැල් පැන්නුම්, ඉරි පැන්නුම් ආදියෙන් ලෙඩ රෝග කරදර ඇති වන හැටි....)*



මනුස්සයින්ට ලෙඩ රෝග කරදර හදන තවත් නොපෙනෙන පැත්තක් තමයි මේ හෙළිදරව් කරන්නෙ. යම්කිසි ශක්තියක්, හැකියාවක් තියෙන කෙනෙකුගෙ ඒ ශක්තිය, හැකියාව විනාශ කර දැමීමේ ඊරිසියා සහගත චේතනාවෙන් හෝ තමන්ගෙ විරුද්ධවාදියෙක්ගෙන් පළිගැනීමේ අරමුණින් හෝ ඒ පුද්ගලයගෙ රූපය ඇඳල කපල එහි නිල ස්ථානවලට කටු ගැසීමෙන් ඒ පුද්ගලයව අඩපණ කිරීමේ නීච වැඩ අනාදිමත් කාලයක පටන් පැවතෙනවා.

මෙතනදී අදාල පුද්ගලයගෙ රූපය අඳින්න පාවිච්චි කරන්නෙ බොහෝවිට හොඬල අලයක්. මේ හොඬල අලය කපන්නත් එක්තරා ගැඹුරු ශාස්ත්‍ර ක්‍රමයක් තියෙනවා. ඒ හොඬල අලයේ පුද්ගලයගේ සම්පූර්ණ රූපය ඇඳල ඒකෙ හරහට ඔහුගෙ නම සටහන් කරනවා. මෙහිදී ඒ පුද්ගලයා පිළිබඳ මනෝ සංඥාවක් නිර්මාණය වෙනවා. ඒ පුද්ගලයාගේ සිත ඒ සංඥාවට හිටිනවා. ඒ සංඥාව පුද්ගලයාගේ රූපය සමග සම්බන්ධ වෙනවා. ඊට පස්සෙ පස්ලෝ වගේ මොනව හරි ඒකට අවශ්‍ය කරන කටු වර්ගයක් අරගෙන යක්ෂ දිෂ්ටි ක්‍රියාත්මක වන දේවාලයක්, ගුබ්බෑයමක්, තුංමංහන්දියක් හෝ සොහොන් පිට්ටනියක් වගේ ඒකට ගැළපෙන තැනක ඉඳගෙන යම්කිසි මන්තර මතුරමින් හොඬල අලෙන් කපා ගත් අර රූපයේ නිල ස්ථානවලට කටු ගහනවා. එහෙම කටු ගහන කොට අදාල පුද්ගලයා කොච්චර ඈතකින් නොපෙනී හිටියත් ඒ රූපයට රූපය කිරණ ශක්තියකින් සම්බන්ධ වෙනවා. මොකද චිත්ත කිරණවලට දුර බලපාන්නෙ නෑ. මේවා සාප කිරණ. පූට්ටු ..... හිර හිර පූට්ටු .... ආදී කියමින් පුද්ගලයා හිර කරනවා. අර හදපු රූපයට කිරණ රූපයක් මන්තර බලයෙන් නිපදවෙනවා. එතකොට පුද්ගලයාගෙත් අදාල නිල ස්ථාන, කිරණ ශක්තියෙන් හිර වෙන්න පටන් ගන්නවා. ඒක ඉස්සෙල්ලම වදින්නෙ මනෝමය කයට. ඊට පස්සෙ මනෝමය කයේ ආකෘතිය වන මස් ලේ කයටත් කාලයක් යනකොට බලපානවා. කටු ගහපු තැන ඉඳන් ආරම්භ වෙලා කල් යන කොට ඒක ක්‍රියාත්මක වෙලා, පුද්ගලයාගේ කර්ම ශක්තියත් සම්බන්ධ වෙලා, කටු ගහපු තැන්වලට අදාල ශාරීරික ස්ථානවලින් නොයෙක් අසනීප ඇති කරනවා. මේ ආරම්භ කරපු ශක්තිය, යම් කිසි තවත් ශක්තියකින් නොකැපුවොත් ඒක ගෙවෙන කල්ම ක්‍රියාත්මක වෙනවා. මේ ක්‍රමය සිද්ධ වෙන්නෙ අනන්තර සමනන්තර ප්‍රත්‍ය සිද්ධාන්තය අනුව.

සමහර අවස්ථාවලදී මේ විදියට ඇඳල කපන්නෙ අදාල මනුස්සයගෙ රූපය විතරක් නෙවෙයි, යක්ෂ රූපයකුත් ඇඳල මනුස්සය යක්ෂයෙකුට කැප කරනවා. මනුස්ස රූපය වෙනුවට යක්ෂ රූපයත් අර විදියටම ඇඳල පාට කරනවා. ඇස්, දිව ආදිය රතු කරල තනිකරම යකා අඳිනවා. ඒකත් එක්තරා කලාවක්. බලි අඳිනව කියල මේ ගැන දන්න කෙනා හරියට අඳිනවා. ඒක ආවට ගියාට කරන්න බෑ. පාරම්පරිකයි. ඒවට යොදාගන්න වෙනම විශේෂ පාට වර්ග තියෙනවා. ඒව කරන අය ළඟ පාරම්පරිකව එන ඔය ආම්පන්න ඔක්කොම තියෙනවා. මෙතනදී මනුස්ස රූපය වෙනුවට යක්ෂ රූපයට කටු ගහනවා. නමුත් අන්තිමට ලෙඩ වෙන්නෙ අර කැප කරපු මනුස්සයා.

මෙතනදී සිද්ධ වෙන ක්‍රියාවලියත් යම් පමණකට දැන ගැනීම වැදගත්. ඕනෑම පුද්ගලයෙකුගේ සමානත්වයකට තවත් ඒ හා සමානත්වයක් එකතු වෙනවා. මේ විදියට ගතියට ගතිය සමානයි, ද්‍රව්‍යයට ද්‍රව්‍යය සමානයි, සංඥාවට සංඥාව සමානයි. කර්ම විපාකයන්ට අනුකූලව ඉහත කී කර්මයටත් සම්බන්ධයක් තියෙනවා. එනම් අනුකූල විපාකයට

කර්මය සම්බන්ධයි. මේ විදියෙ ක්‍රමයක් මේ විශ්වයේ හැම තැනම ක්‍රියාත්මක වෙනවා. අපට යම් කිසි සංඥාවක් ආවොත් විවිධ ක්‍රමවලින් ඒ සංඥාව ලබාගන්න පුළුවන්. එක්කො ඒ පුද්ගලයගෙ නමින් ගන්නවා. නමයි ගමයි ගත්තමත් සංඥා ක්‍රමය සම්බන්ධ කරන්න පුළුවන්. එහෙම නැත්නම් ඡායාරූපයක් අරගෙන ඒක දකින කොටත් සංඥාව සම්බන්ධ වෙනවා. ඒ විදියට කෙනෙකුගේ හඬටත් සංඥාව අල්ලන්න පුළුවන්. එහෙම නැත්නම් ජාන සම්බන්ධය එක්ක තියෙන හිස කෙස්, ලේ වගේ ද්‍රව්‍යයක් ගන්නවා.

සමහර විට කෙනෙක් පාවිච්චි කරපු භාණ්ඩයක්, අත ගහපු දෙයක් ගන්නත් පුළුවන්. ඒ වගේම පයට පෑගිච්ච වැලි ටිකක් ගන්නත් පුළුවන්. මේ හැම එකකම අදාල පුද්ගලයාගේ සංඥාව තියෙනවා. මෙතනදී අමනුස්ස සම්බන්ධයක් නෙවෙයි ක්‍රියාත්මක වෙන්නෙ. මන්තරවල ශක්ති, කිරණ මගින් පුද්ගලයාට සම්බන්ධ වෙනවා. මේ කාරණය ඔප්පු කරන්න දැන් තියෙන සන්නිවේදන තාක්ෂණය පෙන්වන්න පුළුවන්.

උදාහරණ විදිහට යම් කිසි කෙනෙක් ජංගම දුරකථනයකින් තවත් කෙනෙක් අමතන විට ඒ අදාල පුද්ගලයා සංඥා ක්‍රියාත්මක වන කුමන ස්ථානයක හිටියත් ඒ දුරකථන ඇමතුම ඒ පුද්ගලයාගේ ජංගම දුරකථනයට සම්බන්ධ වෙන බව කවුරුත් දන්නා කාරණයක්. මේ සම්බන්ධතාවය ගොඩනැගෙන්නේ විශ්වයේ ඇති ආකාස ධාතුව හෙවත් විද්‍යාවෙන් පැහැදිලි කරන ඊතර් ධාතුව කියන මුළු විශ්වයම පිරී පවතින සංතෘප්ත මාධ්‍යය හරහා. මෙතනදී අදාල පුද්ගලයා කතා කරන සියලු දේවල් ප්‍රතිග්‍රාහකයාට තරංග අනුසාරයෙන් ඇහෙන්න සැලැස්වෙනවා වගේම තවත් කිරණ ක්‍රමයක් තමයි මේ මානසික පැත්තෙන් තියෙන මන්ත්‍ර බලයෙන් එහෙම නැත්නම් ශබ්ද විද්‍යාවෙන් කරන්නෙ. විවිධ ක්‍රමවලින් ඒවා ආයුධ වගේ සම්බන්ධ කරනවා. ඒ සම්බන්ධය ගොඩ නගන එක තමයි මන්ත්‍ර බලයෙන් කරන්නෙ. මෙතනදී ශබ්ද විද්‍යාව, ක්‍රියා විද්‍යාව මේ ආදී සියල්ලම සම්බන්ධ වෙනවා. කෙනෙකුගේ ගති ගුණ, ගති හඬ, ගති රුව කියන මේ කාරණා තුනෙන් මොකක් හරි එකක සම්බන්ධයක් ගොඩ නගා ගන්නවා. ඒ ඔස්සේ තමයි වස කරන්නෙ. කෙනෙක්ගෙ රූපයක් ඇඳල නම සිහි කරල දවස ගානෙ ඒකට වස් කළොත් ඒක ක්‍රියාත්මක වෙන්න පටන් ගන්නවා. කෙනෙකුගේ නම සිහි කරල සෙත් කරනව, සෙත් කවි කියනව වගේ තමයි මේ වස් කරන ඒවා ක්‍රියාත්මක වෙන්නෙත්. හොඳින් සමාධි වඩපු කෙනෙකුට යම් කිසි කෙනෙක්ගෙ නම ගම සිහි කරන කොට ඒ පුද්ගලයාගේ ගති ස්වභාවය මනසට පේනවා. ඒ වගේ ඉහළ සමාධි වඩපු උත්තමයන්ට මේ වගේ කාරණා සමාධියෙන් දැක බලා ගන්න පුළුවන්.

මේ වගේ කටු ගැසීම් ආදියෙන් කරන නීච වැඩ කෙනෙකුගේ කායික මානසික තත්ත්වයන් දෙකටම බලපානවා. මානසිකත්වය කල් යනකොට කායිකත්වයට පරිවර්තනය වෙනවා. රූපයේ බෙල්ල අල්ලල නිලයක් හිර කළොත් කල් යන කොට මස් ලේ සහිත බෙල්ලත් හිර වෙන්න පටන් ගන්නවා.



එහෙම ගිහින් බෙල්ලෙ පිළිකාවක්, ගෙඩියක් වගේ දෙයක් එන්නත් පුළුවන්. එහෙම නැත්නම් කතා කරගන්න බැරි වෙන්න පුළුවන්.

මේ වගේ හිර කිරීමක් අනෙක් පැත්තට කපන කොටත් ඒක බොහොම ප්‍රවේසමෙන් කරන්න ඕන. මේ කාරණය හරියට දන්නෙ නැති සමහර උදවිය, මේ වගේ දෙයක් කපන්නත් රූපයක් ඇඳල නැවත කටු ගහනවා. කටු ගහල කපනවා. නමුත් ඒක ශාස්ත්‍රයට ගැලපෙන්නෙ නෑ. රූපය ඇඳල කපල අර ගහපු කටු කැපෙන්න ඒ නිල ස්ථානවල ලකුණු කරල කපනව මිසක්, කටු ගහල කැපුවොත් තවත් දොස් එනවා. ඒකෙන් වෙන්නෙ කටු ගහල වැදිල හිරවෙලා ඉන්න කෙනා තවත් හිරවෙන එක.

මේ කටු ගහල හිර කරනව වගේ කරන තවත් නීච වැඩක් තමයි කෙනෙක්ගෙ කට හඬක් අල්ලල මන්ත්‍ර බලයෙන් මතුරාගත් කහ අලයකට නියපොත්ත ගැසීම. කහ අලය මන්තර බලයකින් මතුරල ගත්තම ඒකෙ යම්කිසි ශක්තියක් ගැබ් වෙනවා. කවුරුහරි කතා කරන කෙනෙකුගේ කට හඬ නවත්තන්න ඕන නම්, ඒ පුද්ගලයා කතා කරන වෙලාවක හරියට කට හඬ අල්ලල අර කහ අලයට නියපොත්තෙන් අනිනවා. නියපොත්ත වදින කොටම ඒ පුද්ගලයගෙ උගුර පැටළුමක් එනවා. ඒකෙන් කටහඬ දුර්වල වෙලා පුද්ගලය දුර්වල වෙනවා.

ඒ වගේම මේ කටහඬ අල්ලල කෙනෙක් හිර කරන තවත් ක්‍රමයක් තියෙනවා. යම්කිසි සොහොනකට ගහපු ඇණ අරගෙන ඒවා ගිනියම් කරල මන්තර බලයෙන් ජීවම් කරනවා. රත් වෙච්ච ඇණය ඉස්තිරික්කයක් වගේ උපකරණයක රහසිගතව දාගෙන ගිහින් පොල් ගහක හෝ තැඹිලි ගහක කරටියට කටහඬ අල්ලල ගහනවා. ඒ කියන්නෙ තමන්ට මෙල්ල කරන්න අවශ්‍ය පුද්ගලයා කතා කරන වෙලාවක් බලල ඒ හඬ ඇහෙන කොටම ගිනියම් වෙච්ච යකඩ ඇණය එළියට අරන් පොල් ගහේ කරටියට ගහනවා. ගහපු ගමන් කරටිය පුච්චගෙන ඇණය ඇතුළට බහිනවා. ඊට පස්සෙ ගහ මැරෙනවා. මේක කරන්නෙ රෑ 12 ට විතර. මේකට ඒ පුද්ගලයගෙ කටහඬ ඇහෙන සීමාවක තියෙන පොල් ගහක් හොයාගෙන රැකගෙන ඉන්නවා. ඇණය ගහන වෙලාවෙදී පුද්ගලයාට වෙනසක් දැනුනෙ නැතත් ටික දවසක් යනකොට බෙල්ල හිරවෙන්න පටන් ගන්නවා.

මෙතනදී ඒ පොල් ගහ තමයි මනුස්සයා හැටියට කැප කරන්නෙ. ඒ කියන්නෙ ප්‍රාණයට ප්‍රාණයක් විදියට තමයි පොල් ගහ ගන්නෙ. අනෙක් ගස්වලට වඩා පොල් ගහ විශේෂයි. පැරණි සාම්ප්‍රදායන් අනුව පුද්ගලයෙකුගේ ප්‍රාණයට ප්‍රාණයක් උපමා කරල තියෙන්නේ කප් රුක හෙවත් පොල් ගහට. ඒ වගේම යම් කිසි කෙනෙක් නයෙක් මැරුවොත් ඒකෙ සාපය යන්න පොල් පැල හතක් හිටවන්න කියලත් පැරණි සම්ප්‍රදායක් තියෙනවා. මෙතනදී පොල් ගහේ කරටිය කියන්නෙ මනුස්සයගෙ බෙල්ල. පොල් කරටිය ළපටි නිසා, කොවුලක් නැති නිසා ඒකට ඇණ ගැහුවම කල් යනකොට එතැන කුණු

වෙනවා. ගහ මැරෙනවා කියන්නෙ මනුස්සයත් මැරෙනවා. නැත්නම් කර්ම විපාකවල ප්‍රබලත්වය අනුව ලෙඩ කරනවා.

මෙතනදී සොහොන් ඇණයක්ම ගන්නෙ මහ සොහොන් දිෂ්ටිය ගන්න ඕන නිසා. අමනුස්ස සම්බන්ධයක් මෙතනදී ක්‍රියාත්මක වෙනවා. ඒ ඇණය පුච්චල ගන්නෙ විනාසෙන් විනාසෙම වෙන්න කියන අදහසින්. මුගෙ බෙල්ල කඩාපන් ..... බොටුව කඩල ලේ බීපිය........ තොට හිමියි...... කැපයි........ ආදී වශයෙන් මන්තර කියමින් තමයි මහ සොහොන් දිෂ්ටියට කැප කරන්නෙ. ඒ ගහ මැරෙනවත් එක්කම මනුස්සයත් ඉවරයි. එක්කො මැරෙනවා, එහෙම නැත්නම් ඔත්පල වෙනවා. හරියට පඹයෙක් පුච්චනව වගේ වැඩක් තමයි මෙතනදිත් වෙන්නෙ. ඒකෙන් සංකේතාත්මකව පුද්ගලයාව විනාස කිරීමක් අර්ථ ගන්වනවා. ඒ සාප කිරණ ගිහින් පුද්ගලයාට වදිනවා. මේ වගේ මහ සොහොනට කැප කළාට පස්සෙ පොල් ගහේ කරටිය කඩල යනව  වගේ බෙල්ල ඔත්පල වෙනවා.

දේවාල ආදියට ගිහින් සාප වෙන්න, කුඩු පට්ටම් වෙන්න කියල පොල් ගහන්නෙත් මේ වගේ තමයි. හැබැයි ඒකට විශේෂ දෙයක් ඕන නෑ. වැලි ටිකක් අරගෙන හෙණ ගහපිය කියල පොළවෙ ගැහුවත් ඒකත් කර්ම විපාකයන්ට අනුකූලව සම්බන්ධ වෙනවා. ඒ සාපය වදිනවා. බුදුන් වහන්සේ බෝධිසත්ව පාරමිතා පුරන කාලයේ එන සේරුවාණිජ ජාතකය ගත්තොත්, බෝසත් සේරු වෙළෙන්දගෙන් පළිගන්න, කරන්න දෙයක් නැති තැන කච්චපුට අන්තිමට මොකද කළේ, වැලි ටිකක් අරගෙන වැලි කැටයක් කැටයක් ගානෙ මං තෝ පස්සෙ පළිගන්නව කියල පළි ගැහුවා. ඊට පස්සෙ උන් වහන්සේ බුදු වෙලත් දෙව්දත් (පෙර කච්චපුට) වැලි කැටයක් ගානෙ පළිගන්න පස්සෙන් ආවා. මේ වගේ සම්බන්ධයක් ඇති කළාම චිත්ත වේගයත් එක්ක ඒක බලපානවා. හොඳ නරක දෙපැත්තටම මේ වගේ දේවල් කරන්න පුළුවන්.

ඊළඟට මේ වගේ දෙයක් කපන්න පුහුලයක් කපන කොටත් අර තියෙන දෝස කැපිල සුනු විසුණු වෙලා පලයන් කියල කපනවා. ඒ අදහස දීල කපන කොට, හිරවෙයන් කියල දුන්නට වඩා වැඩි බලයක්, කැපිල පලයන් කියල දුන්නම ඒ දෝසයත් කැපිල යනවා. මේ නිසා යම්කිසි දෝසයක් කපන්න නම් ඒ දෝසය කරන්න ගත්ත ශක්තියට වඩා වැඩි ශක්තියක් ඒක කපන්න දෙන්න ඕන. මේ වගේ රූපයට හිර කරපු බන්ධනයක් තියෙනව නම්, ඒ හිර වෙච්ච එකට හිත තියල, ඒක බුරුල් වෙලා කැපියන් කියල මන්ත්‍ර ශාස්ත්‍රය දන්න කෙනෙක් ලවා ඊළඟට මතුරනවා. හිර වෙයන් කියන එකේ ශක්තිය ජූල් 1000 ක් වුණා නම් දැන් ඒක බුරුල් වෙලා කැපියන් කියන එකේ ශක්තිය ජූල් 1000 ට වඩා වැඩි වෙන්න ඕන. (ජූල් කියන්නෙ ශක්තිය මනින ඒකකයක්) ඊට වඩා අඩුවෙන් දුන්නට ඒ හිරවෙච්ච එක කැපෙන්නෙ නෑ. මේක චිත්ත ශක්තිය මනින්න පෙන්වපු උපමාවක් විතරයි.

මේ චිත්ත ශක්තිය මනින්නෙ ඇත් බලවලින්. ඇත්බල කිව්වම පහලම සාමාන්‍ය කුලයේ ඉඳන් ඉහළම සද්දන්ත කුලය දක්වා ඇත් බල වර්ග 10 ක් තියෙනවා. සාමාන්‍ය  බලවත් අමනුස්ස-යෙකුට මේ සාමාන්‍ය ඇත් බල 75 ක් තියෙනවා. විෂ්ණු දෙවියන්ට ඒ වගේ සාමාන්‍ය ඇත් බල කෝටි 5 යි. බ්‍රහ්මයින්ට එහෙම මිම්මකින් පෙන්වන්න අමාරුයි. බුදුන් වහන්සේට අප්‍රමාණයි. බුදුන් වහන්සේට දස බලධාරී කියල කියන්නෙ උන් වහන්සේගේ කාය බලය ඉහළම ඇත් කුලය වන සද්දන්ත කුලයේ ඇත්තු 10 ක බලයක් කියල පෙන්වන්න. ඒ බලය අනෙක් අයගෙ ඇත් බල එක්ක බලද්දි මහා විශාල ශක්තියක්. ඒ කාය බලය. මානසික බලය එහෙම සීමා කරන්න බෑ. ඇත් බල 5 ක් තිබ්ච්ච කාන්තාවක් බුදුන් වහන්සේ වැඩ හිටපු කාලයේ හිටිය බව අටුවා කතාවක සඳහන් වෙනවා. ඒ තමයි බන්ධුල මල්ලිකාව. ඒක පුණ්‍ය ඍද්ධියක්. ඇයට ඒ ඇත් බල තියේද කියල පරීක්ෂා කරල බලන්න කොසොල් රජතුමාට ඕන වුණා. මේ නිසා රජු මොකද කළේ ඇතා ඉස්සරහට යැව්වා. පැත්තක හිටපු අනෙක් අය ඔක්කොම පැනල යද්දි බන්ධුල මල්ලිකා ඒක ගණන් ගන්නෙ නැතිව හිටියා.  ඇතා ළඟටම ආවම ඇය ඇතාගෙ හොඬවැලෙන් අල්ලල මිරිකුවම ඇතා මුත්‍රා දාගෙන එහෙම්ම ඉන්ද වුණාලු. එතකොට ඇත් බල 5 කින් තමයි ඒ වගේ ඇතෙක් මෙල්ල කළේ. ඇත් බලවල ස්වභාවය පෙන්වන්නයි මේ කාරණය කිව්වෙ.

දැන් එතකොට මේ වගේ රූපයට කටු ගැසීම්, ඇණ ගැසීම් ආදී නීච වැඩවලින් සිද්ධ වෙන අපරාධයන් ගැන අපේ සමාජය දැනුවත් නෑ. එහෙම දේවල් තියෙනවයි කියල බොහොමයක් මිනිස්සු විශ්වාස කරන්නෙත් නෑ. මොකද ඒ පැත්ත ගැන වැඩිය කතා කරන්නෙ නෑ, කතා කරන්න දන්නෙත් නෑ. නමුත් මේ කරන අපරාධවලින්, පසු කාලීනව ඇති වන ලෙඩරෝග කරදර බොහොම බරපතලයි. මේවා වෛද්‍ය විද්‍යාවට අහු වෙන්නෙත් නෑ. ඉතින් මේ වගේ සිද්ධියකින් අසනීපයක් කරදරයක් හැදුනම ඒක වෙනත් භෞතික ක්‍රියාවකින් සිද්ධ වෙන්න ඇති කියල හිතාගෙන, ඒකට භෞතික ප්‍රතිකර්ම කරන එක තමයි අද බොහෝ විට සිද්ධ වෙන්නෙ. නමුත් අන්තිමට බලන කොට කාලයක් තිස්සෙ දුක් විඳල ඔත්පල වෙලා මනුස්සය මැරිල යනවා.

දැන් කෙනෙකුට හිතෙන්න පුළුවන්, ඒකට ලක්වෙච්ච අය මේ විදියට නිකරුණේ මැරිල ගියත්, ඒව කරපු අයට මොනවද වුණේ, උන් යහතින් ඉන්නවනෙ කියල. යහතින් ඉන්නවයි කියන්නෙ අපිට පේන හරිය. ඔය වගේ නීච වැඩ කරපු උදවිය මරණාසන්න වෙද්දි බොහෝ කොටම දුක් විඳල, සමහර විට පණුවොත් ගහල තමයි මැරෙන්නෙ. මැරිල ගිහින් බැලුවමත් මහා දුක්ඛිත තත්වයෙන් කල්ප ගණන් විඳවන ගිනි අපායවල්වල තමයි ඉපදෙන්නෙ. මොකද මිනිස්සුන්ට දීපු ගින්දර නිසා. මොකක් හරි හේතුවකින් මනුස්ස අත් භවයක් ලැබුවත්, අර කර්ම විපාකයේ ශේෂ මාත්‍රයක් හරි තියේ නම්, හෙණ ගහන්න වගේ ඒක විඳින්න වෙනවා. නමුත් ගැටළුව තියෙන්නෙ අද වුණත් සමාජයේ එහෙම විපාක විඳවන අය හිටියත්, අහවල් සිද්ධිය නිසා ඒක විඳවනවයි කියල කියන්න කවුරුවත් දන්නෙ නෑ. ඉතින්, අනේ අපොයි විඳින දුකක්? වෙච්ච අපරාධයක්? කියල හූල්ලනව මිසක් හේතුඵල දකින්නෙ නෑ. ''කරන කලට පව් මිහිරිය මී සේ - විඳින කලට දුක් දැඩි වෙයි ගිනි සේ'' කියන කාරණයත් වටහා ගත්තොත් මේ කියන කතාව පුදුමයක් නෙවෙයි. මේ වගේ කාරණාවක් පෙන්වා දුන්නෙ නොපෙනෙන පැතිවලින් කෙරෙන අපරාධයන් පිළිබඳව ජන සමාජය දැනුවත් විය යුතු නිසාත්, මේ වගේ නීච වැඩවල බරපතල පැත්ත, විශේෂයෙන් මරණින් මතු අත් වන ඉරණම පෙන්වා දී, ඒවායින් ඈත් වී මෙලොව පරලොව අභිවෘද්ධිය සලසා ගැනීමටත් ඉවහල් වන නිසා. මේ නිසා මේ වගේ කාරණාවන් පිළිබඳව ධර්මානුකූලව සිතා බලා, කෙටි කාලයක් ගත කරන මේ මනුස්ස ජීවිතය ඒ වගේ නීච වැඩවලට නොයොදා මෙලොව පරලොව වැඩ සලසා ගෙන නිවන් අවබෝධය පිණිස උත්සාහ ගන්නව නම් ඒක තමන්ටත් අනුන්ටත් කරන යහපතක් වෙනවා.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# මැරෙන බහුතරය සතර අපායට යන හැටි...

එක්තරා අවස්ථාවක බුදු පියාණන් වහන්සේ, උන්වහන්සේගේ නියපොත්තට පස් පිඬක් අරගෙන එතන හිටපු භික්ෂුන් වහන්සේලාට පෙන්වා මහණෙනි, මා මේ නිය පිඬට ගත් පස් පිඬද විශාල, එහෙම නැත්නම් මේ මහ පොළවේ ඇති පස් ද විශාල කියල ඇහුවා. එතන හිටපු භික්ෂුන් වහන්සේලා ස්වාමීනි, ඔබ වහන්සේගේ නිය පිඬට ගත්ත පස් ප්‍රමාණය මහ පොළවෙ තියෙන පස් එක්ක බැලුවම ඉතාම කුඩායි, කලාවෙන් කලාවක්වත් නෑ කියල උත්තරයක් දුන්නා. නැවතත් බුදුපියාණන් වහන්සේ මහණෙනි, මෙන්න මේ නිය පිඬට ගත් පස් වගේ ප්‍රමාණයක සත්වයෝ කොටසක් තමයි, මා මේ දේශනා කරපු චතුරාර්ය සත්‍යය අවබෝධ කර ගන්නේ, අනෙක් අය සසර ගමනේ දිගටම යනව කියල ඒ භික්ෂුන් වහන්සේලාට පහදල දුන්නා.

දැන් ඇත්තටම අර ඉතුරු අයට මොකද වෙන්නේ ?

ඉහත විස්තරේම උන්වහන්සේ තව දුරටත් මේ විදියට පැහැදිලි කරනවා. මනුස්සයෙක් මැරිල නැවතත් මනුස්සයෙක් වෙනව කියන එකත් ඉතාම අඩුයි. ඒ මැරුන අයගෙන් සතර අපායට යන පිරිස බොහෝ වැඩියි. ඒකට හේතුව තමයි ඒ අයට චතුරාර්ය සත්‍යය අවබෝධ නොවීම. (සංයුක්ත නිකාය 5-2- 351 පිටුව - මනුස්සචුති සූත්‍රය). බොහෝ අය කිව්වම ඔක්කොම නෙවෙයි, ඒකෙ තේරුම මැරෙන බහුතරයක් ගිහින් නවතින්නෙ සතර අපායේ කියන එක. එහෙම කොහොමද කියන්නෙ කියල කෙනෙකුට ප්‍රශ්නයක් එන්න පුළුවන්. ඇයි චතුරාර්ය සත්‍යය අවබෝධ නොකර හිටියම මනුස්සයෙක් වෙන්න හෝ සුගතියකට යන්න එච්චර අමාරු? මනුස්ස අත්බැවක් මෙච්චර දුර්ලභ වෙන්නෙ කොහොමද? මේ වගේ ප්‍රශ්න කෙනෙකුට එන්න පුළුවන්. සියලු දේ සියලු ආකාරයෙන් දැක වදාළ බුදුපියාණන් වහන්සේගේ දේශනාවලින්ම සහ අපි ලෝකයේ එදිනෙදා ගනුදෙනු කරන අයගේ හැසිරීම බලල තමයි අපිට මේ ප්‍රශ්නවලට උත්තර හොයන්න වෙන්නෙ. මුලින්ම බුද්ධ දේශනාව අරගෙන බලමු.



කෙනෙකුට හිතෙන්න පුළුවන් ඇයි මේ මනුස්සයෙක් වෙන එක මෙච්චර දුර්ලභ කියල. මනුස්සයෙක් වෙලා ඉන්න කොට කරන කියන දේ අනුව තමයි ඒක තීරණය වෙන්නේ. එහෙම කොහොමද කියන්නෙ? නැවතත් ප්‍රශ්නයක් එනවා. මුලින්ම බලමු මනුස්සයෙක් වෙලා උපදින්න තියෙන හේතුව මොකක්ද කියල. මනුස්ස ජාතිය කියන්නෙ ඵලයක් නම්, ඊට අනුකූල හේතුවක් තියෙන්න ඕන. ජාතියක් නිකන් හටගන්නෙ නෑ. මනුස්ස ජාතියක් හටගන්න නම් ඒ ජාතිය ගොඩනගන්න, නිර්මාණක ශක්තියක් තියෙන්න ඕන. ඒකට කියනවා භව ශක්තිය කියල. (අලෝභ, අද්වේශ, අමෝහ කර්මවේග නිසා හටගන්නා විඤ්ඤාණය) ඒ ශක්තිය තුල මනුස්සයෙකුගේ ගුණාංග තියෙන්න ඕන. මෙන්න මේක තමයි භව කියන්නෙ. උපමාවකින් කියනව නම්, අඹ ගහකින් කොස් ගෙඩියක් හටගන්නෙ නෑ. අඹ ගහේ හටගන්නෙ අඹ. අඹ ගහේ කොළවලින්, මුල්වලින් ගන්න ශක්තිය අඹ ගෙඩියක් නිෂ්පාදනය කරනවා. ඒ වගේමයි මනුස්ස ජාතියක් ගොඩ නගන්න නම් මනුස්ස භවයක් තියෙන්න ඕන. නිකන් මනුස්ස භවයක් ලැබෙන්නෙ නෑ. කොටින්ම කියනව නම්, ඒ තුල මනුස්සකම තියෙන්න ඕන. වැඩි වැඩියෙන් මනුස්සකම තියෙන කෙනාට, ඒකටම ක්‍රියා කරන කෙනාට, ඒ තුලම ඉන්න කෙනාට ඒ ශක්තිය තියෙනවා. මේකට කියනවා මිනිස් උපාදානය කියල. මනුස්ස වැඩවලටම කැමතියි. හොඳ මනුස්සයෙක්. කෙනෙකුට උදව් උපකාර කරනවා. ඒ තැනටම හා වෙලා ඉන්නවා. මේ මනුස්සකම කියන තැනට හා වෙලා ඉන්න එකට කියනව, මිනිස් තණ්හා කියල. නිකන් කෙනෙක් ඒ ගුණයට, ගතියට හා වෙන්නෙ නෑ. මම මේ මිනිස්සු එක්ක ඉන්න ඕන, මේ අය ළඟ ඉන්න එකත් මට සැපක්. ඒ අයට උදව් උපකාර කරගෙන ඉන්න තියෙනව නම් කොච්චර හොඳද? මේ විදියට මනුස්ස වාසයම ස්පර්ශ කරගෙන ඉන්නවා. මේ මනුස්ස ස්පර්ශයෙන් එන මනුස්ස ආස්වාදය නිසයි අර කිව්ව තැනට හා වෙලා ඉන්න ඕන කියන හැඟීම ආවේ. ඇහෙන් බලනවා, මනුස්ස රූප දකින්න කැමතියි, ඒ අය එක්ක ඉන්න කැමතියි, ඒ ශබ්ද අහන්න කැමතියි. ඒ අයව අල්ලන්න කැමතියි. වඩාගන්න හුරතල් කරන්න කැමතියි. ඉතින් මනුස්ස ඉන්ද්‍රියන්ගෙන් ඇස, කන, දිව, නාසය, ශරීරය හා මනස කියන මේ සියල්ල ආයතන කරගත්ත නිසයි, මිනිස් දහම් ස්පර්ශ කරන නිසයි ආස්වාද ලබන්නෙ. එතකොට ඇස, කන, දිව, නාසය, ශරීරය සහ මන කියන ඉන්ද්‍රියන් කොහොමද ආයතන වුනේ ? හිතේ බැහැගෙන තියෙන්නෙම, ''අනේ මගෙ පුතාව ගොඩක් දවසකින් දැක්කෙ නෑ, මේ වැඩ නිසා ගමේ යන්නත් බැරි වුනා. ගෙදර හිටියනම් වඩාගෙන හුරතල් කරනවා. සෙල්ලම් කරන්නත් තිබුණා. පොඩි එකා හුරතල් වෙච්ච හැටි, සෙල්ලම් කරපු හැටි මට මැවිල පේනවා. මේ සතියම නිවාඩුවක් දාල යන්න ඕන.'' මේ වගේ දේවල් තමයි හිතේ බැහැගෙන තියෙන්නෙ. මේකට කියනව හිතේ මිනිස් නාම රූප බැහැගෙන කියල. ☞

ඉතින් මේ මිනිස් නාම රූප නිකන් හිතේ බැහැ ගන්නෙ නෑ. මනුස්ස ජීවිතය හොඳයි, ඒ අය එක්ක ඉන්න එක කොච්චර හොඳද, ළමයි හුරතල් කරල ගෙදර අයත් එක්ක සතුටින් ඉන්න එක කොච්චර හොඳද කියල, හිතේ හදාගත්ත මිනිස් බලාපොරොත්තු තියෙනවා. කලින් සිද්ධ වෙච්ච ඒවා හිත හිතා, දැන් සිද්ධ වෙන ඒවා එක්ක සතුටු වෙවී මතුවටත් එහෙම බලාපොරොත්තු වෙනවා, මිනිස් කර්ම විඤ්ඤාණ ගොඩ නගනවා. මේ කර්ම විඤ්ඤාණ මතු පුනර්භවයට හේතු වෙනවා. හිතේ බැහැ ගන්න හේතුව තමයි මෙන්න මේ ගති. ඒ ගතිය මුල් කරගෙන විඤ්ඤාණ හටගන්නවා. මේ විඤ්ඤාණ නිකන් හටගන්නෙ නෑ. කෙනෙක් හිතල කියල කරන ක්‍රියා, මනුස්සයන්ට ගැලපෙන සිතිවිලි, කතා සහ ක්‍රියාකාරකම්..... මේවට කියනව මනුස්ස සංඛාර කියල. මේ මනුස්ස සංඛාර නිසා තමයි අවසානයේ අර මනුස්ස විඤ්ඤාණය හට ගෙන අනුකූලව මනුස්ස ජාතිය හැදෙන්නේ.

මනුස්ස ජාතිය කියන්නෙ සුගති ජාතියක්. සුගතියක නිකන් ඉපදෙන්න බෑ. ඒකට පින් දහම් කරන්න ඕන. පින් දහම් කියන්නෙ අලෝභ, අද්වේශ, අමෝහ ක්‍රියා. දැන් පැහැදිලියි නිකන් මනුස්සයෙක් වෙන්න බෑ කියල. කෙනෙකුට හිතෙන්න පුළුවන්, අපි පින් දහම් කරනවනෙ ඇයි මනුස්සයෙක් වෙන්න ඔච්චර අමාරු කියල. තව කෙනෙක් කියන්න පුළුවන්, මහ ලොකුවට පිනක් නොකෙරුවට අපේ අතින් පවක් නම් වෙන්නෙ නෑ කියල. නිකමට කෙනෙකුගේ ජීවිතයේ එක දවසක් අරගෙන බලමු.

උදේට නැගිටල වැඩට යන කෙනෙක් ගැන හිතුවොත්, ඔහු උදෙන්ම නැගිටින්න ඕන වැඩට යන්න. කලින් දවසෙ පරක්කු වෙලා නිදාගත්තෙ. ඉතින් ගෙදර නෝන ඇවිල්ල නැගිට්ටවනවා, වැඩට යන්නෙ නැද්ද පරක්කු වෙලා කියල. දූන් හා හොඳයි කියල නැගිටිනවද? එහෙම නැත්තම්, මොන මළ කරදරයක්ද මන්ද උදේ පාන්දර කෑ ගහන්න ගත්තෙ කියල නැවතත් අනෙක් පැත්ත හැරිල නිදා ගන්නවද? නැවතත් ටික වෙලාවකින් ඇවිල්ල නැගිට්ටවනවා. දූන් ඉතින් බැන බැන තමයි නැගිටින්නේ. මේ වගේ වෙලාවට හිතේ කොච්චර නම් ද්වේශ සහගත සිතිවිලි ඇතිවෙන්න පුළුවන්ද? ද්වේශ සිතිවිලි අයිති වෙන්නෙ පාප මනෝ සංඛාරවලට. එයින් ගොඩ නැගෙන විඤ්ඤාණවලින් අවසානයේ ද්වේශ ජාතිය තමයි හැදෙන්නෙ. ඒ මොහොතේ ද්වේශ ජාතිකයෙක් වෙලා. ඔය එක අවස්ථාවක් විතරයි.

දැන් නැගිටල යනවා නාන කාමරයට. යනකොට ඒකෙ ඇතුලෙ පුතා හෝ දුව ඉන්නවා. ඉතින් නැවතත් කෑ ගහනවා ඉක්මනට එනවකෝ, මට වැඩට යන්න පරක්කු වෙනව කියල. දූන් නැවතත් හිත ඇතුලෙ ද්වේශය ගොඩනැගිලා. කොහොම හරි ඒ කටයුතු කරගත්ත කියමු. දූන් වෙලාව බලනවා හොඳටම පරක්කු වෙලා, නැවතත් කලබල වෙනවා. කෑම මේසෙට යන කොට කෑම බෙදලත් නෑ. නැවතත් කෑ ගහනවා, කෝ මට පරක්කු වෙනව ඉක්මනට කෑම ටික බෙදල ගේනවකො කියල. දූන් නෝන කෑ ගහනවා තාම උයල නෑ කියල. ඉතින් වැඩට යන්නත් පරක්කු වෙලා කෑම ටික බෙදලත් නෑ. නැවතත් තරහ එනවා, ද්වේශ ජාතිය. දැන් කොහොම හරි බැන බැන පාර දිගේ ගිහින් බස් නැවතුමට එනවා. එන බස් සේරම පිරිල යන්න විදිහක් නෑ. වෙලාව බලනවා. වැඩ පටන් ගන්න වෙලාවත් ළඟයි. ඒ වුණත් යන්න විදිහක් නෑ. නැවතත් එන බස්වලටයි මිනිස්සුන්ටයි බැන බැන ඉන්නවා. තවත් හිත ඇතුලෙ ද්වේශය ගොඩ නැගෙනවා. දැන් ඊළඟට බස් එකක් ආවම ඒකට නගිනවා. ඒකත් යන්නෙ කොට කොට. දැන් බස් එකේ රියදුරු තැනට බනින්න පටන් ගන්නවා. කලින් වගේම ද්වේශ සංඛාරවලින් ද්වේශ ජාතිය ගොඩ නැගෙනවා. ඔය අතරෙ පරක්කු වුණාම රස්සාව බේර ගන්න බොරුත් කියනවා. ඉතින් ඔය උදේ වරුව විතරයි. නිකමට හිතන්න දවස පුරාම අපි හිතන, කියන, කරන දේවල් අනුව කොච්චර නම් ද්වේශ සිතිවිලි, ලෝභ සිතිවිලි හටගන්නවද කියල. ''අපෝ අර නාකියා මං ගාවමයි ඇවිල්ල හිටගත්තෙ ! අමාරුවෙන් අල්ල ගත්ත සීට් එක මේකට දෙන්න පුළුවන්ද?'' මේ වගේ සිතිවිලි තමයි එන්නෙ. ඊට පස්සෙ අර ඇලීමයි ගැටීමයි හොඳයි කියල ගත්ත දෘෂ්ඨිය, මෝහ සහගත සිතිවිලි. බහුතරයක් මිනිස්සු මේ විදිහට තමයි දවස ගෙවන්නෙ. ඉතින් මනුස්සයෙක් වෙලා ඉපදෙන්න අලෝභ, අද්වේශ, අමෝහ උදව් වෙනවා. ඒ වගේම දුගතියකට යන්න, ඒ කිව්වෙ තිරිසන්, ප්‍රේත, අසුර නිකායෙ හෝ නිරය වගේ තැනකට යන්න, එක්කෝ ලෝභ + මෝහ, එහෙම නැත්නම් ද්වේශ + මෝහ තමයි උදව් වෙන්නෙ.



ඔය ජාතියේ නිතරම පුපුර පුපුර ඉන්න කෙනෙක් මැරුණොත් මොකක් වෙයිද? ද්වේශ ජාතියෙන් නිතරම දැවි දැවී දාහෙන්, ගින්නෙන් ඉන්න තැනක තමයි ජාතිය හටගන්නෙ, හෙවත් උප්පත්තිය තීරණය වෙන්නෙ. වැඩිපුරම අල්ලගත්ත තැන තමයි වැඩිපුරම ගිහින් උපදින්නෙ. ඒ නිසා තමයි බුදුන් වහන්සේ උන්වහන්සේගේ තුන්කල් දක්නා නුවණින් බලල කිව්වෙ, මේ මනුස්සයෙක් වෙලා ඉපදෙන එක ලේසි පහසු වැඩක් නෙවෙයි කියල. පහත දේශනාවෙනුත් ඒ කාරණය පැහැදිලි වෙනවා.

මහණෙනි, එසෙයින්ම **යම් සත්ව කෙනෙක් මිනිසුන් කෙරෙන් චුත වූවාහු මිනිසුන් කෙරෙහි උපදිත් නම් ඔහු මඳයහ. යළි මේ සත්ව කෙනෙක් මිනිසුන් කෙරෙන් චුත වූවාහු තිරිසන් යෝනියෙහි උපදිත් නම් මොහුම බොහෝය.** (සංයුක්ත නිකාය 5-2 - 351 පිටුව - දෙවන මනුස්සචුති සූත්‍රය)

ඔය විදිහට පිළිවෙලින් තුන්වන, හතරවන, පස්වන, සයවන මනුස්ස චුති සූත්‍රවලත් විග්‍රහ කරල තියෙනව, මේ මැරෙන මිනිස්සු වැඩිපුරම යන්නෙ සතර අපායට කියල. අර ඉහත උදාහරණයෙන්, කෙනෙක් ගත කරන උදේ වරුව විතරයි පෙන්නුවෙ. මුළු දවසම අරගෙන ඒ කෙනා ජීවත් වෙලා ඉන්න කාලෙ අවුරුදු පනහක් නම්, ඒ අවුරුදු පනහට ඔහු හෝ ඇය කෙරෙන් පිටවුන ලෝභ, ද්වේශ, මෝහ සහගත සිතිවිලි මෙච්චරයි කියල කෙනෙකුට ගණන් මිම් පෙන්වන්න පුළුවන්ද? එතකොට ලෝභයෙන් කරපු ක්‍රියා, ද්වේශයෙන් කරපු ක්‍රියා, මෝහයෙන් කරපු ක්‍රියා මෙච්චරයි කියල ගණන් මිම් කියන්න පුළුවන්ද? කෙනෙකුට බැනපු ඒවා, කුණුහරුප කියල හිත් රිදවපු ඒවා, කේලාම් කියල බිඳවපු ඒවා මෙච්චරයි කියල ගණන් කියන්න පුළුවන්ද? ඉතින් කෙනෙකුට කියන්න පුළුවන්ද අපි පින් නොකළට පවු නම් කරන්නෙ නෑ කියල? ☞

නොදැනුවත්වම දවස ගානෙ කොච්චර නම් පාප කන්දරාවක් ඉහත පෙන්වපු ක්‍රමයට සිද්ධ වෙනවද ? මේ විදියට බලන කොට මනුස්සයෙක් වෙලා නැවතත් ඉපදුනොත් තමයි පුදුමෙ.

ඉතින් අපි ඉඳල හිටල දාන මාන දෙනවනේ! ඔය පින මැරෙන මොහොතක එන්න බැරිද? කෙනෙක් මෙහෙම අහන්න පුළුවන්.

එන්න පුළුවන්, ඒත් ඉතින් කාටද අනිවාර්යෙන්ම එයි කියල ඒකට ඇප වෙන්න පුළුවන්? එහෙම ආවොත්, කෙනෙකුට ඒ දානය දීපු එක කොච්චර හොඳ දෙයක් ද, සංඝයා උදෙසා දීපු දානය කොච්චර වටිනවද කියල මතක් වෙයිද? එහෙම නැත්නම්, මගේ හොඳම හැන්දත් නැතිවෙලා අරකි තමයි අරන් යන්න ඇත්තෙ, දැක්කනේ අරගොල්ලො ඇඳගෙන ආපු හැටි. අපිට වඩා එහෙම දානයක් දෙන්න පුළුවන් කෙනෙක් ඉන්නවද.... මේ වගේ දේවල් මතක් වෙයිද? පළමු අවස්ථාව මතක් වුනොත් නම් ප්‍රශ්නයක් නෑ, නමුත් අර දෙවැනි අවස්ථාව නැගිල ආවොත් මොකක් වෙයිද? බොහෝවිට කෙනෙකුට මරණාසන්න මොහොතෙ වැඩිපුරම ඇදිල එන්නෙ තමන් ජීවත් වෙලා ඉන්න කොට වැඩිපුරම උපාදානය කරගෙන හිටපු දේවල්. උපමාවකින් කියනව නම්, ළමයෙක් රඹුටන් ගහකට නගිනවා. දැන් ඔහුට පේනව වටේම ඉදුණු රඹුටන්. හැම තැනම ඉදුණු රඹුටන් වලු. මුලින්ම අත යන්නෙ මොකටද? එතන තියෙන ලොකුම රඹුටන් වල්ලට. ඒ වල්ලෙනුත් මුලින්ම ගන්නෙ තියෙන ලොකුම ගෙඩිය. ඉතින් ඔය වගේ තමයි මරණාසන්න මොහොත ආවමත්, වැඩියෙන්ම ඇලුම් කළේ ඕපාදූප හොයන්න නම්, ඒක මතුවෙලා එනවා. වැඩියෙන්ම ඇලුම් කළේ අනුන්ව කේලම් කියල බිඳවන්න නම්, ඒක ඇදිල එනවා. බොරුවෙන් මිනිස්සු රැවැට්ටුව නම් ඒක ඇදිල එනවා. අර ඉඳල හිටල දුන්න දානය යටපත් වෙනවා. හැබැයි ඒ දුන්න දෙයින් විපාක නෑ කියල නෙවෙයි මේ කියන්නේ. ඒකෙ විපාක තියෙනවා. නමුත් උපත තීරණය වෙන්නෙ තමන් වැඩියෙන්ම ඇලුම් කරපු දේ අනුව.

ඉතින් ඔය කියන තරම් මනුස්සයෙක් වෙලා ඉපදෙන එක දුර්ලභ නම්, ලෝක ජනගහනය දිනෙන් දින වැඩිවෙන්නෙ කොහොමද? දැන් තවත් කෙනෙකුට මෙහෙමත් ප්‍රශ්නයක් එන්න පුළුවන්.

දැන් ලෝකයේ මනුස්ස ජනගහනය කෝටි 700 ක් පමණ වෙනවයි කියනවා. නිකමට හිතන්න ගෙදර පොළොවෙ සීනි ටිකක් හැලුනොත්, එතනට කුඹි කී දාහක් ඇදිල එනවද කියල. ඒ පෝලිම දිගේ ගියොත් අර කුඹි ගුල හොයාගන්න පුළුවන්. ඒ කුඹි ගුලේ කුඹින් කොච්චර නම් ඉන්නවද? අපිට ඒක ගණනය කරන්න පුළුවන්ද? දැනට ගණන් බලා ඇති ආකාරයට එනම්, ක්‍රි.ව. 2000 දී කරපු පරීක්ෂණයකදී, අක්කර 670 ක භූමි ප්‍රමාණයක විහිදුන කුඹි ගුලක, වැඩකාර කුඹින් පමණක් කෝටි 30ක් ඉඳල







තියෙනවා. ඉතින් ගෙදර වත්ත උදලු ගාන වෙලාවක පස් යට ඉන්න කුඩා සතුන් කී දාහක් අපට පේනවද? අපිට පේන්නෙ නැති එවුන් කොච්චර නම් ඉන්නවද? අන්වීක්ෂයකින් බැලුව නම් පියවි ඇහැට පේන්නෙ නැති එවුන් බලාගන්න පුළුවන්. ඉතින් ඔහොම බැලුවම අපේ ගෙවත්තෙ ඉන්න කුඹින් ක්ෂුද්‍ර ජීවීන් ඇතුලු අනෙක් සත්තු ගත්තොත්, මුළු පෘථිවියේම ඉන්න මිනිස්සු සංඛ්‍යාව ඒ සත්ව ගහණයේ අහලකටවත් ළං කරන්න බෑ. එතකොට රටේම තියෙන ඉඩම්වල ඉන්න ඔය වගේ සත්තු ගණන් වශයෙන් බැලුවොත් කොච්චර නම් වෙයිද? එතකොට මේ ඔක්කොම කවද හරි මනුස්සයො වෙලා හිටපු අය. දැන් මේ උදාහරණයේදී පොළොව විතරයි ගත්තෙ. මුහුද ගැන හිතුවොත් මාලු විතරක් කොච්චර ප්‍රමාණයක් ඉන්නවද? ඔය අපට පෙනෙන හරිය. නොපෙනෙන ලෝකවල, එහෙම නැත්නම් ගන්ධබ්බ අවස්ථාවල ඉන්න සත්ව ප්‍රමාණය, අට මහ නිරය - ඔසුපත් නිරය - ලෝකාන්තරික නරකය වගේ තැන්වල ඉන්න නිරි සතුන්ගෙ ප්‍රමාණය, දේව කුලවල ඉන්න සත්ව ප්‍රමාණය, ඒ වගේම බ්‍රහ්ම අත්බැව්වල ඉන්න සත්ව ප්‍රමාණය මෙච්චරයි කියල අපිට කියන්න පුළුවන්ද? එතනිනුත් දේව බ්‍රහ්ම අත්බැව්වල ඉන්න දෙවියන්ට බ්‍රහ්මයින්ට වඩා නිරය වගේ අභව්‍ය ස්ථානවල ඉන්න සත්ව ප්‍රමාණය කෝටි ප්‍රකෝටි ගණනින් වැඩියි. ඔය අතරෙ ඉහල දේව තලවල එහෙම නැත්නම් බ්‍රහ්ම තලවලින් චුත වෙන අයත් මනුස්ස ලෝකවල ඉපදෙනවා. ඒ වගේම ගන්ධබ්බ ලෝකවල මවු කුසක් බලාපොරොත්තු-වෙන් ඉන්න අයත් මනුස්ස ලෝකයේ ඉපදෙනවා. අපායවල්වල දුක් විඳල ඒ කර්ම ශක්තිය ගෙවිල ඉවර වෙච්ච සතුන්ගෙන් යම් ප්‍රමාණයකුත් මනුස්ස ලෝකයේ උප්පත්තියට එනවා. මෙන්න මේ වගේ හේතූන් නිසා තමයි ලෝක ජනගහනය වැඩිවෙන්නෙ. නමුත් ඊට වඩා බොහෝ වැඩි ප්‍රමාණයක් සතර අපාගත වෙනවා.

එහෙම සතර අපාගත වෙන්නෙ මනුස්ස ලෝකයේ ඉන්න අය විතරක් නෙවෙයි. දේව බ්‍රහ්ම අත්බැව්වල ඉන්න අයත් ඒ අතර බොහෝ කොට වෙනවා.

හොඳයි ඉතින් තිරිසන් සතෙක් වුනා කියමුකො. ඒ සතාට නැවතත් මනුස්සයෙක් වෙන්න බැරිද?

ලෝවැඩ සඟරාවේ එන කවියකින්, ඉතාම අපූරුවට මනුස්ස අත්තවයක දුර්ලභ බව විස්තර කරල තියෙනවා.

**දිගු පුළුලින් සක්වල වන් සිඳු කුස**
**සිය වසකින් උඩ එන කැස්බෑ හිස**
**විය සිදුරෙන් නැගෙතත් දුගතිය බැස**
**තව උපදින්නට බැරි මෙ මිනිස් කුස**

මේකෙ තේරුම හොයල බලන කොට වැඩේ ලේසි නෑ. කුඹුරු සීසාන කොට ගොන් බානක් බඳින්න ගන්න හයිය ලීයක් තියෙනවා. ඒකට කියන්නෙ

විය ගහ කියල. ඔය ලීයෙ දෙපැත්තෙ සිදුරක් තියෙනවා. මේ ලීය ටික කලක් යනකොට පාවිච්චි කරන්න බැරි තත්ත්වයක් එනවා. දිරල ගියාම මේක විසි කරල දානවා. මේ විසි කරපු ලීය වැස්සකට අහුවෙලා ඇළකට හෝ දොළකට ගිහින් ඒකෙන් ගඟට යන්න පුළුවන්. ඒක ගඟ දිගේ ගහගෙන ගිහින් මුහදට යන්න පුළුවන්. මුහදෙත් ඔය ලීය පා වෙවී මුහුද මැද්දෙ තියෙන්න පුළුවන්. ඔය මුහුදෙ ඉන්න කැස්බෑවෙක් අවුරුදු සීයකට වරක් උඩට එනවා. මේ කැස්බෑවගෙ එක ඇහැයි පේන්නෙ. ඉතින් අර විය ලීයෙ සිදුර අහස දෙසට හැරිල තියෙන මොහොතක, ඒ වගේම හොඳට පුර හඳ පායල තියෙන දවසක, අර කැස්බෑවගෙ පේන එකම ඇහැ මේ ලීයෙ සිදුරට වැටෙනවා. දැන් ඒ කැස්බෑවට අහස පේනවා. මෙහෙම අවස්ථාවක් ගැන නිකමටවත් හිතන්න පුළුන්ද? කොච්චර නම් දුර්ලභ අවස්ථාවක්ද? හිතාගන්නවත් බෑ නේද? නමුත් බුදුන්වහන්සේ දේශනා කරල තියෙනවා, මේ සිදුවීමත් වෙන්න පුළුවන් කියල. හැබැයි ඒක එහෙම වුණත් තිරිසන් සතෙක් හෝ අපාගත වෙලා දුගති භව කිහිපයක් ගත කරපු කෙනෙක් මිනිසත් බවක් ලබනවා කියන්නෙ ඊටත් වඩා දුර්ලභ දෙයක් කියල දේශනා කරල තියෙනවා. හිතා ගන්නවත් පුළුවන්ද? ඇයි එහෙම වෙන්නෙ?

තිරිසන් අත්බැවක් කියන්නෙ සතර අපායෙන් එකක්. කෙලින් මාර්ගයක් තියෙද්දි, එහෙම නැත්නම් මේ ලෝකෙ හොඳ වැඩ කියල කොටසක් තියෙද්දි, ඒ මග ගමන් නොකර හරහට යන පිරිසක් ඉන්නවා. ඒ කිව්වෙ තමන් ඉන්න දෘෂ්ටිය අනුව හොඳ නරක තේරෙන්නෙ නෑ. ''මොකද වෙන්නෙ ටිකක් බිව්වට මම කාටවත් කරදරයක් කරනවද? එහෙම කොහොමද මගෙ ඉඩම ඌට දෙන්නෙ මම ඌව මරල තමයි පස්ස බලන්නෙ! ඔය වගේ එවුන් තියන්න හොඳ නෑ.....'' මේ ජාතියේ විවිධ දෘෂ්ටි අරගෙන කරන වැරැද්දේ බරපතලකම තේරෙන්නෙ නෑ. අනුන් රවටල බොරු කියල අරන් ගිහින් අනාථ කරල පැනල යනවා. නැවතත් සමාජයට මුහුණ දෙන්න බැරුව මුහුණ හංගගෙන, ඔළුව පහත් කරගෙන යන මේ වගේ වැඩවලට කියන්නෙ තිරිසන් වැඩ කියල. ඒකම උපාදානය කරගෙන මැරුණම ඉපදෙන්නෙ තිරිසන් අපායේ. බල්ලෙක් හෝ බළලෙක් හෝ මොකෙක් හරි තමන් කරගත්ත පාප කර්මය අනුව සතෙක් වෙලා ඉපදෙනවා. පිනක් කරගන්නවා කියන එක හිතන්නවත් අමාරුයි. අර විපාකයෙන් ලැබුන කායිකත්වය හා මානසිකත්වය ඒකට ඉඩ දෙන්නෙ නෑ. ඒ ඇයි? ඌ ජීවත් වෙන්නෙ බොහෝ කොට තවත් සතෙක් මරාගෙන කාල. මේ නිසා තිරිසන් සතුන් අතින් වැඩි පුරම සිද්ධ වෙන්නෙ පාප කර්මමයි. එතනින් මැරුණොත් නැවතත් ඒ ජාතියේම විපාකයක් ඇවිල්ල තවත් සතෙක්ගෙ බඩට යනවා. එන්න එන්නම මනුස්ස වාසයෙන් ඈත් වෙලා ක්ෂුද්‍ර ජීවි කියන තත්වෙටම පල්ලම් බහිනවා. එහෙම අවස්ථාවකදී ගැලවීමක් තියෙනව නම් තියෙන්නෙ, ආපහු කල්ප විනාශයෙන් පස්සෙ ආභස්සර බඹ ලොවට ගිහින් ආවම තමයි. ඉතින් කොච්චර කාලයක්ද කියල කියන්න බෑ. බුද්ධ දේශනාවට අනුව කල්පයෙන් කුඩා කොටසක් වන අන්තඃකල්පය විස්තර කරල තියෙන්නෙ මෙහෙමයි. (මහා කල්පයෙන් 1/80 ක් අන්තඃ කල්ප 1 යි.) යොදුනක් දිග, යොදුනක් පළල, යොදුනක් උස පෙට්ටියකට අබ ඇට පුරවනවා. කෙනෙක් අවුරුදු 100කට සැරයක් අබ ඇටයක් අර පෙට්ටියෙන් ගන්නවා. මේ අබ ඇට සියල්ල ඉවර වෙන්න යන කාලයටත් වඩා දිගු කාලයක් තමයි අන්තඃකල්පයක් කියන්නේ. ඒකෙන්ම හිතාගන්න පුළුවන් කොච්චර කාලයක් අපාගත වෙලා දුක් විඳින්න වෙනවද කියල.

ඉතින් ඔය අතරේ නිරයට වැටුනොත් ඊටත් වඩා භයානකයි. (මේ නිරය ගැන, අපට නොපෙනෙන ලෝකය දහම් ඇසින් කියන ලිපි පෙළ යටතේ විග්‍රහ කරල තියෙනවා.) සැප කියන මාත්‍රයක්වත් නැති තැනක්. තිරිසන් අපායේ අඩුම තරමේ කන්න බොන්නවත් ලැබෙනවා. වැස්සකට වුනත් නොතෙමෙන තැනකට යන්න පුළුවන්. නමුත් නිරය කොච්චර නම් භයානකද කියල, ලෝවැඩ සඟරාවේ තියෙන මේ කවියෙන් තේරුම් ගන්න පුළුවන්.

**තෙසියක් තෙප් මුව වැද සිදුරුව ගත**
**දවසක් මිනිසකු විඳි දුක් නොනැ වත**
**මොහොතක් නිරයේ විඳි දුක් සම වත**
**අබැටක් හා සරි නොවෙ දෝ හිම වත**

ඉහත කවිය තෝරල ගත්තොත්, කෙනෙක්ගෙ ශරීරයෙ තැන් තුන්සීයක් උල් ආයුධයකින් ඇනල තියෙනවා. ඉතින් ඒ මනුස්සයා දවසක් තුල අර තුවාලවලින් විඳින වේදනාව, නිරයේ එක මොහොතකදි විඳින දුක එක්ක සමාන කළොත් ඒක අබ ඇටයක් තරම්වත් ගණන් ගන්න බෑ. ඒක හරියට හිමාල පර්වතය අබ ඇටයකට සමාන කරනව වගෙයි. ඒ තරම්ම නිරා දුක භයානකයි. දෙවියෙක් වුනත් එච්චරයි. ඒ දේව සම්පත්තියට ඇලුම් කරල ඒකෙම ඇලිල ඉන්න කොට ඉන්න තැන අමතක වෙනවා. හරියට මේ ලෝකෙ ඉන්න කොට මිනිස්සු ගේ දොරට, වතු පිටිවලට කරන ඇල්ම වගේ. පින් දහම් කරල මහන්සියෙන් දෙව්ලොව ගියත්, එතනත් ඒ සම්පත්තියට ඇලුම් කරල, මරණින් පසු නැවතත් අපාගත වෙන්න පුළුවන්.

මහණෙනි, එසෙයින් ම **යම් සත්ව කෙනෙක් දෙව් ලොවින් චුතව දෙව් ලොව උපදිත් නම් ඔහු මඳහ. වැළි යම් සත්ව කෙනෙක් දෙව් ලොවින් චුතව නිරයේ උපදිත් නම් මොහුම බොහෝ වෙත්.** (නිය පිඬට ගත් පස් උපමාව මෙතනටත් අදාලයි.) (සංයුක්ත නිකාය 5-2 - 353 පිටුව <u>දේව චුති සූත්‍රය</u> )

මේ විදියට පිළිවෙලින් දෙවන, තුන්වන, හතර වන.... ආදී දේව චුති සූත්‍රවලත් සුගතිවල දුර්ලභත්වය පෙන්වා තියෙනවා. ඉතින් කොච්චර නම් භයානක තත්වයකද අපි ඉන්නෙ කියන කාරණය පැහැදිලියි . කෙනෙකුට හිතෙන්න පුළුවන්, ඉතින් කොහෙත්ම ගැලවීමක් නැද්ද කියල. මොකද නැත්තෙ. තථාගත ධර්මය තවම විවෘතයි, බැබලෙනවා. මුලින් පෙන්වපු සූත්‍රය (සංයුක්ත නිකාය 5-2 - 351 පිටුව - <u>මනුස්සචුති සූත්‍රය</u>) අවසානයේ බුදුන්වහන්සේම ඒකට හේතුව කියල තියෙනවා.

ඒ කවර හෙයින යත් : මහණෙනි, සිවු අරිසස් නුදුටු බැවිනි, කවර සිවු අරිසස් ද යත් : දුක්ඛ ආර්ය සත්‍යය, දුක්ඛ සමුදය ආර්ය සත්‍යය, දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය, දුක්ඛ නිරෝධගාමිණී පටිපදා ආර්ය සත්‍යයයි.

ඉතින් චතුරාර්ය සත්‍යය අවබෝධ කරගන්න තාක් ලෝක සත්වයාට සතර අපායෙන් ගැලවීමක් නෑ. වැඩිපුරම යන්නෙ එතනට කියල පැහැදිලියි. අපි උත්සාහ කරන්න ඕන කොහොම හරි ලෝකෝත්තර දහම් අවබෝධ කරගෙන වහ වහා මේ සසරින් ගොඩ යන්න. ඒ ගැලවීම හැර වෙන ගැලවීමක් නෑ. දුකෙන් මිදෙන්න, ලෝවැඩ සඟරාවේ එන මේ කවියත් හිතට ගන්න.

**කලකිනි බුදු කෙනෙකුන් උපදින්නේ**
**දුකකිනි මිනිසත් බව ලැබ ගන්නේ**
**මෙදෙකෙනි මෙ සසර දුක් දුර ලන්නේ**
**සුදනෙනි කිම වීරිය නොකරන්නේ**

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**ෆික්රි ඉස්මයිල්**
**පරිගණක ඉංජිනේරු - ගොතටුව**

**අභයරතනාලංකාරය - 20**

# නිවසකට සෞභාග්‍යය උදාකර දෙන්න මැණික් ගලකින් දෙවඟනක් මැවූ හැටි



*(පසුගිය කලාපයෙන් - භූමි පාළුවකින් සිදුවන විනාශය සම්බන්ධයෙන් සත්‍ය අත්දැකීමක්...)*

**- වහරක අභයරතනාලංකාර හිමි**

යම්කිසි සතෙක්ගෙ හෝ මනුස්සයෙක්ගෙ හෝ ශරීර කොටස්වල අළු යොදාගෙන කරන ජීවම්වලදී, ඒ සත්ව හෝ මිනිස් අංශු පරිගණක වගේ ක්‍රියාත්මක වෙලා, ඒ සතාගෙ හෝ මනුස්සයගෙ ගති ලක්‍ෂණ ක්‍රියාත්මක වෙන බව පෙර කළාපයකින් පැහැදිලි කරල තිබුණා. ඒ හා සමාන ක්‍රියාකාරීත්වයක් මැණික් ගල්වලටත් තියෙනවා. ඒ වගේ අත්දැකීමක් තමයි මේ විස්තර කරන්නෙ.

මම ගිහි කාලයේ අධ්‍යාත්මික ශක්තිය යොදාගෙන, යම් යම් කරදර බාධක යෙදිච්ච මිනිස්සුන්ට පිළියම් කරමින් හිටපු 1986/87 වගේ කාලයක තමයි මේ සිද්ධිය සිද්ධ වුනේ. අර කලින් කියපු වගේ මැණික් ගල්වල ශක්ති විශේෂයක් පිහිටනවා. ඒවායේ යම්කිසි නිදාගත්තු පුද්ගලයෙක් ඉන්නවා. (මැණික් ගල මළොත් ඒ පුද්ගලයා ඉවත් වෙනවා) ඒ පුද්ගලයා යම් කිසි ශක්තියකින් උද්දීපනය කළාම පරිගණක වගේ ක්‍රියාත්මක වෙන්න පටන් ගන්නවා.

දවසක් යම්කිසි කරදර බාධකවලට මුහුණ දුන් කෙනෙක්, ඊට යම් කිසි පිහිටක් බලාපොරොත්තුවෙන් මාව හමුවෙන්න ආවා. මූලික වශයෙන්ම ඒ අයගෙ ගෙදර දියුණුව අඩුයි කියල තමයි කිව්වෙ. ඒ කාලෙ කරපු ප්‍රයෝග සම්පත්තියකට අනුව ඒ සඳහා සුදු පාට මැණික් ගලක් අරගෙන එන්න කියල ඒ අයට මම දැනුම් දුන්නා. ඒක ගෙනත් දුන්නට පස්සෙ ඒ අය ඉදිරිපිටදීම මැණික් ගල අත උඩ තියාගෙන සෙත් කවිවලින් ඒකෙ ඉන්න යම්කිසි සත්වයෙක් නැගිට්ටෙව්වා. අඟල් 6 ක් විතර උසට ලස්සන දෙවඟනක් ඒකෙන් මතු වුණා. ඊට පස්සෙ ඒ ගෙදර ඉන්න අයට දියුණුවක් ඇති වෙන විදියට යහපතක් කරල දෙන්න කියල සෙත් කවිවලින්ම කිව්වා. එහෙම කරල ඒ ගෙදර අයටත් මෙහෙම උපදෙස් ටිකක් දුන්නා. ''මේ මැණික් ගලේ මෙහෙම කෙනෙක් ඉන්නවා. එයාට හඳුන්කූරක් දවස ගානෙ පත්තු කරන්න. වෙන මුකුත් ඕන නෑ. එහෙම පත්තු කරල හය මාසයක් යනකොට ලස්සන ගෑණු ළමයෙක් ඇස් දෙකට පේන්නම එයි. හැබැයි එහෙම ආව කියල ඒ පුද්ගලයට බය වෙන්න එපා. රෝස පාටට හුරු කට්ට තුනක් තියෙන ගවුමක් ඇඳපු කෙනෙක් තමයි ඒ විදියට එන්නෙ. එහෙම එන්නෙ මේ ගලට අධිපතිව ඉන්න දෙවඟනක්.'' මේ විදියට එන හැටිත් කියල, ආවට බයවෙන්න එපා කියලත් මම ඒ අයට කිව්වා.

මේ කිව්ව විදියට කටයුතු කරන කොට ඒ අයට තිබිච්ච කරදර ඔක්කොම ක්‍රමයෙන් අඩු වෙන්න පටන් ගත්තා. මෙච්චර කාලයක් හිරවෙලා තිබිච්ච ණය ගෙවාගන්න පුළුවන් වුණා. ගෙදර තිබිච්ච අනෙක් ප්‍රශ්නත් අඩු වුණා. මේ වෙන කොට මාස 6 ක් විතර ගිහින් තිබුණා. මේ ගෙදර හිටියෙ අම්මයි තාත්තයි දුවල දෙන්නයි. තාත්ත වෙළඳ සැලේ ඉඳල ගෙදර එනකොට රෑ වෙනවා. එතකල් අනෙක් අය ගෙදරට වෙලා ඉන්නවා. දවසක් හවස් වෙලාවක මේ ගැහැණු ළමයි (දූවරු) දෙන්නගෙන් එක් කෙනෙක් තම මව සමඟ වත්ත පහළ ළිඳට වතුර ගේන්න කියල ගිහින් තිබුණා. ඒ අතර ගෙදර හිටපු අනෙක් ළමය ගේ ඇතුලෙදි දැක්ක, ශරීරයක දණින් ඉහළ ලස්සන ගැහැණු ළමයෙක්ගෙ රූපයක්. දැකල බයවෙලා කෑ ගහල ඉක්මනට එන්න කියල තමන්ගෙ අනෙක් සහෝදරියටත් කතා කළා. ඇයත් දුවගෙන ආවා. හැබැයි බයට දැක්ක දේ කිව්වෙ නෑ. ඊට පස්සෙ ඒ දවසෙම රෑ අනෙක් ළමයත් කෑ ගැහුව, ඉනෙන් පහළ ලස්සන ගවුමක් ඇඳ ගත්තු ගැහැණු ළමයෙක්ගෙ හැඩරුවක් දැක්ක කියල. එහෙම කෑ ගහල තමන්ගෙ අනෙක් සහෝදරියගෙන් ඇහුවා, උඹ කෑ ගැහුවෙ මොකද කියල. මමත් ඒ වගේ දෙයක් දැක්ක කියල ඒ අයත් කිව්වා. මේ දෙන්නම එකම දවසෙ සමාන හැඩරුව තියෙන ගැහැණු ළමයෙක් මේ විදියට දැක්කා. දැන් ඒක දැක්කට පස්සෙ රෑ එළිවෙනකල් ඒ අයට නින්දක් නෑ. බයට ඇහැරිල හිටියා. තාත්තට නිදාගන්නත් නෑ. මොකද ඒ මනුස්සයත් දවසෙම වැඩ කරල මහ රෑ ගෙදර ඇවිත් හිටියෙ. අර දැකපු සිද්ධිය නිසා රෑ එළිවෙනකල් නිදාගන්න බයේ කතා කර කර හිටියා. ඊට පස්සෙ මේ අයට මම අර කලින් කියපු කතාව මතක් වුණා. ''අර අයිය කිව්වනෙ අපිට කට්ට තුනක් තියෙන ගවුමක් ඇඳගත්තු කෙනෙක් එයි කියල. හනි හනිකට උදේම ඕක ගිහින් දීල කියපන් ඒක නතර කරල දෙන්න කියල''. මෙහෙම කියල ඒ අය එළිය වැටෙනකොට පාන්දරින්ම අර මැණිකත් අරන් මාව හමුවෙන්න ආවා. ඇවිල්ල අර කතාව කියල, අනේ කොහොම හරි මැණික තියාගෙන ඒ අය එන එක නතර කරල දෙන්න කියල කිව්වා. මම කිව්ව, ඉතින් බය නැතිව ඕක තියාගන්න, ඔයගොල්ලන්ට කරදරයක් වුණේ නෑනෙ කියල. අනේ එපා, මැණික් ගල ඕනත් නෑ අපි යනව යන්න, කොහොම හරි ඕක නතර කරල දෙන්න කියල ඒ අය නැවතත් බැගෑපත් වුණා. මේ අය බය වෙච්ච නිසා මමත් ඉතින් ඒ ගල ආපසු අතට අරගෙන ඒකෙ ඉන්න පුද්ගලයට නිදාගන්න කියල සෙත් කවියෙන්ම කිව්වා. ඊට පස්සෙ ඒ දෙවඟන නැවතත් ඒ මැණික් ගලට ඇතුල් වුණා.

නමුත් මේ වෙච්ච සිද්ධිය මේ ගෙදර අයට හරියට තේරුම් ගන්න බැරි වුණා. මේ මැණික් ගල සෞභාග්‍යය ඇති කරන දෙයක්. අර විදියට ඒකට සෙත් කළාම ඒකෙ ඉන්න පුද්ගලය කතා කරන්නත් පටන් ගන්නවා. ඊට පස්සෙ ඒ ගෙදර අයට හදිසි කරදර වෙනකොට ඒ ගැන බලනවා, උදව් කරනවා. මේ තමයි ඒකෙ ක්‍රියාකාරීත්වය. මෙතනදී ☞

ඇත්තම දෙවඟනක් ඒ ගලට සම්බන්ධ වෙනවා. ඒක මොකක්ද කියල කියන්න බැ. දෙවඟනක් පස්සෙ සම්බන්ධ වුණාද දන්නෙත් නෑ. කොහොම හරි ඒක පරිගණකයක් වගේ වැඩ කරන්න පටන් ගත්තා. ඒකෙ තියෙන ශක්තිය නඟා හිටවන්න පුළුවන්. හැම කෙනෙක්ගෙම චිත්ත ශක්තියේ පොදු ස්වභාවයක් තියෙනවා. පටිච්ච සමුප්පන්නව ලෝකයේ සිද්ධ වෙන අපූරු නිපැයුම් තමයි මේ. මේ මැණික් හටගන්නෙත් නිකන් නෙවෙයි. මැණික කියන වචනය කාන්තාවන්ට පාවිච්චි කරන්නෙත් මැණිකක් හා සමානයි කියන අදහසින්. ඒ කියන්නෙ චරිතය හරි පිරිසිදුයි. ඒ වගේම හැඩ වැඩයි ලස්සනයි ඔක්කොමත් තියෙනවා. ඒ ගති ලක්ෂණ තමයි අර මැණික කියන වචනයට සම්බන්ධ වුණේ. මැණික් අතරින් කොටසක සම්බන්ධය තියෙන්නෙ ප්‍රධාන වශයෙන් කාන්තාවන්ගෙ අන්න ඒ පිරිසිදු ගති ලක්ෂණයට. මැණිකෙ, සුදු මැණිකෙ ආදී නම්වලින් හඳුන්වන්නෙත් මේ නිසා. හැබැයි මේ කියන්නෙ අසීලාචාරව හැසිරෙන කාන්තාවන් ගැන නෙවෙයි. මැණික කියන වචනය ඒ අයට ගැලපෙන්නෙ නෑ. කොහොම හරි මේ ගැබ්වෙලා තියෙන ශක්තිය යම් යම් ක්‍රමවලින් ප්‍රබෝධ කරල ගත්තම සම්පූර්ණ පුද්ගලයෙක් වගේ ක්‍රියා කරනවා.

මේ කාරණය පෙන්වා දුන්නෙ මේ විශ්වයේ අපිට නොපෙනෙන බොහෝ ගුප්ත පැතිකඩවල් මේ වගේ විවිධාකාරයෙන් තියෙන බවත්, ඒවායින් මනුස්සයන්ගෙ යහපැවැත්මට, දියුණුවට යම් යම් ඵල ප්‍රයෝජන ගන්න පුළුවන් බවත් පෙන්වා දෙන්න.

මැණික් සම්බන්ධයෙන් නොවුණත් මේ කියන්න යන්නෙ, අමනුස්ස පුද්ගලයන්ගෙ සම්බන්ධය උඩ යම් යම් භාරහාර වෙලා, පොරොන්දු ඉෂ්ට නොකරන විට ඇති වෙච්ච සිද්ධියක්. ඒ කියන්නෙ කවුරුහරි ගිහින් යම්කිසි දේවාලයක තමන්ට වෙච්ච කරදරයක් කියල භාරයක් පොරොන්දු වෙනකොට ඒක ඉෂ්ට වෙන ක්‍රමයක් මේ ලෝකයේ තියෙනවා. දඩිමුණ්ඩ, වීරමුණ්ඩ, කඩවර, කාලි, කළුකම්බිලි....... ආදී වශයෙන් හඳුන්වන බලවත් දේව හා යස්ස කොට්ඨාශ ලවා තමයි මෙතනදී ඒ වැඩේ සිද්ධ කර ගන්නෙ. (මේ ගැන පැහැදිලි කිරීමක් හෙළ බොදු පියුම 18 වන කළාපයේ ''ඉනා බන්ධන හා වශී ගුරුකම් ආදියෙන් ලෙඩ රෝග කරදර ඇති වෙන හැටි'' යන මාතෘකාව යටතේ පළ වුණා.) ඒ වගේ බලවත් උදවිය තමන් ඉදිරියේ යම් කිසි කෙනෙක් භාර වෙනකොට මොකද කරන්නෙ, ඒ භාරය අරගෙන හොඳින් හෝ නරකින් ඒ කාරණය ඉෂ්ට කරල දෙන්න, තමන් යටතේ ඉන්න යක්ෂ, අමනුස්ස ආදීන්ට අණ කරනවා. හැබැයි ලෝක සම්මතයේ පවතින සාධාරණ ඉල්ලීම් විතරයි එහෙම ඉෂ්ට කරල දෙන්නෙ. සමහර වෙලාවට ලෝක සම්මතයේ වැඩේ සාධාරණ වුණත් ධර්මයට නොගැලපෙන්න පුළුවන්. උදාහරණ විදියට කෙනෙක් තමන්ට නිකරුණේ කරදර කරන



පුද්ගලයෙකුගෙ අතක් පයක් කඩල දාන්න කියල ඒ වගේ භාරයක් වෙන්න පුළුවන්. ඒක ලෝක සම්මතයේ සාධාරණ විදියට පෙනුණත් ධර්මානුකූලව මහා නීච වැඩක්.

කොහොම හරි මේ වගේ භාරයක් වෙච්ච සිද්ධියක් මට ඒ කාලෙ දැනගන්න ලැබුණා. එක්තරා පුද්ගලයෙකුගෙ භාර්යාවකට රට යන්න ඕන වෙලා යම් කිසි දේවාලයකට භාරයක් වුණා. ඒ දේවාලයේ කළුකම්බිලි කියන දේවතාවෙකුගෙ සම්බන්ධයක් තිබුණා. භාරය වෙන කොට දේවාලයේ කපු මහත්තය කියල තිබුණා, අහවල් දවස වෙනකොට වැඩේ හරි යයි ඊට පස්සෙ මේ විදියට භාරය ඔප්පු කරන්න කියල. එහෙම කියල ඒකට දිනයකුත් දුන්නා. ඒ වෙලාවෙදි ඒ පුද්ගලයා ඒ ගැන මුකුත් ප්‍රශ්න කළෙත් නෑ. කොහොම හරි වැඩේ හරි ගියා. නමුත් ඊට පස්සෙ ඒ පුද්ගලයා භාරය ගණන් ගන්නෙ නැතිව නිකම් හිටියා. ඒ කියන්නෙ ඔප්පු කරන්න යන්න තියෙන දිනයට කලින් ඉඳලම ඒ ගැන නොසලකා හැරල තිබුණා. මේ බව දැනගත්තු යම් කිසි කළුපාට අත්භූත බලවේගයක්, දවසක් මේ පුද්ගලයගෙ ගේට්ටුව ඉදිරිපිට බලාගෙන ඉඳල, හෙටයි දිනේ කියල යන්න ගියා. ඒ අමනුස්ස වේසෙන් හිටපු කළු පාට කෙනාව දැකල අර පුද්ගලයගෙ ඇඟ හිරිවැටිල බය වුණා. මේ මනුස්සයට රත් වෙලා මතක් වුණා, මේ කළුකම්බිලි නේද කියල. පස්සෙ මනුස්සය මොකද කළේ, ඊට පහුවදාම පොරොන්දු වෙච්ච මුදලුත් අරගෙන පූජා වට්ටියක් එක්ක තියල භාරය ඔප්පු කළා. ඒත් එක්කම අර කපු මහත්තය ආවේසයෙන් කිව්වා, තව විනාඩි 5 ක් පරක්කු වුණානම් තොගෙ ගේත් ඉවරයි ගිහින් බලාපිය කියල. මොකද භාරය ඉෂ්ට කරන්න දීපු දවස ඉවර වෙන්න තවත් විනාඩි 5 යි තිබිල තියෙන්නෙ. මේ මනුස්සය භාරය ඔප්පු කරල ගෙදර ඇවිත් බලන කොට ගෙයි කුස්සියෙ පොල් අතු 5 ක් පිච්චිලා තිබුණා. ඒක පිච්චෙන කොට අවට හිටපු මිනිස්සු දැකල හනිකට නිවල තිබුණා. තව පොඩ්ඩක් ගියානම් මුළු ගෙදරම ගිනි ගන්නවා. අපි හිතන්නෙ නැතිවට මෙහෙම බලවේග මේ විශ්වයේ ක්‍රියාත්මක වෙනවා. හොඳ නරක දෙකටම මේ වගේ තමයි. හරියට මේ මනුස්ස ලෝකය වගේමයි. සමහර මනුස්සයො තමන්ගෙ කාරණා ඉෂ්ට සිද්ධ කරගන්න සමාජයේ ඉන්න යම් යම් දාමරික කල්ලිවලට මොනව හරි දීල තමන්ගෙ වැඩ භාර දෙනවා. ඒ අයත් භාර දුන්න වැඩේ කරල දෙනවා. හැබැයි වැඩේ කළාට පස්සෙ පොරොන්දු වෙච්ච ගාන දුන්නෙ නැත්නම් මොකද වෙන්නෙ ? දැන් අර පොරොන්දුව වෙච්ච පුද්ගලයා අනතුරේ. මෙන්න මේ වගේ ගුප්ත ලෝකයෙත් යම් යම් දරුණු යක්ෂ අමනුස්ස කොටස් මගින් වැඩ කර ගන්න ක්‍රම තියෙනවා. ඒවට සම්බන්ධ වුණොත්, ඒවායේ ප්‍රතිඵලවලටත් තමන්ටම කර ගහන්න වෙනවා. මේ රටේ ලෝකයේ අපි නොහිතන ගුප්ත පැති ක්‍රියාත්මක වෙන බව පෙන්වා දෙන්න තමයි මේ වගේ කාරණා හෙළි කළේ.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

සටහන
නීතිඥ චන්දන සිරිවර්ධන

# ශරීරගත සියලූ වස විස නසන ප්‍රත්‍යක්ෂ ඖෂධයක්...

රක්ත උෂ්ණය හෝ යම් උෂ්ණාධික ආහාර පාන නිසා හට ගන්නා ආබාධයන් හා වස විස කැවීම් ආදිය නිසා හට ගන්නා ආබාධයන් සමනයටත්, ගෝනුස්සන් පත්තෑයන් ආදී සතුන් දෂ්ට කිරීමෙන් ශරීර ගත වූ විස ඉවත් කිරීමටත්, කන බොන ආහාර පානවලින් දිනපතා ශරීරයට ඇතුළු වන වස විස ඉවත් කිරීමටත් ඉවහල් වන බොහෝ ප්‍රත්‍යක්ෂ අත්දැකීම් සහිත, වහරක අභයරතනාලංකාර හිමියන් සමාධියෙන් දුටු ප්‍රතිකර්මයක් තමයි මේ ඉදිරිපත් කරන්නේ.

වර්තමානයේ මනුස්සයින්ගේ ශරීරයට කන බොන ආහාරවලින් ඇතුළු වන වස විස නිසා වෛද්‍ය විද්‍යාවට පවා හසු නොවන විවිධ රෝගාබාධයන් හට ගන්නා බව හෙළ බොදු පියුම දහම් සඟරාවේ 14 වන කලාපයෙන් පැහැදිලි කළා. ඒ වගේ රෝගයන් සහ විශේෂයෙන් අද කාලයේ අධික කෘෂි රසායන භාවිතය නිසා ඇති වන වකුගඩු ආබාධවල ආරම්භය පවා බොහෝ දුරට මේ ප්‍රතිකර්මයෙන් සුව කරගන්න පුළුවන්. මේ අනුව සියලු වස විස කැවීම්, ශරීරගත වීම් ආදියට මේ ප්‍රතිකර්මය ප්‍රත්‍යක්ෂයි, ඉතා හොඳයි.

මේ සඳහා යොදාගන්නේ ගොටුකොළ මිටවල් දෙකක් (අහුරු 02ක්) සහ කෝමාරිකා පිති කැබැල්ලක්. මෙතන දී ගම්වල හැදෙන ගම් ගොටුකොළ හෙවත් හීන් ගොටුකොළ ගන්න පුළුවන් නම් ඒක විශේෂයි. ඒ වගේ ගම් ගොටුකොළ නම් මුල් සමග මුළු වැලත් එක්කම යොදාගන්න පුළුවන්. එහෙම නැත්නම් කොළ විතරක් යොදා ගන්නත් පුළුවන්. ලැබෙන හැටියට මේ මොන විදියට ගත්තත් කමක් නෑ. මේ විදියට ගොටු කොළ අහුරු දෙකයි, කෝමාරිකා පිති කැබැල්ලයි හොඳින් සෝදා ගෙන ඒ දෙකම එකට කොටා (හෝ බ්ලෙන්ඩර් කර) ඉස්ම අරගෙන, අවශ්‍ය ප්‍රමාණයට වතුර පොඩ්ඩක් දමා ලුණු බිංදු දෙක තුනක් එකතු කර උදේ හවස අමුවෙන්ම බොන්න ගන්න පුළුවන්. මෙතනදී ලුණු පොඩ්ඩක් එකතු කරන්නේ නිකන් බොන්න අප්‍රිය නිසා. හැබැයි වැඩිය එකතු කරන්න හොඳ නෑ. මේ නිසා කෙනෙකුට ලුණු නැතිව බොන්න පුළුවන් නම් ලුණු නොදැම්මත් ගැටළුවක් නෑ. දැන් මේ හදාගත් ඖෂධය





පාවිච්චි කරන්න කියල විශේෂ කාල සීමාවක් නෑ. සතියක් දෙකක් හෝ අසනීපයේ හැටියට ඕනෑම කාලයක් පාවිච්චි කරන්න පුළුවන්. කොච්චර කාලයක් පාවිච්චි කළත් අතුරු ආබාධ හෝ අපත්‍යයක් ඇති නොවන නිසා නිකන් ගත්තයි කියලත් කිසිම ගැටළුවක් නෑ. පාවිච්චි කරන්න කියල නියම වෙලාවකුත් නෑ. කොහොම හරි දවසකට දෙවරක් ගත්තම ප්‍රමාණවත්. ඊට වැඩි වුනයි කියල හෝ හදිසියේ වේලක් ගන්න බැරි වුනයි කියල හෝ ගැටළුවක් නෑ. අවස්ථාව ලැබෙන හැටියට ලොකු කුඩා කාටත් පාවිච්චි කරන්න පුළුවන්. පහසුවෙන් හදාගන්නත් පුළුවන්.

මෙතනදී කෝමාරිකා කියන වචනයේ පද නිරුක්තිය ගත්තොත් කෝමාරිකා= කුමාරිකා = කු + මාරිකා. ''කු'' කියන්නේ පහත් දේවල්. මාරිකා කියන්නේ (මාරක්ෂය) මරණය කරා ගෙනියන දේවල් ක්ෂය කිරීම. ඒ අනුව මරණයට පත් කරන්නා වූ පහත් දේවල් හෙවත් අපද්‍රව්‍ය ක්ෂය කරල විනාශ කරල දැමීමක් තමයි කෝමාරිකාවලින් සිද්ධ කරන්නේ.

දැන් මේ කියන ඖෂධයේ ප්‍රත්‍යක්ෂ බව සම්බන්ධයෙන් විස්වාසයක් ඇති වෙන්න, වහරක අභයරතනාලංකාර හිමියන්ගේ පෞද්ගලික අත්දැකීමක් උන්වහන්සේගේම වචනවලින් මේ විදියට සටහන් කෙරෙනවා.

''මට ඇති වෙච්ච එක්තරා අසනීපයකට රත් නිටුල් මිශ්‍ර සිංහල කසායක් එක්තරා වෙද මහත්තයෙක් විසින් ලබා දුන්නා. මේ රත් නිටුල් කියන්නෙ රතු පාටට හුරු කොල තියෙන නිවිති වගේ වැල් වර්ගයක්. හැබැයි මේ රත් නිටුල් අධික සැර බෙහෙතක්. මේ නිසා ඒක පාවිච්චි කරන කොට පොල් කිරි හෝ එළ කිරිවලින් පැය බාගයක් විතර තම්බල, හෝදල විස මරල තමයි ගන්න ඕන. නමුත් අතපසු වීමකින් ඒක එහෙම නොකර අමුවෙන් නිකම්ම කසායට දාල දුන්නා. වේල් දොලහක් ඉවර වෙන කොට රත් නිටුල් විසට මුළු ඇඟම රත් වුනා. ඒක මැරෙන්න තරම් සැරයි. ඒ සැර ඉවත් කරන්න වෙනත් කිසිම දේකින් බැරි වුනා. අන්තිමට ගොටුකොළ එක්ක කෝමාරිකා එකතු කරල හදා ගත්තු මේ බේතෙන් තමයි ඒ විස සමනය වෙලා ජීවිතය බේරුනේ.''

**සටහන:**

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# අපට නොපෙනෙන ලෝකය දහම් ඇසින්...

9 වන කොටස

මේ ලිපි පෙල පටන් ගත්තු මුල් කාලයේ තිස් එක් තලය ගැනත්, දස දහසක් සක්වල ගැනත් යම් පමණකට කරුණු හෙලිදරව් කළා. දැන් මේ විස්තර කරන්නේ ඒ වගේ තිස් එක් තලයන් අඩංගු සක්වලවල් 3 ක් අතරේ පිහිටි මහා භයානකම අපායක් ගැන. ඒ තමයි ලෝකාන්තරික නරකය. ලෝක තුනක් අතරට ඇතුලත් වුණා කියන එක තමයි මේකෙන් අදහස් කරන්නේ. මේක තදබලම ඝන අන්ධකාරයෙන් වැසුණු අපායක්. මේ පෘථිවියට භෞතිකව සම්බන්ධ නෑ. සත්වයන් ඉපදෙන තල තිස් එකක් තමයි එක සක්වළක් කියන්නේ. ඒ වගේ සක්වළවල් 3 කට එක බැගින් මේ ලෝකාන්තරික නරක පිහිටනවා. මේ විශ්වයේ පිහිටන අපායවල්වලින් ආයු කාලය වැඩිම, ඒ වගේම ලේසියෙන් නිදහස් වෙන්න බැරි මහා භයානකම අපාය තමයි මේ. ඒකටත් හේතුවක් තියෙනවා.

මේ ලෝකයේ ජීවත් වෙලා ඉඳිද්දී දස වස්තුක මිත්‍යා දෘෂ්ටියේ හෙවත් නියත මිත්‍යා දෘෂ්ටියේ එල්බගෙන මෝහාන්ධකාරයේ ගිලී හිටපු අය තමයි මෙතැන ගිහින් උපදින්නේ. **කෙනෙක් මේ ලෝකයාට, හරයක් නැති වෙන විදියට වටිනා ධර්මය වහල දැම්මම ඒ පුද්ගලයටත් ඒකෙ විපාකය විදියට මහා ඝන අන්ධකාරය සහිත කිසිම දෙයක් නොපෙනෙන අපායක උප්පත්තිය හිමි වෙනවා.** විශේෂයෙන් උච්ඡේදවාදයටම තමයි මේක අයිති වෙන්නේ. ඒ අය සමාජයේ ජීවත් වෙනකොට මේ විදියට තමයි හිතන්නෙ කියන්නෙ. ''කොච්චර සත්තු මැරුවත් පව් නෑ. ඕව බොරු කතා. බොරු කිව්ව කියල පව් නෑ. කාම මිථ්‍යාචාර වගේ ඒවට කිසිම පාප සම්බන්ධයක් නෑ. හොර මැර වංචා කළාට කිසිම පාපයක් නෑ. ඒවාට විපාක නෑ. දන් දුන්නට කිසිම වැඩක් නෑ. විශේෂයක් නෑ. සිල් රැක්කට බණ භාවනා කළාට කිසිම වැඩක් නෑ. පිං පව් කියල දෙයක් නෑ. මරණින් මතු උපතක් නෑ. ලෝකයේ සත්‍යය යථාර්ථය දත් ශ්‍රමණ බ්‍රාහ්මණ කියල කොටසක් නෑ. අම්ම තාත්ත කියල විශේෂ පුද්ගලයන් නෑ. ඔක්කොම එකයි.....'' මෙන්න මේ විදියට දෘෂ්ටිවල දැඩිව එල්බ ගන්නවා. ඒක උපාදානය කර ගෙන ධර්ම විරෝධීව කටයුතු කිරීමෙන් මැරිල ගිහින් ලෝකාන්තරික නරකයේ උපදිනවා.

මේ ලෝකාන්තරික නරකයේ කිසිම ආලෝකයක් නෑ. තදබලම ඝන අන්ධකාරය විතරයි තියෙන්නෙ. ලෝකය අන්ධ කළාම, හේතුවට අනුකූල ඵලය තමයි ඒ. එකිනෙකාට එකිනෙකා පේන්නෙ නෑ. තමන් ඉන්නෙ කොහෙද කියලවත් තමන්ටම පේන්නෙ නෑ. ආයුස කොච්චර ද කියල හිතාගන්නත් බෑ. ලෝක විනාශයේ දී අනෙක් ලෝක ඔක්කොම විනාශ වුණත්



මේක විනාශ වෙන්නෙ නෑ. ආහාරය කර්ම ශක්තියෙන්මයි මැවෙන්නෙ. කය පවතින්නෙත් කර්ම ශක්තියෙන්මයි. වටපිටාව කිසිම දෙයක් පේන්නෙ නෑ. තද කළුවරේ ඉන්නකොට සම්පූර්ණ බය විතරයි හිතට එන්නෙ. ඒක විශාල බයක්. අපි වුණත් තද කට්ට කළුවරේ තනියම සැහෙන වෙලාවක් ඉන්නකොට හිතට විශාල බයක් අසහනයක් දැනෙනවා. ඒ වගේ තමයි මෙතැනත්. හැබැයි කල්ප ගණන් ඉන්න වෙනවා. නමුත් ලොව්තුරා බුදුවරයන් වහන්සේ නමක් පහළ වෙන වෙලාවට විතරක් උන්වහන්සේගෙන් විහිදෙන ආලෝකයෙන්, තමන් වගේ තවත් අය ඉන්නවයි කියන කාරණය වැටහෙනවා. එහෙම වෙලාවට විතරයි ඒ අයගෙ හැඩරුව මෙහෙමයි කියල ඒ එන ආලෝකයෙන් දකින්නේ. ඒ ආලෝකය ක්ෂණයකින් ඇවිත් බොහොම ටික වෙලාවයි පවතින්නේ. ක්ෂණයකින්ම යනවා. ඒවගේ වෙලාවකට යම්කිසි හේතු වාසනාවක් තිබිල ඒ ගැන පැහැදිලා, ඒ ලෝකාන්තරික නරකයෙන් මිදුණොත් හැරෙන්න, එහෙම නැත්නම් ඒකට හිමි කර්ම ශක්තිය ගෙවිල ඉවරවෙන කල්ම ඉන්න වෙනවා. අන්ධකාරය තමයි එහේ තියෙන දුක.

දැනට විද්‍යාඥයන් කලු කුහර (Black Hall) කියල හඳුන්වන්නෙ මේ ලෝකාන්තරික නරකයන්. මේවා කළු පාට වෙන්නත් හේතුවක් තියෙනවා. මෝහය බලවත් වෙලා මෝහාන්ධකාරයෙන් වෙලිල හිටියම සම්පූර්ණයෙන්ම කළු පාටයි. එතකොට නියත මිථ්‍යා දෘෂ්ටි ගතිකයෙක් මෝහාන්ධකාරයෙන් සම්පූර්ණයෙන්ම වෙළිල ඉන්න නිසා චුත වෙන කොට මුළු ඕරා වළල්ලම කළු පාටයි. යථාර්ථයෙන් බැලුවොත් මේ කලු කුහර කියන ඒවා ලෝක විනාසෙදිවත් විනාස වෙන්නෙ නෑ. විනාස වෙනව නම් විනාස වෙන්නෙ කවදා හෝ ලෝකාන්තරික නරකයේ ඉන්න සත්ව කොටස් සියල්ලම කර්ම විපාක ගෙවිල චුත වෙච්ච දවසට. නමුත් විද්‍යාවෙන් මේ කලු කුහර කියල හඳුන්වන්නෙ විනාස වෙච්ච සක්වළවල්වලට. නමුත් ඒක ඇත්ත නෙවෙයි. මේ වගේ කලු කුහර මේ අනන්තාපරිමාණ සක්වලේ හුඟක් තියෙනවා. දස දහසක් සක්වළ ගත්තොත්, ඒ දසදහසක් සක්වලේ සක්වළ තුනකට එක බැගින් පිහිටනවා. එතකොට ඒක විශාල ප්‍රමාණයක්. ඒක පොළව යට නෙවෙයි තියෙන්නෙ, සක්වළවල් අතරේ. ඒ සක්වල තුනේම ඉන්න අර වගේ නියත මිථ්‍යා දෘෂ්ටියේ එල්බ ගෙන මෝහාන්ධ-කාරයේ ගිලී හිටපු මිනිස්සු තමයි ඒකෙ ගිහින් උපදින්නේ.

ඊළඟට අද කාලයේ නොපෙනෙන ලෝකය ගැන කතා කරන කොට, කතා නොකරන තවත් පැත්තක් තමයි කාන්තාර. මේවා මනුස්ස ලෝකය තුළ දකින්න ලැබුණත්, ඒවා හැදෙන්නෙ කොහොමද කියන කාරණය සම්බන්ධයෙන් භූගෝල විද්‍යාත්මකව කරන පැහැදිලි කිරීම් හැරෙන්න දහම් ඇසින් කෙරෙන විග්‍රහයන් අහන්න ලැබෙනවා බොහොම අඩුයි. මේ කාන්තාරය කියන වචනයේ

නිරුක්තිය ගත්තම ක + අන් + තර හෙවත් කළු ආහාර තර වෙච්ච තැන කියන අර්ථය තමයි එන්නේ. කළු ආහාර කියන්නෙ පාප ධර්ම. මේ වගේ කාන්තාර ඇතිවෙන්න බොහෝවිට ඍෂිවරුන්ගේ සාපය මුල්වෙලා තියෙනවා. ඒක බුද්ධ දේශනාවෙත් සඳහන් වෙනවා. හැබැයි ඍෂිවරුන්ගෙ සාප කියන්නෙ අනෙක් අය වගේ ද්වේශ සහගත හිතකින් පිටකරන වචන නෙවෙයි. යම්කිසි කෙනෙක් බලවත් අසාධාරණයක් කළොත්, එහි තියෙන ස්වභාවය මෙනෙහි කරල, මේක මෙබඳු ගිනි ගන්න අපරාධයක් කියල ඒ විදියට සිහි කරල ප්‍රකාශකරන කොටම ඒක ඉෂ්ට වෙනවා. එතකොට මුළු පළාතක්ම දැවිල පිච්චිලා යනවා. ඒ දැවී යාම අවුරුදු දහස් ගණනාවක් හෝ කප පවතින කල් තියෙන්න පුළුවන්. ඒක කර්ම ශක්තියේම ක්‍රියාවලියක් මිසක් වෙන සාපයක් නෙවෙයි.

ඒ වගේ සාප කිරීමක් නොවුණත් මේ කාරණය උදාහරණයකින් පැහැදිලි කළොත්, බෝසතාණන් වහන්සේ පෙරුම් පුරන කාලයේ එන නලපාන ජාතකයේ දී, වතුර බොන්න බට කපල හදා ගත්තු ඒ බටවල පුරුක් නැතිව ගියා. මේ නිසා එයින් බටයක් කඩා ගත්තම දියට බහින්නෙ නැතිව පැත්තක් දියට දාලා අනික් පැත්තෙන් වතුර බොන්න පුළුවන් වුණා. ඒ බට වර්ගයේ හැටි. එදා ඉඳන් ඒ කල්පය තියෙනතුරුම ඒ බටවල පුරුක් හැදුණෙ නෑ. දිය රකුසන්ගෙන් බේරෙන්න මගේ පිරිසට විලට බහින්නෙ නැතිව වතුර බොන්න මග පෑදේවායි කියල අධිෂ්ඨාන කළාම තමයි මේක සිද්ධ වුණේ. බෝසතාණන් වහන්සේලාට බලවත් කර්ම විපාක සෘද්ධි ඇති නිසා මේ වගේ දේවල් සිද්ධ වෙනවා. ඒ එක අත්භවයක වෙච්ච සිද්ධියක්.

ඒ වගේම එක්තරා මෑත කාලයක හිටපු එක් යෝගීවරයෙක්, අපි කටු නැතිව ජීවත් වෙමු, අපිට කටු හොඳ නෑනෙ කියල පතොක් ගහකට නිතර නිතර කියන්න පටන් ගත්තලු. දවස් ගණනක් එහෙම කියාගෙන යනකොට පතොක් ගහේ කටු ඔක්කොම හැලිල ගියාලු. ඊට පස්සෙ ඒ පරපුරෙන් එන පතොක් ගස්වල කටු නැති වුණාලු. ඒක යෝගීවරයෙක් කරපු වැඩක්. ඒක, එහෙම කතා කරනකොට ඇති වෙච්ච ශක්ති විශේෂයකින් වෙච්ච දෙයක්.

මේ විදියට ආදරයෙන් කියන ක්‍රම වගේම බැනල කියන ක්‍රමත් තියෙනවා. හොඳින් හෝ නරකින් කියන ක්‍රම දෙකෙන්ම මේක සිද්ධ වෙන්න පුළුවන්. හැබැයි සමහර ශාකවලට හොඳින් කියල හරියන්න පුළුවන් වුණාට සමහරක් ඒවාට ඒ ක්‍රමය හරියන්නෙ නෑ. ඒ වගේම හොඳින් කියල හරියන ශාකවලට නරකින් කියල හරියන්නෙත් නෑ. සමහර ශාකවලට නරකින් කිව්වම හරියනවා. උදාහරණ විදියට කිතුල් මල් කපල රා ගන්න සමහර මිනිස්සු, රා නැති වුණාම හෙට වෙන කොට රා තිබුණෙ නැත්නම් දෙකට කඩල දානව කියල කිතුල් ගහට පයින් ගහල පරුෂ වචනයෙන් බැනල යනවා. ඊට පහුවදා රා තියෙනවා. කිතුල් මල් කපන සමහර උදවිය මේ වැඩේ කරනවා.

ඒ වගේම සමහර ගස්වල ගෙඩි හැදෙන්නෙ නැති වෙනකොට, නිතර වඳවෙලා තියෙනකොට ඒවාට එහෙම බනිනවා. සමහරු ඉලපොතක් අරගෙන ගහට තඩිබානවා, තෝ ගෙඩි හැදුවෙ නැත්නම් දෙකට කඩල දානව කියල. එහෙම කතාවක් මීට අවුරුදු කිහිපයකට උඩ දී එක්තරා ගමක සිද්ධ වුණා. ඒ ගමේ ගුරු මහත්තයෙක්ගෙ ගෙදර ගෙඩි හැදෙන්නෙ නැති අලිගැටපේර ගහක් තිබුණා. ඉතින් මේ ගුරු මහත්තයා මොකද කරන්නෙ වටපිට බලල ගෙදර කවුරුවත් නැති අතරේ මේ වැඩේ කරනවා. දවසක් ඒ ගුරු මහත්තයගෙ නෝන මේක හැංගිලා බලන් හිටියා. ඒ විදිහට ඒ අලිගැටපේර ගහට පරුෂ වචනයෙන් බනිනව දැකල මේ නෝනා විගහට අවට හිටපු මිනිස්සුන්ට, මහත්තයට පිස්සු හැදිලයි කියල මහ සෙනගක් ගෙදරට එක්කගෙන ආවා. සෙනග එනකොට මේ ගුරු මහත්තයා ගහට අත දික්කරගෙන පතුරු යන්න බනිනවලු. කවුරුවත් කතා කළාට කතා කරන්නෙත් නෑ. දිගටම බැණගෙන යනවලු. මොකද ඒක කෙමක් කියල.



මේ කාරණය අපේ සමාජයේ මිනිස්සු අතරත් දකින්න තියෙන දෙයක්. කෙනෙකුට බොහොම හොඳින් වැදගත් විදියට කතා කළාම වැඩක් කරල දෙනවා. හැබැයි සමහරක් උදවියට එහෙම හොඳින් කතා කරල හරියන්නෙ නෑ. ඒ අයගෙ භාෂාවෙන් දෙකක් කතා කළාම තමයි බයට හරි වැඩේ කරල දෙන්නෙ. මෙතැනදී මේ ගස්වලට සම්බන්ධ යම් පහත් දේව, අමනුස්ස කොට්ඨාශ සම්බන්ධ වෙනවා. ඒ අයට යම් යම් ශක්ති විශේෂ පිහිටනවා. ඒ අය සන්තෝෂ වෙලා හෝ බයවෙලා හෝ හොඳට නරකට දෙකෙන්ම වැඩ කරනවා. සමහර මිනිස්සු ඉන්නවා බොහොම දරුණුයි. හැබැයි ඒ මිනිස්සුන්ගෙ වත්තෙ පළතුරු හරිම රසයි. හොඳට ඉන්න මිනිස්සුන්ගෙත් එහෙම තියෙනවා. ලෝභ මිනිස්සුන්ගේ ගස්වල හැදෙන්නෙ නැතිව යනවා.

එක්තරා ගමක මීට අවුරුදු කිහිපයකට උඩ දී හිටපු කාන්තාවක් කෙසෙල් ගස් හිටවන ක්‍රමයක් තිබුණා. අනෙක් අය බුදුන්ට කියල බුදුන් සිහි කරල කෙසෙල් ගස් හිටවනකොට, මේ කාන්තාව කියනවා බුදුන්ට කියල කෙසෙල් ගස් හිටවන්න එපා කොල්ලන්ට කන්න දෙන්න කියල කෙසෙල් ගස් හිටවන්න කියල. එතකොට බදන්න බැරි තරම් විශාල කෙසෙල් කැන් හැදෙනවා. හැබැයි බුදුන්ට කියල හිටෙව්වොත් හොඳ එක ඇවරියක් වැටෙනවා, අනෙක්වා පුහු. මොකද බුදුන්ට කැප කරපු දෙයක් බුදුන්ට විතරයි, අනෙක් අයට කැප නෑ. නමුත් මේ කාන්තාව දැනගෙන නෙවෙයි මේ වැඩේ කළේ, අත්දැකීමෙන්. බුදුන්ට කියල හිටෙව්වොත් බුදුන්ට දුන්නු දේ තව කෙනෙකුට කැප නැති නිසා බුද්ධ පූජාවට තියන්න හොඳට එක ඇවරියක් හැදිල අනෙක්වා පුහු වෙනවා. මොකද බුදුන්ට කැප කළාට පස්සෙ ඒකෙ හැදෙන අනෙක් ගෙඩි අනිත් අයට කැප නෑ. මේ වගේ එක ක්‍රමයක් කියල නෑ විවිධාකාර ක්‍රම තියෙනවා. නොපෙනෙන ලෝකයේ අචින්ත්‍ය ස්වභාවය මේ වගේ කාරණාවලින් තේරුම්ගන්න ඕන. ගස්කොළන් වුණත් හට ගන්නෙ අපේ චිත්ත ශක්තියට අනුකූලව. මේ නිසා අපි කතා කරන ආකාරයට කිරණ ශක්ති ක්‍රියාත්මක වෙනවා. යම් කෙනෙකුට අපි ආදරෙන් කතා කළොත් ඒ පුද්ගලයා ඒකට බොහොම කැමතියි. එතකොට විශ්වය ඒ අනුව හැඩ ගැහෙනවා. සමහර අයට බැන්නම වැඩ කරනවා, නැත්නම් කම්මැලියි. එතකොට ඒ අයට ඒ අනුව විශ්ව ශක්තිය හැඩ ගැහෙනවා. ගස්කොළන්වලත් මේ සිද්ධිය දකින්න තියෙනවා. මොකද මනස මුල්වෙලා අපේ මනෝ ලෝකෙ තියෙන ගස්වැල් තමයි මේ ලෝකයේ පසු කාලීනව හට ගන්නෙ. මුලින් යමක් පටන් ගත්තට පස්සෙ ඒකෙන් යම්කිසි ආකෘතියක් (Block) හැදෙනවා. ඒක ප්‍රතිබිම්භයක් වගෙයි. ඊට පස්සෙ ඒ ආකෘතියට අනුව ඒක ක්‍රියාත්මක ☞

වෙනවා. උදාහරණ විදිහට කලින් නෙළුම් මලක් දකල තියෙන සෘෂිවරයෙක් පළමුවෙන්ම නෙළුම් මලක් හිතෙන් මැව්වොත් පස්සෙ ඇත්තම නෙළුම් මලක් ඒකෙන් භෞතිකව මැවිල එනවා. හැබැයි නෙළුම් මලක් කවදාවත් දකල නැති සෘෂිවරයෙකුට එහෙම මවන්න බෑ. ඒ කාරණය තමයි අද තේරුම් ගන්න බැරි වෙලා තියෙන්නේ.

ඊළඟට පෘථිවියේ තියෙන තවත් කොටසක් තමයි ගිනිකඳු කියන්නේ. ඒකත් එක්තරා සතර අපාගත සත්ව කොට්ඨාශයක් නිසා තමයි හටගන්නේ. ඒ තමයි විනිපාතික අසුර කොටස. මේ විනිපාතික අසුර කොටසට අයිති ගල් භූතයන්ගේ ස්වභාවයක් තියෙනවා. වෙනත් සත්ව කොට්ඨාශවලට වගේ හැඩය වෙනස් කරගෙන එහෙ මෙහෙ සැරිසරන්න හැකියාවක් නෑ. තියෙන විදියටම ඉන්න ඕන. ගල් ගෙඩියක් තිව්වොත් ගල් ගෙඩියට නටන්න බෑ වගෙයි. කන්දකට හෙල්ලෙන්න බෑ වගෙයි. හැබැයි එක තැන ඉඳගෙන දුක විඳින්න වෙනවා. මේ කොටස තිරිසන් අපායට වඩා පහත්. මහා දුකක් විඳින තැනක්. සමහර අසුරයෝ කාන්තාරවල උපදිනවා. කාන්තාරයේ වැලි කන්දක් තියේ නම් සමහරවිට ඒ වැලි කන්දම අසුරයෙක්. ගිනිකඳුවලත් එහෙමයි. සමහර වෙලාවට මුළු ගිනි කන්දම අපායක්. ඒකෙ ඉන්නෙ අසුරයෝ. කර්ම ශක්තියෙන් අසුරයො පුපුරනකොට අපි කියනව ගිනි කන්ද පුපුරනව කියල. මේ වගේ කතාවක් අටුවාවක සඳහන් වෙනවා. ගල් ගෙයක වැඩ වාසය කරපු භික්ෂූන් වහන්සේලා පිරිසකට එක්තරා අවස්ථාවක දී විශාල හඬක් ඇහුණා. උන් වහන්සේලාගේ සමාධියට ඇහුණා, ඒකට අධිගෘහිත විනිපාතික අසුරයා කියනවා, තව ටිකකින් මේ ගල් ගෙය පුපුරනවයි කියල කියන හඬ. මේ අවස්ථාවේදී උන්වහන්සේලා පාත්‍රවලින් වතුර ගෙනල්ල ඒ ගල්ගේ කටට දැම්මා. එතකොට අසුරය කෑ ගැහුව, ඉක්මනට ඉවත් වෙන්න තව ටිකකින් මේක පුපුරනවා, මේක ඔබ වහන්සේලාට වතුර දාල නිවන්න පුළුවන් එකක් නෙවෙයි කියල. උන් වහන්සේලා එතනින් ඉවත් වුණාම ගල්ගේ මොහොතකින් ගිනි ගත්තා. මේ ගිනි ගන්නෙ උන්ගෙ ශරීර. ඒ ගල් ගෙයම අසුර ශරීරයක්.

දැන් මේ වගේ අසුර නිකායෙ ගිහින් උපදින්න හේතුවත් හොයල බලන්න ඕන. සමහරු තමන්ට හැකියාව තියෙද්දිත් කම්මැලිකමට ඉඳල අනුන්ගෙන් හූරගෙන කාල සම්පත් භුක්ති විඳිනවා. තමන්ගේ සූරත්වයෙන් හෙවත් හැකියාවෙන් වැඩ නොගෙන අනුන්ගෙන් මර මර හූරගෙන වැඩ ගන්නවා. මනුස්සයෙකුට වැසිකිළියට යන්න දෙන්නෙ නෑ. තේ එකක් බොන්න යන්න දෙන්නෙ නෑ, පුළුවන් තරම් වැඩ අරගෙන කීයක් හරි දෙනවා. මේ තමයි අසුර සංඛාරය. මේ වගේ අය විවිධ මට්ටම්වල අසුරයන් වෙලා උපදිනවා. ඒකට උරුම විපාකයත් ඒ වගේම එකක්. උදාහරණ විදියට යම් කිසි කෙනෙක් අත් දෙකයි කකුල් දෙකයි බැඳල හෙල්ලෙන්න බැරිවෙන්න තිව්වොත් මොකද වෙන්නෙ ? එහෙම නැත්නම් මිනිහෙක් බස්සන්න පුළුවන් වලක් කපල ඒකට බස්සල තිව්වොත් මොකද වෙන්නෙ ? අන්න ඒ වගේ තමයි මේ කියන අසුරයන්ටත් ඉන්න වෙන්නෙ. එතකොට මළ මුත්‍ර කරන්න, කන්න බොන්න ඔක්කොම කරන්න ඕන එක තැන ඉඳගෙන. නැවත හැරෙන්න පෙරළෙන්න කරන්න බෑ. වේදනාව විඳගෙන හිරවෙච්ච තැන ඉන්න ඕන. දැන් ඒ කරපු විදියටම තමන්ටත් විඳින්න වෙනවා. මේ විදියට බොහෝ ගල් පර්වතවලට සම්බන්ධ වෙලා මේ අසුර කොටස් ඉන්නවා. ගල් භූතයො කියල කියන්නෙත් මේ වගේ අසුර කොටසක්මයි. මුළු ගලම භූතයා. මේවායේ ස්වභාවය දකින කොටත් ඇඟ හිරි වැටෙනවා.

මීට අවුරුදු ගණනාවකට උඩ දී එක්තරා ප්‍රදේශයක එක්තරා නිවසක ගෘහ මූලික පියා මළා. මැරිල දවස් කිහිපයක් යනකොට ගෙදර උදවිය ගේ අතු ගාද්දි ගෙයි මුල්ලක සවි වෙච්ච කුඩා ගල් ගෙඩියක් දකල තියෙනවා. මේ ගල දින ගණනක් ගතවෙද්දී ක්‍රමයෙන් විශාල වෙන්න පටන් ගත්තා. ඒ ගලට ඇන්නම ගලෙන් ලේ එන්න පටන් ගත්තා. අර මනුස්සයා වඩපු සංඛාර අනුව මැරිල ගිහින් ගල් භූතයෙක් වෙලා ඉපදිලා. මේ වගේ සිද්ධි අනන්තවත් තියෙනවා. නමුත් මිනිස්සු ඒ ගැන හොයන්න යන්නෙ, විශ්වාස කරන්න යන්නෙ නෑ. ඒ නිසා ඒ වගේ සිද්ධි බොහෝ කොටම යටපත් වෙනවා.

ගෝනගල්දෙණිය ප්‍රදේශයේ අන්නක්කාගල කන්ද කියල කන්දක් තියෙනවා. ඒක කාලයක් ගිනි ගත්තා. හැබැයි මෑතක ඉඳන් නෑ. හැම අවුරුද්දකම අප්‍රේල් මාසයේ ඒක ගිනිගන්නවා. ගස්කොළන් පුච්චගෙන යනවා. මිනිස්සු හිතන්නෙ කවුරු හරි ගින්දර තියනවයි කියල. සමහර අය හිතනවා මී කඩන්න එන අය ගින්දර තියනකොට පිච්චෙනව කියල. නමුත් ඒක කාටවත් හොයන්න බෑ. කවුරුවත් දකල නෑ. සමහරවිට ඔය වතුවල හිටපු ඒ වතු අයිතිකාරයෝ ඒ වතුවල ඉන්න මිනිස්සුන්ගෙන් මර මර වැඩ ගත්ත නම් මැරිල ගිහින් ඒ අය ඔය කන්දටම අරක්ගෙන උපදින්න පුළුවන්. ඒ අයගෙ තියෙන දාහය කර්ම විපාකයෙන්ම එන හැටි තමයි මේ. ඒ වගේ කියන්න පුළුවන් සිද්ධියකුත් ඒ ප්‍රදේශයෙන් වාර්තා වුණා. ඒ ප්‍රදේශයේ එක්තරා මනුස්සයෙක් තමන්ගේ ඉඩම වටේ තියෙන අනෙක් ඉඩම්වල මායිම්වලට ඇඟිලි ගහ ගහ ගිහින් මාස ගණනක්, අවුරුදු ගණනක් ගිහිල්ල පොඩ්ඩක් හරි අල්ල ගන්නවා. මොහු අනුන්ගෙ ඉඩම් බලහත්කාරයෙන් අල්ල ගෙන භුක්ති විඳපු කෙනෙක්. අන්තිමට මේ මනුස්සයා අවුරුදු 98 ක් විතර ජීවත් වෙලා මැරෙනකොට අතේ නියපොතුවලට පණුවො ගැහුවා. මැරිල ගිහින් බලනකොට ගෙයි පිළිකන්නෙ ගල් භූතයෙක් වෙලා. හෙල්ලෙන්න බෑ. ඒ ගල බත් දාන ගලක්. ඒ කියන්නෙ කාල ඉතිරිවෙන ඉඳුල් කෑම බල්ලන්ට වගේ සතුන්ට කන්න දානවා. ඒ ගල තමයි මේ අමනුස්සයා. ඒ ගලට කෑම දැම්මම ඒව ගලටම උරා ගන්නවා. ඒක අමනුස්සයගෙ වැඩක්. මේ වගේ සමහර ගෙවල්වල දොරවල්වලට අඬේට තියපු ගල්වලටත් මේ වගේ භූතයො අරක්ගෙන ඉන්නවා. එතකොට ඒ ගලම තමයි භූතයා. ඒකත් අසුර නිකායෙම කොටසක්. මේ වගේ ලොකු පුංචි දෙගොල්ලන්ම ඉන්නවා. භූතයන් කිව්වමත් විවිධ මට්ටම්වල අය ඉන්නවා. ඒවායින් යන්න එන්න බැරිව ගල් සහ කඳුවලට හිරවෙච්ච කොටස් තමයි විනිපාතික අසුර භූත කොටස් කියන්නේ. මිනිස්සු ඒ වගේ ගල්, බෝර ගහල කඩන කොට උන්ට විශාල දාහයක් වේදනාවක් එනවා.

ඒ වගේම මුහුදෙ තියෙන ගල්මල් කියල කියන සමහර හුණුගල්පර කැඩුවමත් ලේ එනවා. දවස් ගණනාවක් යනකල් ඒවා පිළී ගඳයි. ඒවාට පණ තියෙනවා. මේ ගල්මල් හැදෙන්නෙ බෙල්ලන්ගෙ කටු දිරල ගිහින් ඒවායින් එන කැල්සියම්වලින්. ඒකට අර වගේ භූත කොටස් රිංග ගත්තම උන්ගෙ ක්‍රියාකාරීත්වයෙන් අතු ලියලනවා. ඉතින් මිනිස්සු, හරි ලස්සනයි කියල කඩල විකුණනවා. මිනිස්සු දන්නෙ නැතිවට මේ ඉන්නෙ අසුර කොටස්. මහා සාගරයත් අසුරයන්ගෙ නිජ බිමක්. මුහුදෙ තියෙන සමහර අයිස් කඳුවලට අසුරයො අරක්ගෙන ඒවා පිටින්ම අසුර කඳු බවට පත්වෙනවා. අයිස් කුට්ටි වශයෙනුත් මේ අසුරයන් ඉන්නවා. හැබැයි මේ කියන්නෙ මහා මේරු පර්වතය පාමුල ඉන්න අසුරයො නෙවෙයි. ඒ අය චාතුර් මහා රාජිකයටත් අයිති නැති එක්තරා දේව කොට්ඨාශයක්. නමුත් මේ කියන්නෙ සතර අපාගත අසුරයන් ගැන. මේ වගේ අපේ මස් ලේ ඇස්වලට පේන්නෙ නැතිවට මේ ස්වභාව ධර්මයේ විවිධාකාර ද්‍රව්‍ය වස්තුවලට සම්බන්ධ වෙලා විවිධාකාර ස්වරූපයන්ගෙන් මේ අසුර කොටස් ජීවත් වෙනවා.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# ලක්ෂණය, රසය, පච්චු පට්ඨානය හා පදට්ඨානය මුල්කරගෙන ධර්මය විග්‍රහ කරන හැටි...

*(පසුගිය කලාපයෙන් - එක ක්ෂේත්‍රයකට පමණක් සීමා නොවූ පද නිරුක්ති ක්‍රමය එදිනෙදා ජීවිතයටත්...)*

නිරුක්ති ගැන කතා කරන කොට තවත් බොහෝ වැදගත් කොටසක් තමයි මේ පෙන්වන්නේ. එනම් යම් කිසි වචනයක නිරුක්ති විග්‍රහ කිරීමේදී හතර ආකාරයකින් එහි අදහස ඔප් නංවා පෙන්වන්න පුළුවන්. (i) ඒ වචනයේ පිටතින් පෙනෙන්න තියෙන ස්වභාවය හෙවත් ලක්ෂණ වශයෙන් (ii) එයින් කෙරෙන කටයුත්ත විග්‍රහ කිරීම් හෙවත් රස වශයෙන් (iii) එය කුමන ප්‍රත්‍යයක් නිසා උපන් වචනයක්ද හෙවත් පච්චු පට්ඨාන වශයෙන් (iv) එය කුමක් පාදක කරගෙන පිහිටා පවතින්නේද හෙවත් පදට්ඨාන වශයෙන්. මේ කොයි ආකාරයෙන් පෙන්නුවත් නිරුක්ති පටිසම්භිදා ඥානය තියෙන මට්ටමට ඒ කාරණය විස්තර කරන්න පුළුවන්. මේ විදියට මේ කාරණා හතරෙන්ම චතුරාර්ය සත්‍ය ධර්මය විග්‍රහ කරන්න පුළුවන් බව පෙළ දහමේ පැහැදිලිවම පෙන්වා තියෙනවා. නමුත් මේ කාරණා හතරෙන් අද කියවෙන්නේ බාහිරින් හෙවත් මතුපිටින් පෙන්වන, ලක්ෂණය විතරයි. මේ නිසා ඉතිරි කාරණා තුන නැතිව දහමේ සැඟවුණු අර්ථයන් හොයාගන්න විදියක් නෑ.

මේ කාරණය සරළ උදාහරණයකින් පැහැදිලි කළොත්,

''කල්ලි'' කියන වචනය අරගෙන නිරුක්ති විග්‍රහ කිරීමේදී, කල්ලි වශයෙන් එකතු වෙලා සංවිධානය වන අරුතින් කල්ලි කියල කියනවා. මේ තමයි ලක්ෂණ වශයෙන් පෙන්වන නිරුක්තිය. පිරිස් එකතු වෙලා දරුණු, රෞද්‍ර වැඩ කරන අරුතින් කල්ලි කියල හැඳින්වීමෙන් රස වශයෙන් නිරුක්ති පෙන්වන්න පුළුවන්. කළු දහම් අල්ලගෙන ඇලෙන අරුතින් ක+අල්ලි=කල්ලි කියන ප්‍රත්‍යානුකූලව උපන් වචනයක් ලෙස පච්චු පට්ඨාන වශයෙන් නිරුක්ති පෙන්වන්න පුළුවන්. ද්වේශ සහගත අධර්මයේ පිහිටා ගොඩ නැගෙන අරුතින් පදට්ඨාන වශයෙන් නිරුක්ති විග්‍රහ කරන්න පුළුවන්. පටිසම්භිදා ඥාන යම් තරමක් තීක්ෂණ ද ඒ තරමට මේ විදියට පද නිරුක්ති දෙන්න පුළුවන්. මේ නිරුක්ති න්‍යාය නොදත් සමහර පොතේ ගුරුවරුන් වචනයේ පැරණිතාවය සෙවීමට පොත්පත් හාරා අවුස්සමින් කල් ගෙවා තමන්ගේ දෘෂ්ටිය ප්‍රකාශ කරන්න උත්සාහ කරන්න පුළුවන්.

දැන් තවත් උදාහරණයක් විදියට ''පටිච්ච'' කියන වචනය ගත්තොත්, ප්‍රත්‍ය වෙන හෙවත් ඵල දෙන අරුතින් පටිච්ච කියල ලක්ෂණ වශයෙන් අරුත් දෙන්න





පුළුවන්. යමකින් යමක් ගොඩ නැගෙන අරුතින් පටිච්ච කියලත් රස වශයෙන් නිරුක්ති දෙන්න පුළුවන්. පටි + ඉච්ච හෙවත් ඉච්ඡාවෙන් බැඳීම යන අරුතින් පච්චු පට්ඨාන වශයෙන් නිරුක්ති දෙන්නත් පුළුවන්. යමක පිහිටා ඒ ආධාරය මත තවෙකක් ගොඩනැගෙන අරුතින් පදට්ඨාන වශයෙන් නිරුක්ති දෙන්න පුළුවන්.

මෙතැනදී ලක්ෂණය කියන්නේ යමක ස්වභාවිකත්වය. ඒකට කෙබඳු ස්වභාවයක්ද තියෙන්නෙ කියන කාරණය. ඒක තමයි, යා තථතා, අවිතථතා, අනඤ්ඤතථා ඉදප් පච්චේතා අයං වුච්චති භික්ඛවේ පටිච්ච සමුප්පාදෝ කියල කිව්වෙ. ඊළඟට ඒක රසයෙන් විස්තර කරනවා. ඒකෙන් කෙරෙන කටයුත්ත මොකක්ද කියල බලන්න ඕන. ඒව මේතස්ස කේවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයෝ හෝති කියල කිව්වෙ රසය. එනම් දුක්ඛ සමුදය හෙවත් දුක හටගන්නා හැටි. ඒ තමයි පටිච්ච සමුප්පාදයේ කෘත්‍යය. පච්චු පට්ඨාන කියන්නේ කුමක් ප්‍රත්‍ය කරගෙන නැගී එනවද කියන කාරණය. ඉච්ඡාව ප්‍රත්‍ය කරගෙනයි නැගෙන්නේ. පදට්ඨානය කියන්නේ ඒකට මුල් වන කාරණය. පාද + ඨාන = පාද කියන්නේ යමකට පාදක වන ස්ථානය. ඨාන කියන්නේ එතැන පිහිටනවා කියන එක. යමකට පාදක වන ස්ථානයේ පිහිටීම තමයි පදට්ඨානය කියන්නේ. එතැන තමයි පටන් ගැන්ම.

අවිද්‍යා පච්චයා සංඛාරා කියල අවිද්‍යාව ප්‍රත්‍ය කරගෙන තමයි පටන් ගන්නේ. අවිද්‍යාව නැත්නම් මේ එකක්වත් නෑ. ප්‍රත්‍යය නැත්නම් ඒත් නෑ. ඉච්ඡාව නැත්නම් ඒත් නෑ. ඒ කියන්නෙ තණ්හාව. ඒ තමයි පච්චු පට්ඨානය. අවිද්‍යාව තමයි පදට්ඨානය කියන්නේ. නමුත් මේ කාරණය පොත්වල විග්‍රහ කරල දීල නෑ. මේ කියන කාරණය තේරුම් ගත්ත නම් පටිච්ච සමුප්පාදයේ ලක්ෂණය, රසය, පච්චු පට්ඨානය, පදට්ඨානය කියන මේවා පෙන්වන්න පුළුවන් වෙන්න ඕන.

බුදුන් වහන්සේ මෙතැනදී මේ කියන කාරණා 4 පෙන්වා දී තියෙනවා. **ඒක තමයි කිව්වෙ මේ පටිච්ච සමුප්පාදය විග්‍රහ කරන කොට අකුරු අප්‍රමාණයි, පද අප්‍රමාණයි, බෙදීම් අප්‍රමාණයි, නිරුක්ති අප්‍රමාණයි කියල.** පටිච්ච සමුප්පාද කියන වචනය නෙවෙයි කියල තියෙන්නේ, චතුරාර්ය සත්‍යය කියල. පටිච්ච සමුප්පාදයෙන් පෙන්වා තියෙන්නේ චතුරාර්ය සත්‍යයේ දුක්ඛ හා සමුදය. ''ඒව මේ තස්ස කේවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයෝ හෝති'' කියන්නෙ දුක සහ දුකට

☞

හේතුව. ඒක හටගන්නා ආකාරය තමයි අවිද්‍යා පච්චයා සංඛාරා... ආදී වශයෙන් සමුදය වෙන හැටි පෙන්නුවේ. බුදුන් වහන්සේ විග්‍රහ කරනවා මේ සමුදය, නිරෝධය කියන ඥාන පහළ වෙන හැටි. ඉතින් සමුදය, නිරෝධය කියන්නේ චතුරාර්ය සත්‍යයේ 2 ක් නම්, චතුරාර්ය සත්‍යය විග්‍රහ කරන්න අකුරු අප්‍රමාණයි, පද අප්‍රමාණයි, බෙදීම් අප්‍රමාණයි, නිරුක්ති අප්‍රමාණයි කියල පෙන්වා තියෙනව නම්, ලක්ෂණවලින් එක් කාරණයක් පෙන්වන්න පුළුවන්. ඒ වගේම රසයෙන්, පච්චු පට්ඨානයෙන්, පදට්ඨානයෙන් කියන මේ ඉතිරි කාරණා තුනෙනුත් පෙන්වන්න පුළුවන්. **මේ විදියට මේ හතරෙන්ම පෙන්නුවාම සමහර විතණ්ඩවාදී තර්කවාදීන්, ඕකෙන් නෙවෙයි හරි මෙන්න මේකෙන් කියල ලක්ෂණය විතරක් පෙන්වනවා. හරියට අන්ධයා ඇතා ගැන කිව්ව වගෙයි. ඇතාගෙ කකුල අතගාල කියනවා වංගෙඩි කොටයක් වගෙයි කියල. කන අතගාල කියනවා කුල්ලක් වගෙයි කියල. නමුත් ඇතා දැකපු කෙනා ඔක්කෝටම වැඩිය හොඳට දන්නවා මේ කියන්නෙ ඇතා ගැනයි කියල. මේ නිසා ඇතාගෙ කොටසක් අතගාල බලල ඇතාගෙ හැටි කියන්න යන අන්ධයෙක් වගේ නොවී, ඇස් පාදා ගෙන ඇතා දැකල විග්‍රහ කරනව වගේ නිරුක්ති ගැන කතා කිරීම ඉතා යහපත්.**

ඒ වගේ මෙතැනදීත් කියන්න තියෙන්නෙ පොත්වල පෙන්වා තියෙන පටිච්ච සමුප්පාදයේ ලක්ෂණ විතරයි. ඒක වැරදි නෑ හරි. නමුත් මේ පෙන්වන්නේ ඉතිරි කාරණා 3 ත් මුල් කරගෙන. මොකද එහෙම කියන කොට තමයි තම තමන්ගේ ප්‍රඥා මට්ටම් අනුව හොඳින් ඥාන ගෝචර වෙන්නේ. යමක තිබෙන්නා වූ ස්වභාව ලක්ෂණය මොකක්ද? ඒකෙන් කෙරෙන කටයුත්ත මොකක්ද? කුමක් නිසාද ඒක නැගිල එන්නේ? ඒක කුමක් පාදක කරගෙන පිහිටා පවතිනවද ? මෙන්න මේ කියන කාරණා 4න්ම විස්තර කරන්න පුළුවන්. මේ මොකකින් කිව්වත් කියන්නෙ ඇත්තක්. මේ විදියට තමයි බුදුන් වහන්සේ, කැල ගහ පෙන්වල සෝවාන් ඵලය විග්‍රහ කළෙත්. ඒ ගහේ මල්වල හැටි, කඳේ හැටි, කොළවල හැටි... මේ ආදී වශයෙන් අරගෙන ඒ ගහ විග්‍රහ කරන්න පුළුවන්. අන්න එහෙම කිව්වම ඒ ගහ ගැන හොඳින් දන්න කෙනා දන්නවා, එකකට එකක් පරස්පර වගේ පෙනුනට මේ සියල්ලෙන්ම කිව්වෙ කැල ගහ ගැන කියල. මේ වගේ යමෙක් පටිච්ච සමුප්පාදය ගැන කියන කොට, දන්න කෙනා දන්නවා ඒ මොකකින්ද කිව්වෙ කියල. ''යා තථතා, අවිතථතා, අනඤ්ඤථතා...'' මේ කිව්වේ පටිච්ච සමුප්පාදයේ ලක්ෂණය. නමුත් ඒක විතරක් දන්න කෙනා හිතන්නෙ බුදුන් වහන්සේ පටිච්ච සමුප්පාදය විග්‍රහ කරන්න දුන්න දේශනය මේක විතරමයි කියල. මේ නිසා ඒ පුද්ගලයා අනෙක් එකක්වත් පිළිගන්නෙ නෑ. ඒ වගේ දෘෂ්ටියක තමයි ඉන්නේ. එතකොට ඕක රසයෙන් විග්‍රහ කරන්න කිව්වොත්? ඔහු එහෙම එකක් දන්නෙ නෑ. මොකද ඒක අධ්‍යාපනය සඳහා පොතේ නැති නිසා. ඉතින් භාෂා රීතිය ඉගෙන ගත්ත පලියට ඕක දන්නෙ නෑ. මේ විදියට පච්චු පට්ඨානය,





පදට්ඨානය කියන ඒවා තෝර ගන්නත් බෑ. නමුත් ප්‍රඥාවන්ත කෙනාට මේ ක්‍රම 4 න්ම පෙන්වන්න පුළුවන්. හැබැයි මේක පොත් බලල හොයාගන්න බෑ.

දැන් මේ කියන කාරණා 4 සීල විසුද්ධිය මුල් කර ගෙන විසුද්ධි මාර්ගයේ විග්‍රහ කරල තියෙනවා. මේ සීලයේ ලක්ෂණය මොකක්ද? රසය මොකක්ද?... ආදී වශයෙන්. හුඟක් දුරට පෙළ දහමේ තියෙන්නෙ ලක්ෂණය විතරක් මුල්කරගෙන විග්‍රහ කරපු ඒවා. මොකද මාතෘකා පාලිය තමයි පෙළ දහමේ බොහෝ විට දීල තියෙන්නෙ. පුළුල් විග්‍රහයක් නෑ. ඥානවන්තයින්ට තෝර ගන්න තමයි එහෙම දීල තියෙන්නෙ. මේ නිසා මාතෘකා පාලිය තෝරන්න ගියාම බොහෝ අය වරද්ද ගන්නවා. මාතෘකා පාලිය පෘතජ්ජනයෙක් කියවන කොට ඔහුට තේරෙන්නෙ ලක්ෂණය විතරයි. ආර්යයෙක් කියෙව්වොත් තමයි ඒකෙ රසය, පච්චු පට්ඨානය, පදට්ඨානය ආදියත් වැටහෙන්නෙ. ඒ නිසා තමයි බොහෝ අයට මේක තෝර ගන්න බැරි. ලක්ෂණය මුල් කර ගෙන විග්‍රහ කළාම ඒක හරි ලේසියි කියන්න. මොකද උඩින් මත්තෙන් පේනවා. ඒක හැටියක්. නමුත් ඒක විතරක් අරගන්න බෑ. තවත් ක්‍රම තියෙනවා. හැබැයි අනෙක් කාරණාවලින් කිව්වම ඒක ගැඹුරුයි. ගැඹුරු නිසා තේරෙන්නෙ නෑ.

උදාහරණ විදියට ''දුවනවා'' කියනවා. මොකක්ද? දුවන අර්ථයෙන් ''දුවනවා'' කියනවා. ඒ කිව්වෙ ලක්ෂණයෙන්. ඒ වගේම කන අර්ථයෙන් ''කනවා'' කියනවා. ඒ තමයි ලක්ෂණයෙන් පෙන්වන ස්වභාවය. නමුත් දැන් මෙතැන මොකක්ද කිව්වෙ කියල තේරෙනවද? ඉතින් ලක්ෂණය විග්‍රහ කිරීමේදී ඉන් එහාට තෝර ගන්න බෑ. පදයේ නිරුක්තිය එන්නෙ නෑ. ඊට වඩා හොඳට ගැලපිලා තේරුම්ගන්න නම් පද නිරුක්තිය රසය, පච්චු පට්ඨානය හා පදට්ඨානයෙන් තෝරා ගත යුතුයි. ඒකෙ අර්ථය මොකක්ද? කොහොමද ඒක එන්නෙ? මේ තමයි නිරුක්ති පටිසම්භිදා ඥානයෙන් තෝර ගන්න ඕන කාරණා. ඒක නැත්නම් තෝරගන්න බෑ. ඒ නිසා තමයි නිරුක්ති පටිසම්භිදා ඥානය තිබිච්ච සිවුපිළිසිඹියාපත් මහරහතන් වහන්සේලා හෙළ අටුවාව ලියල තිබුණම, විසුද්ධි මාර්ගය ලියපු කතුවරයාණන් හැටියට දැනට සැලකෙන කතුවරයාණන්ට ඒක හොයාගන්න බැරි වුණේ. ඒ කතුවරයාණන් ඒක දැක්කෙ අර්ථ විපරීත වූ අවුල් අර්ථයක් විදියට. නමුත් සිවුපිළිසිඹියාපත් මහරහතන් වහන්සේලාට අවුල් වෙන්නෙ කොහොමද? ඒක වෙන්න පුළුවන්ද? දුන්න ශුද්ධ අටුවාව ඒක නම් අවුල් වෙන තැන්, නොපෑහෙන තැන් කොහෙද තියෙන්නේ ? ඉතින් ඒ කතුවරයාණන් කියල තියෙනවා, නොපැහැදිලි තැන් හා පුනරුක්ත දෝෂ ඉවත් කරල වටහාගන්න පුළුවන්, ගැලපෙන විදියට අටුවා සහ විසුද්ධි මාර්ගය ලිව්ව කියල.

එතකොට මේ වගේ හදාගත් භාෂා රීතීන් තියෙන උදවිය ☞

ලක්‍ෂණයෙන් තමයි වචන විග්‍රහ කරන්නේ. ඒ ලක්‍ෂණ රටාව අරගෙන තමයි ඔය පොත් පත් ලියල තියෙන්නේ. මේ නිසා අද තිබ්බිච්ච භාෂා විලාශය එදා තිබිල නෑ. හැබැයි එදා ගත්තු ලක්ෂණයන්ගෙන් විග්‍රහ කරල හදපු නිසා තමයි මේ නව පාලි භාෂාවෙන් සූත්‍රවලට නව තේරුම් ලියල තියෙන්නේ. මේ නිසා තමයි ''අගත අනගත චතුදිස සගස දිනේ'' කියල එදා සෙල් ලිපිවල තිබ්බිච්ච භාෂාව අද ''ආගතා නාගතස්ස චාතුද්දිසස්ස සංඝස්ස දේම'' කියල කියන්නෙ. එතකොට දැන් තියෙන භාෂාව හදාගත්තු එකක් බව පැහැදිලිව පේනවා. එදා සෙල් ලිපි භාෂාවයි, අද ලිඛිත භාෂාවයි තුලනාත්මකව බැලුවොත් පැහැදිලිව පේනවා, අද තියෙන භාෂාව ලද බොළඳ විදියට පසුකාලීනව හදපු භාෂාවක් බව. එදා තිබ්බිච්ච අදහස අරගෙන අද තියෙන භාෂාවෙන් දීල තියෙනවා. එහෙනම් අද තියෙන භාෂාවෙන් මේ සියල්ල ලියන කොට එදා තිබ්බිච්ච භාෂාවේ රසය, පච්චු පට්ඨානය, පදට්ඨානය ගන්න දන්නෙ නෑ. ඒ නිසා මොකද කළේ, ඒකෙ තිබ්බිච්ච ලක්‍ෂණය විතරක් ලිව්වා. එහෙම ලියල නව භාෂාවකට පරිවර්තනය කරල බුදුන් වහන්සේ දේශනා කරපු හැටියට තමයි අද පොත්පත්වල ලියල තියෙන්නේ. අදහස ඒක තමයි. නමුත් අදහස අරගෙන ඒක විග්‍රහ කරන්න ගියාම නව භාෂාවට පටබැඳල තමයි ලියල තියෙන්නේ. එහෙම හදාගත්තු ඒවා තමයි අද සූත්‍ර කියන්නේ.

**ඉතින් දැන් ඇහුවොත්, එදා බුදුරජාණන් වහන්සේ ඔය කියපු සූත්‍රය ඔය හඬින්මද දේශනා කළේ කියල ඔව් කියන්නද? එහෙනම් ඔය හඬ සෙල් ලිපි ගණනේ වෙනස් කළේ කවුද?** ''ආගතා නාගතස්ස චාතුද්දිසස්ස සංඝස්ස දේම'' කියල ඒ ජාතියේ ක්‍රමයකින් බුදුන්වහන්සේ බණක් කිව්ව නම්, ඒක ''අගත අනගත චතුදිස සඝස දිනේ'' කියල ලිව්වෙ කොයි කාලයේ වෙනස් කරලද? ඒක නැවතත් මේ විදියට බුදුන් වහන්සේ දේශනා කරපු හැටියට හදාගත්තෙ කවුද? දැන් මේ ගැන ප්‍රශ්ණ කරන්න පුළුවන්. එහෙනම් මොකක්ද වෙලා තියෙන්නෙ? එදා මිනිස්සු භාවිතා කරපු භාෂා විලාශයක් තිබුණ නම් ඒකවත් අද මොකක්ද කියල දන්නෙ නෑ. අපේ සිංහල මිනිස්සු එදා කතා කරපු භාෂාවත් අද දන්නෙ නෑ. හැබැයි විවිධාකාර පරිවර්තනවලින් ව්‍යවහාරයක් හැදිල තියෙනවා. ව්‍යවහාරය කොච්චර ගෙනාවත් ඒකෙ පද නිරුක්තිය සැඟවිලා තියෙනවා. ඒක තමයි පච්චු පට්ඨානයෙන් ගන්නවා කියන්නෙ. අනෙක්වා ඔක්කෝම ඒකෙ තියෙන විවිධාකාර අර්ථ. ඕක මොන ප්‍රත්‍යයෙන්ද උපදින්නේ ? පච්චු පට්ඨාන කිව්වෙ ඒකයි. ඒ පදය ඉපදුනේ කුමක් ප්‍රත්‍ය කරගෙනද ? කුමක් හේතු කරගෙනද? අන්න ඒක තමයි වැදගත්ම කොටස. උදයබ්බ ඥානය නිරුක්ති ඥානයට අහුවෙන්නෙ මෙන්න මෙතැනදී. එතකොට තමයි මේක තේරෙන්නේ.

නමුත් ඒක පැහැදිලි කරල දෙන්න ගියාම සමහර උදවිය දොස් කියනවා, අමුතු බණක් දේශනා කරනව කියල. නමුත් ඒ අය ලක්‍ෂණයෙන් පෙන්වපු දේ විතරක් අරගෙනයි මේ දොස් කියන්නේ. උදාහරණ විදියට පටිච්ච කියන වචනයේ නිරුක්තිය පෙන්වන්න ගියාම කෙනෙක් මෙහෙම



දොස් කියන්න පුළුවන්. (පටි - බැඳීම, ඉච්ඡ - කැමැත්ත, පටිච්ච - කැමැත්තෙන් බැඳීම) ''මොනවද ඔය කියන පිස්සු බණ! පටිලු! පටි කියන්නෙ ඉනේ බඳින පටිනෙ!'' මේ විදියට නැති ඒවත් ඒකට එකතු කරල වැරදි අර්ථ නිරූපනයන් දෙන්න උත්සාහ කරන්න පුළුවන්. නමුත් ඒ විදියට වැරදියට අල්ල ගන්නෙ ''පටි'' කියන වචනයේ අර්ථය පෙන්වපු හැටි දන්නෙ නැතිව. ඉනේ බඳින්නෙත් පටි තමයි. එහෙම දෙයක් නැතිව නෙවෙයි. හැබැයි ඒ අනාර්ය අර්ථයෙන්. නමුත් ආර්ය අර්ථයෙන් මෙතනදී පටි කියන්නෙ ඉනේ බඳින පටි නෙවෙයි. මේ සත්වයා සංසාරයට දස සංයෝජන ධර්මවලින් කැමැත්තෙන් බැඳීම. ඒ විදියට බැඳෙන අර්ථයෙන් තමයි මෙතනදී පටි කිව්වෙ. මේ කියන ආර්ය අර්ථය අනාර්යන්ට තෝර ගන්න බෑ.

හොඳයි, කාමය කියන්නෙ මඩ කියල කිව්වොත් එහෙම මේ අය මොකක් කියයිද? (අංගුෑනි 5 -<u>කාමාධි වචන සූත්‍රය</u>) ''කවුද ඒ කියන බූරුවා! මඩවලට මඩ කියනවා මිසක් කාමයට මඩ කියන්නෙ කවුද?'' කෙනෙක් මෙහෙම කියන්න පුළුවන්. නමුත් පොතේ තියෙන නිසා කට පියාගෙන ඉන්නවා. පංක යනු කාමයට නමකි, සල්ල යනු කාමයට නමකි, උල යනු කාමයට නමකි, භය යනු කාමයට නමකි, ගිනි යනු කාමයට නමකි... මේ ආදී වශයෙන් කාමය හඳුන්වන්න විවිධ නම් තියෙනවා. නමුත් මේ කියන විතණ්ඩවාදී තර්කවාදීන් ''කාමයට ගිනි කියන්නෙ කවුද?'' මෙහෙම කියල මේ වගේ මහා වික්‍ෂිප්ත භාවයකින් අහන්න පුළුවන්. ඉතින් මොන හේතුවෙන්ද කියල හොයන්න ඕන. මොකක්ද ඒ නම උපදින්න ප්‍රත්‍ය වුනේ? **ඇයි කාමයට මඩ කිව්වේ? කාමය භුක්ති විඳින්න යන කෙනා හැම තැනම මඩ ගාගත්ත වගේ තමයි, මඩේ එරුණ වගේ තමයි.** ඒකට වැටුණට පස්සෙ ගොඩ එන්න බෑ. හැම තැනම මඩ තමයි, කාම කහට. ඒ වගේ උපමාවක් පෙන්වල කාමයේ තියෙන දුක, මඩේ නොයෙක් ආකාරයෙන් ඉන්නා වූ කෘමීන්, පණුවන් ආදී විවිධ සතුන්ගෙන් ඇතිවන්නා වූ කැහිලි, පණුවන් කෑම් ආදියෙන් පෙන්වනවා. එහෙනම් හැම තැනම කාමය ඇසුරු කරගෙන ඉන්න කෙනාට සිද්ධ වෙන්නෙ මඩ ඇසුරු කරගෙන ඉන්නවා වගේ තමයි. ''හොඳ මඩක් කෑවෙ'' කියල අදත් අපි කතාවට කියනවා. මේ හේතුවෙන් තමයි කාමයට මඩ කියනවයි කියල පැහැදිලිව පෙන්වල තියෙන්නේ. දැන් මෙහෙම කිව්වම හොඳට තේරෙනවා.

එතකොට **කාමයට උල කියන්නෙ ඇයි?** කාමය ඇසුරු කරන්න ගියාම තමයි උල් ඇන ගත්ත වගේ එකිනෙකා එක්ක රණ්ඩු වෙන්නෙ, හැප්පෙන්නෙ. ඒ කාම වස්තු බදාගෙන ඒවා රැකගන්න තමයි ඔක්කොම කරන්නේ. ඒ ගති ලක්‍ෂණය ඒකෙන් මතු කරන නිසා කාමය බදා ගන්න ගියාම හරියට උල් ඇනෙනවා වගේ තමයි. **ඇයි කාමයට භය කියන්නේ?** කාමය ඇසුරු කරන්න ගියාම තමයි, කඩාගෙන යයිද? බිඳගෙන යයිද? පැනල යයිද? උස්සගෙන යයිද? හොරෙන් අරන් යයිද? වෙන එකෙක් දූෂණය කරයිද?... ආදී වශයෙන් හැම වෙලේම මහා ☞

හයකින් ඉන්නෙ. මේ තමයි ප්‍රත්‍යවෙන ආකාරය, ප්‍රත්‍යයෙන් උපදින හැටි. මේවා ඔක්කෝම පච්චු පට්ඨානයෙන් විග්‍රහ කරනවා, කුමක් ප්‍රත්‍ය කරගෙනද ඒ නම කියන්නෙ කියන කාරණය. ඉතින් මේක හරිම වැදගත්, නිරුක්ති පටිසම්භිදා ඥානයට අයිති එකක්. මේ ඥානය වැඩුනොත් බොහොම පැහැදිලිව කියන දේ තේරෙනවා, අර්ථය තෝර ගන්න පුළුවන්. නමුත් මේ සමහර විතණ්ඩවාදී තර්කවාදීන් පොත අරගෙන ලක්ෂණය විතරක් විග්‍රහ කරපු එකෙන් අර්ථ පෙන්වන්න ගියාම කොහොමද මේක ලෝකයාට කියල දෙන්නෙ? අර්ථ පෙන්වන්න යනකොට ඒක 4 ආකාරයකින් පෙන්වනවා. අර්ථ, ධර්ම, නිරුක්ති, පටිභාන කියන 4කින් පෙන්වන්න පුළුවන් කාරණය, අර්ථයෙන් විතරක් පෙන්වන්න යනවා. අර්ථය කිව්වම මොකක්ද ගන්නේ ? ඒකෙ ස්වභාව ලක්ෂණය විතරයි, මතුපිටින් පේන දේ විතරයි කියන්නෙ. ඒක බොහොම ලේසියි. ඉතින් ඒකෙන් විතරක් ඉගෙන ගත්තම මේ ඔක්කොම දෙන්න බෑ.

ආරෝග්‍ය කියන්නෙ මොකක්ද කියල ඇහුවම ආරෝග්‍ය නිසා ආරෝග්‍ය කියනවලු, ලෙඩ නැති නිසා ආරෝග්‍ය කියනවලු. නමුත් මේ උත්තරේම තමයි එදා හිටපු බමුණන් දුන්නෙත්. මේ විදියට අර්ථය ලක්ෂණයෙන් විග්‍රහ කළා මිසක් ඊට එහා දෙයක් බමුණන් ළඟ තිබුනෙ නෑ. මොකද බමුණන්ට ධර්ම, නිරුක්ති, පටිභාන තිබුණෙ නෑ. ඔවුන්ට තිබුනෙ ලෞකික අර්ථයක් විතරයි. ලෞකිකත්වය තුලින් හදාගත්තු නීති මාලාවක්, භාෂා රීතියක් අරගෙන ඒ අර්ථයෙන් විග්‍රහ කරන්න පටන් ගත්තා. මේ නිසා බමුණන්ට ධර්ම, නිරුක්ති, පටිභාන නෑ, ආර්ය අර්ථයකුත් නෑ, ලෞකික අර්ථයක් තියෙනවා එච්චරයි. ඉතින් ලෞකිකත්වය තුල ඉඳගෙන මොන ධර්මයක් පෙන්වන්නද? මොන නිරුක්ති කියන්නද? ඒ ඥානය නෑ.

මේ විදියට අර්ථයෙන් විග්‍රහ කරන එක අරගෙන තමයි පටිච්ච සමුප්පාදයේ ''යා තථතා, අවිතථතා, අනඤ්ඤථතා'' කියන කාරණයේ ලක්ෂණ විතරක් පෙන්නුවේ. මේ කියන ලක්ෂණය ආර්ය සත්‍ය 4ටම විග්‍රහ කරල තියෙනවා. ඒවා ඔක්කොම තථ, අවිතථ, අනඤ්ඤථයි. පොතේ එල්ලිලා ඉන්න උදවිය ඕක තෝරන්නෙ තථ කියන්නෙ සත්‍යයි, අවිතථ කියන්නෙ අසත්‍ය වෙන්නෙ නෑ, අනඤ්ඤථ කියන්නෙ අන්‍යථාවයකට පත්වෙන්නෙ නෑ කියල උඩින් මත්තෙන්. අර්ථය දැනගත්ත කෙනෙක් කිව්වත් ඔය අර්ථයම එනවා. නමුත් ඒ ගැඹුරු අර්ථයෙන්. තථ කියන්නේ සදාතනිකයි, ස්ථිරයි කියන අදහස. ඒක එසේමයි කියන එක. ඉතින් ඒක සත්‍ය නිසා තමයි ඒක එසේම වෙන්නේ! අසත්‍ය නම් එහෙම වෙන්නෙ නෑ. කතා දෙකම හරි. අවිතථ කියන්නෙ වෙනස් තත්වයකට පත්වෙන්නෙ නෑ කියන එක. ඉතින් සත්‍යය වෙනස් තත්වයකට පත්වෙන්නෙ නෑ තමයි. ඒකත් ගැලපිලා තියෙනවා. අනඤ්ඤථා කියන්නේ අන්‍යථාවයකට පත්වෙන්නෙ නෑ කියන එක. ඒකත් ගැලපිලා. එහෙනම් ඒ වචනවලට කොයි ආකාරයෙන් අර්ථ දුන්නත් ඔය අර්ථ තුනම හරි.

උදාහරණ විදියට 2 x 1 = 2යි, 2 x 2 = 4යි, 2 x 3 = 6යි කියනවා. මේක වෙනස් වෙනවද? ඒක බොරුද? මෙතැන ලෞකික ලෝකෝත්තර ප්‍රශ්ණයක් නෑ. මේ කියන කතාවේ සත්‍යතාවයයි අහන්නේ. පටිච්ච සමුප්පාදය ගත්තොත් ඒක ලෞකිකයි. ලෝකයේ දුක ගොඩනැගෙන හැටි තමයි ඒකෙන් කියන්නෙ. ඉතින් දුක ගොඩනැගෙන හැටි කියන යම් ක්‍රමවේදයක් ඇත්නම් ඒකත් ලෞකිකයි. එහෙනම් 2 x 1 = 2යි, 2 x 2 = 4යි, 2 x 3 = 6යි කියන එකත් ලෞකිකයි. ඒකත් තථයි, බොරු නෙවෙයි. ඒකත් කොයි කාලෙකවත් වෙනස් වෙන්නෙ නෑ. එතකොට අවිතථයි. අන්‍යථාවයකට පත්වෙන්නෙත් නෑ. එතකොට අනඤ්ඤථයි. 2 x 2 = 3 යි කියල එක කාලෙකටත් 2 x 2 = 5යි කියල තව කාලෙකටත් කියන්න බෑ. 2 x 2 = 4මයි. දැන් ඒකත් පටිච්ච සමුප්පාදයද කියල අහන්න පුළුවන්. තථ, අවිතථ, අනඤ්ඤථ කියන මේ ලක්ෂණ 3 නිසා පටිච්ච සමුප්පාදය තීන්දු කළා නම්, දෙවරක් චක්‍රයත් පටිච්ච සමුප්පාදයි ද කියල අහනවා. දැන් මොකෙන්ද පෙන්වන්නේ? ''ඉදප් පච්චේතං'' මේ ප්‍රත්‍යය. 2 x 1 = 2යි, 2 x 2 = 4යි කියන එකත් ප්‍රත්‍යයි. ඒකත් හේතුවේ ඵලයක්. ඉතින් ඒකත් පටිච්ච සමුප්පන්නයි. දැන් ඉතින් ලක්ෂණයකින් විතරක් කතා කරල හංවඩු ගහන්න ගියාම අනෙක් සැරේ කියන්න ගියාම කෝ දෙන්න උත්තරයක්? 3 X 3 = 9 යි කියනවා. ඒක දැනුත් එකයි, ඉස්සරත් එකයි, මතුවටත් එකයි. ඒකත් තථයි, අවිතථයි, අනඤ්ඤථයි. දැන් මේ කාරණා 3 මුල්කරගෙන පටිච්ච සමුප්පාදයේ ලක්ෂණයක් තමයි ඒකෙන් කිව්වේ. ඒ වගේ චක්‍රයේ ලක්ෂණයක් තමයි මේ පෙන්නුවේ. ඒකෙත් ලක්ෂණය එහෙම තමයි. ලක්ෂණයක් විදියට විග්‍රහ කරන්න පුළුවන්.

ඊළඟට ඒකෙ කෘත්‍යයක් තියෙනවා. චක්‍රයෙන් කරන කෘත්‍යය මොකක්ද? යම්කිසි ආකාරයක පහසුවෙන් තමන්ට අවශ්‍ය කරන්නා වූ ගණනක්, ලේඛනයක් සකස් කරගැනීමේ පහසුව, එවැනි කටයුත්තක් කරගන්න. මේ තමයි දෙවරක් චක්‍රයේ රසය. ඊළඟට පච්චු පට්ඨානය. කුමන ප්‍රත්‍යයක් නිසා උපදිනවද? යම්කිසි ආකාරයකින් ලෝකයාගේ පර්යේෂණ මනසක් ඇත්ද ඒ පර්යේෂණ මනස නිසා තමයි මේක ඉපදිලා තියෙන්නේ. පර්යේෂණ මනසක් නැත්නම් දෙවරක් චක්‍රය හොයන්න බෑ. පර්යේෂණ මනසේ ප්‍රතිඵලයක් තමයි ඔය තියෙන්නේ. මොකක්ද පදට්ඨානය? අවිද්‍යාව පදට්ඨානය කරගෙන තමයි පර්යේෂණ කරන්නේ. කොහොම ගියත් ලෝකය අල්ලන්න ගියාම අවිද්‍යාව පදට්ඨානය වෙනවා. එතන තමයි මුල.

තවත් උදාහරණයකින් පැහැදිලි කළොත්, සත්ව කියන වචනයේ ලක්ෂණය තමයි බාහිර හැඩරුවින් විවිධාකාරයෙන් පෙනෙන්න තියෙන සත්ව ස්වභාවයන්. රසය තමයි ලෝකය රාග, ද්වේශ, මෝහ සහිතව සත් බවින් අරගෙන වැය පැත්තට හෙවත් පහත් පැත්තට පත්වූ පිරිස කියන අර්ථය (<u>මහා නිද්දේස පාළිය</u> - 33 පිටුව) සත්ව කියන එකේ පච්චු පට්ඨානය තමයි තණ්හාව. එනම් තණ්හාව ප්‍රත්‍ය කරගෙන තමයි හටගන්නෙ. පදට්ඨානය තමයි අවිද්‍යාව.

ඊළඟට සෝතාපන්න කියන වචනය ගත්තොත්, ලක්ෂණය තමයි නිවන් දැකපු කෙනෙක් කියන එක. උදා: විශාඛා උපාසිකාව, අනේපිඬු සිටුතුමා ආදීන් දිහා බාහිරින් බලල කවුරු හරි කියන්නෙ සෝවාන් වෙච්ච අය කියල. සෝතය කියන්නෙ අරි අටඟි මග. යමෙක් සෝතයට හෙවත් අරි අටඟි මගට ආපන්න වුණාම (සම්මා දිට්ඨියට පත් වුණාම) සෝතාපන්න යැයි කීම රස වශයෙන් විග්‍රහ කිරීමක් (සං. නි. (5) 2- <u>දුතිය සාරිපුත්ත සූත්‍රය</u>) සෝතාපන්න කියන එකේ පච්චු පට්ඨානය තමයි කල්‍යාණ මිත්‍ර සේවනය. පදට්ඨානය තමයි ප්‍රඥාව එහෙම නැත්නම් විද්‍යාව.

මේ විදියට විග්‍රහ කළාම අහන් ඉන්න කෙනාට බොහොම පැහැදිලියි. මේ කාරණය තේරුම් කරල දෙන්න පුළුවන්නම් හරිම වැදගත්. නමුත් මේවා පොත්වල විග්‍රහ කරල තෝරල නෑ.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# ආර්යත්වයට පත්වීමට දැකිය යුතු සත්‍ය හතර



බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරල තියෙන <u>මනුස්ස චුති සූත්‍රය</u> කියවල බැලුව නම් (සංයුක්ත නිකාය 5-2, 335 පිටුව) මේ ලෝකයේ අද මිනිසුන් ලෙස ඉපදී සිටින පිරිස අතරින් චුතියෙන් මතු කී දෙනෙක් නම් යලි මිනිසුන් වෙනවද, කී දෙනෙක් නම් සතර අපායට යනවද කියල හොඳින් වටහා ගන්න පුළුවන්. ඒක පෙන්වල තියෙන්නේ නියපොත්ත මතට ගන්න පුළුවන් පස් ටිකකුයි, මේ මුළු ලෝකයේම ඇති පස් ප්‍රමාණයයි සංසන්දනය කිරීමෙන්. ඒ අනුව බැලුවම නම් අද ලෝකයේ ඉපදිලා ඉන්න මිනිසුන් අතරින් කෝටි ගණනකට කෙනෙක් වත් නැවත මිනිසුන් වෙලා උපදියි කියල හිතන්න අමාරුයි. (විශේෂයෙන් අබුද්ධෝත්පාද කාලයක) මේ සූත්‍රයේම උන් වහන්සේ ඒකට හේතුවත් දේශනා කරල තියෙනවා. ඒ තමයි චතුරාර්ය සත්‍යය නොදැකීම. මේ අනුව හිතා ගන්න පුළුවන්, චතුරාර්ය සත්‍යය නුවණැසින් දැකපු කෙනෙක් නම් නැවත සතර අපායේ උප්පත්තියක් ලබන්න හේතු නැති බව. ඒ වගේම මේ සසරේදී සතර අපාගත උප්පත්තියක් ඇති නොවීමට තමන් ප්‍රඥාවෙන් වටහාගත යුතු දහම් පිළිබඳව විස්තර සහිත සූත්‍ර දේශනාවල් බොහොමයක් තියෙනවා. මේ අනුව පළමුවෙන්ම උත්සාහ කරල බලන්න ඕන, මේ චතුරාර්ය සත්‍යය නුවණැසින් දකින්න. මේ ආර්ය සත්‍ය හතර හරියටම දැකගන්න පුළුවන් වුනොත් , නැවත කිසි විටෙකත් මේ සසරෙදී සතර අපාගත වෙන්නෙ නෑ.

මේ සම්බන්ධයෙන් සියලු විස්තර දැනගන්න, වසර දහස් ගණනක් තිස්සේ අපේ අති ගෞරවනීය සඟ පරපුර විසින් තම දිවි දෙවැනිකොට, පරපුරෙන් පරපුරට ආරක්ෂා කරගෙන පැමිණි, ශ්‍රී සද්ධර්මය අන්තර්ගත කරල පහසුවෙන් පරිහරණය කරන්න පුළුවන් විදිහට සකස් කරල තියෙන, ශ්‍රී සම්බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව උපයෝගී කරගැනීම ඉතා යහපත්. මේ නිසා පහත සඳහන් සූත්‍රවලට විශේෂ අවධානය යොමු කරල, ඒවායින් එළි කෙරෙන ධර්මය වටහා ගන්න උත්සාහ ගැනීම ධර්මාවබෝධයට මහත් රුකුලක් වෙනවා.

මේ සම්බන්ධයෙන් විශේෂ ධර්ම කරුණු අඩංගු සූත්‍රයක් තමයි <u>පරිඤ්ඤෙය්‍යිය සූත්‍රය</u> (සංයුක්ත නිකාය 5-2, 293 පිටුව). එහි සඳහන් විස්තරයට අනුව දුක්ඛ ආර්ය සත්‍යය පිරිසිඳ දකින්න ඕන. (යම් දෙයකට ඇති ප්‍රිය ස්වභාවය හෝ කැමති ස්වභාවය අත්හැරල සිඳ බලන්න කියන එකයි ඉන් හැඟෙන්නේ) දුක්ඛ සමුදය ආර්ය සත්‍යය ප්‍රහානය කරන්න ඕන (තණ්හාව නැවත ඇති නොවෙන්න පහ කිරීම), දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය සාක්ෂාත් කරන්න ඕන (ප්‍රත්‍යක්ෂ කර ගැනීම). දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය වඩන්න ඕන. (නැවත නැවත භාවිතා කර හොඳින් ප්‍රගුණ කර ගත යුතුයි.)

තවත් සූත්‍රයක් තමයි <u>ගවම්පති සූත්‍රය</u> (සං.නි. 5-2, 293 පිටුව) මේ ගවම්පති සූත්‍රයට අනුව කවුරු හරි පුද්ගලයෙක් ආර්ය සත්‍ය හතරෙන් එකක් දැක්කොත්, ඒ පුද්ගලයා අනෙක් සත්‍ය තුනත් දකිනවා. ඒ කියන්නෙ කවුරු හරි මේ ආර්ය සත්‍ය හතරෙන් එකක් දැක්කොත් චතුරාර්ය සත්‍යය දැක්ක පුද්ගලයෙක් බවට පත් වෙනවා. ඒ විතරක් නෙවෙයි ඒ පුද්ගලයා නැවත කවදාවත් සතර අපාගත වෙන්නෙ නෑ.

මේ චතුරාර්ය සත්‍යය දකින එක කොච්චර වැදගත් දෙයක්ද කියල දැනගන්න තවත් සූත්‍රයක් තියෙනවා. ඒ තමයි <u>චේල සූත්‍රය</u> (සං. නි. 5-2, 279

☞

පිටුව ) යම් කිසි පුද්ගලයෙකුගේ වස්ත්‍රයට හෝ හිසට ගිනි ඇවිලුනොත් ඒ පුද්ගලයා වහාම ක්‍රියාත්මක වෙලා ගින්න නිවා ගත්තෙ නැත්නම් මහ විනාශයක් වෙනවා. නමුත් බුදුරජාණන් වහන්සේ පෙන්වල දීල තියෙනවා, එසේ **හිස හෝ වස්ත්‍රය හෝ ගිනිගත් අවස්ථාවකදී වුණත්, ඒ ගිනි නිවාගන්න උත්සාහ කරනවාට වඩා, අවබෝධ නොකළ චතුරාර්ය සත්‍යය අවබෝධ කරගන්න උත්සාහ කිරීම වැදගත් කියල.** ඒ පුද්ගලයා මිය යන්න පෙර චතුරාර්ය සත්‍යය අවබෝධ කරගත්තොත් නැවත මේ සසරේ කවදාවත් සතර අපා දුක් ගිනි හටගන්නෙ නෑ. හැබැයි හිසේ හෝ ඇඳි වතේ ගින්න නිවාගෙන, චතුරාර්ය සත්‍යය අවබෝධ කර නොගත්තොත් සතර අපාය කියන ගින්නට මේ සසර වසන තාක්, කලින් කල හසුවෙන්න සිද්ධ වෙනවා.

චතුරාර්ය සත්‍යය දකින්න අත්‍යවශ්‍ය තවත් වැදගත් දහම් කරුණක් නෙත්තිප්‍රකරණයේ 249 පිටුවේ විග්‍රහ කරල තියෙනවා. ඒ විස්තරයට අනුව චතුරාර්ය සත්‍යය නමැති ධර්මයට අදාල වුනු න්‍යායත්, ඒ සම්බන්ධ ඥානයත් ගැන පුළුල් අවබෝධයක් ලබාගන්න පුළුවන්.

චතුරාර්ය සත්‍ය න්‍යාය කියල විස්තර කරන්නෙ රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ කියන මේවායේ බැඳීමෙන් සැකසෙන පංච උපාදානස්කන්ධයේ තියෙන අනිච්ච ස්වභාවය අවබෝධ කර ගැනීමයි. මේ ස්වභාවය, ඒ කියන්නෙ පංච උපාදානස්කන්ධයේ තියෙන අනිච්ච ලක්ෂණය දැනගන්නා ආර්ය ශ්‍රාවකයා පංච උපාදානස්කන්ධයම අනිච්ච බව නුවණැසින් දකිනවා. ඒ ආකාරයට දකින්න පුළුවන් නම් තමයි චතුරාර්ය සත්‍යය පිළිබඳ ඥානය ලැබෙන්නෙ. එහෙම දකින්න පුළුවන්වීම ඒ පුද්ගලයාගේ චතුරාර්ය සත්‍යය පිළිබඳ අනුලෝම ඥානය වෙනවා. නිවන නිච්චයි කියල දකින කොටයි සෝවාන් මාර්ග ඥානය වැඩිල, නිසි ප්‍රත්‍ය සම්පූර්ණ වුනාම ඵලය ලැබෙන්නේ.

තවත් පැහැදිලිව විස්තර කරනව නම්, ලෝකයේ සියලුම සංස්ඛාරයන්ගේ තියෙන අනිච්ච ස්වභාවය චතුරාර්ය සත්‍යයේ න්‍යාය ලෙසත්, යම් පුද්ගලයෙක් ඒක තමන්ගේ විදර්ශනා ප්‍රඥාවෙන් දැක්කොත් ඒක ඔහුගේ චතුරාර්ය සත්‍යය පිළිබඳ අනුලෝම ඥානය ලෙසත්, නිවන නිච්ච ලෙස ඇති මාර්ගය වැඩී ප්‍රත්‍ය සම්පූර්ණ වුනාම දර්ශන ඥානය ලැබෙන බවත් පෙන්වා දෙන්න පුළුවන්. දැන් පේනවා චතුරාර්ය සත්‍යය දකින්න අනිච්ච දකින්නෙ නැතිව බෑ කියල. දැන් ඉතින් අනෙක් ඒවා ඔක්කොම පොඩ්ඩකට පැත්තකින් තියල අනිච්ච හරියටම දැක ගන්න පුළුවන්ද කියල හොයල බැලීම වැදගත්.

මේ ගැන හොයන්න හදනකොට බොහෝ විට ගැටලුවක් මතුවෙන්න පුළුවන්, මේ කියන්නෙ අනිච්චද නැත්නම් අනිත්‍යද කියල. හැබැයි මේ දහම ගැන ටිකක් හරියට දැනගත්තට පස්සෙනම් ඒක ගැටලුවක් වෙන්නෙ නෑ. දැනට ලංකාවේ අපි කවුරුත් වගේ භාවිතා කරන ත්‍රිපිටක ග්‍රන්ථවල තියෙන අනිච්ච කියන වචනයට තේරුම් තුනක් දීල තියෙනවා. එකක් තමයි අනිත්‍ය කියන එක. හැබැයි ඔය අනිත්‍ය කියන වචනෙ සිංහල නෙවෙයි. ඒක සංස්කෘත වචනයක්. අනිත් එක තමයි අනිසි කියන එක. ඒක නම් සිංහල. නිසි නෑ කියන එකයි මේ කියන්නෙ. යම් වැඩකට ගන්න තරම් වටින දෙයක් නෙවෙයි කියන එක. අනිත් වචනෙ තමයි අනිච්ච කියන එක. ඒක තමයි පාලි වචනය. අපේ ගම්වල ඉන්න ආච්චිල සීයල තමන් අකමැති දෙයක් සිද්ධ වෙච්ච වෙලාවකට, අනේ අනිච්චං කියලයි කියන්නෙ. අනිච්ච කියන වචනෙ මොන භාෂාවට අයිති වචනයක් වුනත් දැන් ඒක සිංහල අපට හුරුවෙලා තියෙනවා. ඒ විතරක් නෙවෙයි සාමාන්‍ය පෙල පන්තියේ විද්‍යාව පාඩම් පොතේ තියෙනවා ඉච්ඡානුග පේෂි සහ අනිච්ඡානුග පේෂි කියල වචන දෙකක්. ඉච්ඡානුග පේෂි කියන්නෙ අපේ කැමැත්තට අනුව ක්‍රියා කරන අතපය ආදී තැන්වල තියෙන මාංශ පේෂිවලට. අනිච්ඡානුග පේෂි කියන්නෙ කිසිසේත්ම අපේ කැමැත්ත අනුව ක්‍රියාත්මක කරන්න බැරි හදවතේ, බඩවැලේ ආදී තැන්වල තියෙන මාංශ පේෂි. විද්‍යාව පාඩම් පොතේ තියෙන තේරුමෙන් අනිච්ච කියන වචනය ඒ විදිහට විග්‍රහ වෙලා තියෙනවා. මේ හේතු නිසා අපේ ආච්චිල සීයල භාවිතා කරන ''අනේ අනිච්චං'' කියන එක ගොඩක් ප්‍රසිද්ධ වෙලා තියෙනවා.

අනිච්ච කියන වචනය මෙච්චර වැදගත් වෙන්නෙ, බුදු දහමේ අවබෝධයේ හදවත විදිහට සැලකෙන තිලකුණ කියල හඳුන්වන අනිච්ච, දුක්ඛ, අනත්ත ලෙස විග්‍රහ කරල තියෙන ලෝක ස්වභාවය නිසාම තමයි. අනිච්ච ගැන හොඳ විග්‍රහයක් යද <u>නිච්ච සූත්‍රයේ</u> තියෙනවා. (සං. නි. 03, අනිච්ච වග්ගය, 38 පිටුව) ඒ අනුව, ''යද නිච්චං තං දුක්ඛං යං දුක්ඛං තදනත්තා, තං යද නත්ථා නේතං මම නේසෝ හමස්මි න මේසෝ අත්තාති. ඒව මේතං යතා භූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං'' කියල විග්‍රහ වෙනවා. ඒ කියන්නේ,

**ලෝකයේ යමක් තමා කැමති නැති ආකාරයට සිද්ධ වෙනව නම් එයින් දුක ඇති වෙන බවත්, දුක ඇති වන ලෝකයේ දේවල් අසාර, හරයක් නැති දේවල් බවත්, ඒ නිසා ,මම, හෝ ,මගේ, ලෙස හෝ සාරත්වයක් ඇති දෙයක් ලෙස හෝ බාර ගන්න සුදුසු නැති බවත්,** එහි යථා තත්ත්වය ප්‍රඥාවෙන් දැකිය යුතු ලෝකයේ යථාර්ථය බවත් අපූරුවට විග්‍රහ කරල තියෙනවා. නමුත් මීට පොතේ තියෙන සිංහල තේරුමට අනුව නම්, යමක් අනිත්‍යද (ස්ථිර නැති බව) ඒක දුකයි, යමක් දුක නම් ඒක අනාත්මයි …… ආදී ලෙසයි පෙන්වන්නේ. හැබැයි ඒ සිංහලට නගල තියෙන අර්ථය පසු කාලීන භාෂා පරිවර්තනයක් මිසක් පෙළ දහම නම් නෙවෙයි.

ඒ වගේම තවත් වැදගත් සූත්‍රයක් තමයි <u>සච්ච විභංග සූත්‍රය</u>. (මජ්ජිම නිකාය 03, 512 පිටුව) මේ සූත්‍රය සැරියුත් මහරහතන් වහන්සේ විසින් ධම්මචක්කප්පවත්තන සූත්‍ර දේශනාව නැවත වාරයක් හොඳින් තේරුම් ගන්න පුළුවන් ආකාරයට සරල කරල විග්‍රහ කරල තියෙන සූත්‍රයක්. ඒකෙන් ලෝකයේ ඇති සියලු දුක්, තමන් කැමති යමක් නොලැබීමේ දුක (යම් පිච්ඡං නලබති තම්පි දුක්ඛං) යටතට අරගෙන තමයි විග්‍රහ කරල පෙන්වල දීල තියෙන්නේ. මේ සියලු සූත්‍ර දේශනා ආශ්‍රයෙන් දැන් වටහා ගන්න පුළුවන් අනිච්ච ස්වභාවය කියන්නෙ මොකක්ද කියල. ඒ වැටහුනු ප්‍රමාණයට අනිච්ච දකින නුවණක් (ඥානයක්) පහල වී ඇත්දැයි විමසා බැලීම වටිනවා. වෙනත් වචනවලින් කියනව නම් චතුරාර්ය සත්‍යය දකින නුවණකුත් (ඥානයක්) පහල වෙලා තියේදැයි විමසා බැලීම වටිනවා.

දැන් මේ ලිපිය කියවල බැලුවම සූත්‍රාර්ථයන් මනාව විමසුම් නුවණින් බැලීමේදී ලැබෙන අවබෝධය අනුව, පහත ප්‍රශ්නවලට විසඳුම් මේ තුළින් ☞

තමන්ටම වැටහෙනවද කියල බලනව නම් ඉතා යහපත්.

1. මේ ලෝකයේදී කෙනෙකුට යම් දුකක් කරදරයක් වුනා නම් ඒක වුනේ මොන අවස්ථාවකදීද?

(තමන් කැමති ආකාරයට දේවල් සිද්ධ නොවෙච්ච වෙලාවකදී පමණයි)

2. එලෙසින් දුක් වෙන්න සිද්ධ වුනේ ඒ අය කුමක් කිරීමට උත්සාහ කරමින් සිටින විටද?

(යමක් කැමති විදිහට සිදු කරවා ගැනීමට උත්සාහ කිරීමේදී )

3. යම් කෙනෙකුට ලෝකයේ යලිත් දුකක් ඇති නොවීමට ඒ අය විසින් කුමක් කළ යුතුද?

(ලෝකයේ කිසිවක්, කිසිවෙකුට කැමති විදිහට කරවීමට හෝ පැවැත්වීමට නොහැකි බව පූර්ණ ලෙස වටහා ගැනීමෙන්.)

4. යම් කෙනෙක් මේ විදිහට ලෝකයේ දේවල් කැමති විදිහට පවත්වා ගන්න නිරතුරුවම උත්සාහ ගන්නේ ඇයි?

(ඔවුන් තුල, ඒ ඒ දේවල් ඒ ඒ ආකාරයෙන් සිදු විය යුතු බවට ඇති කැමැත්තක්, ආශාවක්, උවමනාවක් ඇති නිසා.)

5. ඇත්තටම කෙනෙකුට මේ දුක නැතිකර ගන්න අවශ්‍ය නම්, ඒ අය විසින් මුලින්ම මොකක්ද කරන්න ඕන?

(ලෝකයේ දේවල් මේ මේ ආකාරයට සිදු විය යුතුයි යනුවෙන් ඒ අය තුල ඇති කැමැත්ත (තණ්හාව) නැති කරගත යුතුයි.)

6. ලෝකයේ දේවල් යමෙකුට අවශ්‍ය විදිහට සිද්ධ කර ගන්න ඒ අය තුල ඇති කැමැත්ත නැති කරගන්නේ කොහොමද?

(ලෝකයේ දේවල්වල කිසිදු වටිනාකමක්, හරයක් නොමැති බව නුවණින් (ප්‍රඥාවෙන්) දැන ගැනීමෙන්.

7. ලෝකයේ කිසිදු වටිනාකමක් නැති බව යමෙක් ප්‍රඥාවෙන් (නුවණින්) දැනගන්නේ කොහොමද?

සම්මා දිට්ඨියට පත්වීමෙන්. එනම්, මෙතෙක් කල් ලෝකය නිච්චයි, සුඛයි, අත්තයි, සුභයි කියල තිබ්ච්ච අදහස වෙනස් කරගෙන ලෝකයේ සැබෑ තත්වය වන අනිච්ච, දුක්ඛ, අනත්ත, අසුභ බව නුවණින් වටහා ගැනීමෙන්.

8. ලෝකය අනිච්චයි, දුක්ඛයි, අනත්තයි, අසුභයි කියල නුවණැසින් දැක්කොත් ඒ පින්වතුන් චතුරාර්ය සත්‍යය දැක ඇතැයි සිතිය හැකිද ?

චතුරාර්ය සත්‍යය දකින අරි අටඟි මගේ පළමු පියවර වන සම්මා දිට්ඨිය නමැති මාර්ග හංගය යම් පමණකට වැඩිල අනුලෝම ශාන්තියට පත්වෙලා තියෙනවා.

9. චතුරාර්ය සත්‍යය දැකීමට කුමක් දැකිය යුතුද ? නිවන නිච්ච, සුඛ, අත්ත, සුභ ලෙස දැකිය යුතුයි. එවිට සම්‍යත්ව නියාමයට පත් වී මගඵල ලැබෙනවා. සිවුසස් (චතුරාර්ය සත්‍යය) අවබෝධ වෙනවා.

දැන් ඉතා හොඳින් අවධානයෙන් පරික්ෂාවෙන් බැලිය යුත්තේ මේ දැකපු චතුරාර්ය සත්‍යයමද මේ විස්තර කරල තියෙන්නෙ කියන කාරණය.

1. **දුක්ඛ ආර්ය සත්‍යය**

කැමති සේ නොපවතින පංච උපාදානස්කන්ධය / සලායතන කැමති සේ පැවැත්වීමට කරන උත්සාහය කිසි දිනක සදාකාලිකව පැවැත්විය නොහැකි බවත්, පංචඋපාදානස්කන්ධය ඇසුරු කරමින් සත්වයා බලාපොරොත්තු වන ආස්වාද සුවයත් කැමති සේ නොපවතින බවත්, කෙටියෙන් කියනව නම් සියලු සංඛාර කැමති සේ නොපවතින බව හෙවත් අනිච්ච බව අවබෝධ වීම.

2. **දුක්ඛ සමුදය ආර්ය සත්‍යය**

ලෝකයේ දේවල් මේ මේ ආකාරයට විය යුතුයි, එසේත් නැත්නම් ඒවා මෙලෙස පැවතිය යුතුයි කියල උවමනාවක්, ආශාවක් (තණ්හාවක්) ඇතිව සිටීම දුක් හට ගැනීමට හේතුව බව නුවණැසින් දැකීම.

3. **දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය**

ලෝකයේ දේවල් මේ මේ ආකාරයෙන් විය යුතු බවට ඇති දැඩි කැමැත්ත සම්පූර්ණයෙන්ම අත හැර දැමීම මගින් නැවත දුක් ඇති නොවන ආකාරයට ලෝකයේ දුක් නිරෝධ වන බව නුවණැසින් දැකීම.

4. **දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය**

ලෝකයේ ගත යුතු කිසිදු වටිනාකමක්, හරයක් නැති බව අවබෝධ කරගෙන නිච්ච, සුඛ, අත්ත, සුභ ලෙස මෙතෙක් කල් අල්ලගෙන හිටපු ලෝකය අනිච්ච, දුක්ඛ, අනත්ත, අසුභ ලෙස දැක ලෝකයේ කිසිවක් ඡන්දරාගයෙන් අල්ලා නොගෙන අත්හැරීම, මිදීම තුලින් නිවීම ළඟා කරගත හැකි බව ප්‍රඥාවෙන් වටහා ගැනීම පූර්ණ වනතුරු සතර සතිපට්ඨානයෙන් යුතුව කටයුතු කිරීම.

කල්‍යාණ මිත්‍ර සේවනයෙන් ලැබූ ශ්‍රී සද්ධර්මය සේවනය තුලින් මේ පෙන්වා ඇති අවසන් පියවර දක්වා යම් පුද්ගලයෙක් පැමිණියොත්, ඔහුට අනිච්ච, දුක්ඛ, අනත්ත, අසුභ යන ලෝක ස්වභාවය වැටහී ඇති නිසා, යෝනිසෝ මනසිකාරය ඇති අතර, ඔහු දැන් සිටින්නේ ධම්මානු ධම්ම පටිපදාවේ. මේ අවස්ථාව වෙන කොට දුතීය සාරිපුත්ත සූත්‍රයේ (සං.නි. 5-2, 147 පිටුව) පෙන්වා තියෙන, සෝතාපන්න වීමට අවශ්‍ය සියලු අංග සම්පූර්ණ කර ඇති නිසා ඒ පුද්ගලයා යලි මේ සසරේ කිසි දිනක සතර අපායේ උප්පත්තියක් ලබන්නෙ නෑ.

*වෑරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**විද්‍යාවේදී ඒ. එම් ධනරත්න අල්විස්**
**පැපිලියාන**

# එදා සිටි පැරැන්නන් දේව රැකවරණය ලැබූ හැටි

*(පසුගිය කලාපයෙන් - දේව රැකවරණයට හා සශ්‍රීකත්වයට මනුස්ස ගති සිරිත් බලපාන හැටි...)*



දෙවියන් ගැන කතා කරනකොට දැනගත යුතු විශේෂ කරුණක් තමයි, දෙවියන්ගේ ආශිර්වාදය ලබන අයට අභිවෘද්ධියක් මිස පිරිහීමක් නෑ කියන බුද්ධ දේශනාව. හැබැයි මේ කාරණය වරද්දගෙන නිවන් දකින්න දෙවියන් අදහන්න ගියොත් නම් ඒක මිත්‍යා දෘෂ්ඨියක් වෙනවා. නිවන් දකින්න දෙවියන් තියා මහා බ්‍රහ්මයා ඇදහුවත් බෑ. ලෝකයේ ශාසනයෙන් බැහැරව ඉන්න කවුරු ඇදහුවත් බෑ. ඒකට ත්‍රිවිධ රත්නයම අනුගමනය කරන්න ඕන. නමුත් ලෝකයේ එතෙක් කල් තිබුණු අබුද්ධෝත්පාද කාලයේ ත්‍රිවිධ රත්නයක් විද්‍යමාන වෙලා තිබුනෙ නෑ. මේ නිසා මිනිස්සු දෙවියන්ගෙන් කටයුතු කරවගන්න වැඩ පිළිවෙලකට පුරුදු වෙලා හිටියා. භූමාටු දේව (භූමිය හා සම්බන්ධ) කියල මිනිස්සුන්ගේ ආශ්‍රය තියෙන දේව කොට්ඨාශයන් ඉන්නවා. වැඩි හරියක් වගේ ඉන්නෙ ගස් වැල් පර්වත වගේ දේවල් ඇසුරු කරගෙන. ඒවායේ තමයි විමන් තියෙන්නේ. ඒ නිසා මිනිස්සු මොකද කරන්නේ, ඒවා ආරක්ෂා කරන්න ඒ ගස් කොළන්වලට යම් යම් රැකවරණ ආශිර්වාද දීලා, පොහොර ජලය ආදිය දීලා, ඒවාට මහ වැල් ආදී බාධක තියේ නම් ඒවා සුද්ධ කරල දීලා, මේ ගහට අධිපති දේවතාවෙක් ඉන්නව නම් ඒ අයගේ යහපතටයි මේ ටික කරන්නෙ කියල, ඒ විදියට රැකවරණ දෙනවා. එහෙම උදව් කරල දීල ඒ දේවතාවන්ට තමන්ගෙ ප්‍රශ්ණ කියනවා. මට මෙහෙම ප්‍රශ්ණයක් තියෙනවා, මොකක් හෝ තමන්ගේ බලයකින් ඒක නිරාකරණය කරල දෙන්න කියල ඉල්ලීම් කරනවා. ඉතින් දෙවියන්ටත් දේව පුණ්‍ය සෘද්ධියක් තියෙන නිසා ඒ පුණ්‍ය සෘද්ධියෙන් කරන්න පුළුවන් දෙයක් තියේනම් ඒක කරල දෙනවා. ඒ ආශිර්වාද ලබන අයට ලෞකික අභිවෘද්ධියක් ලැබෙනවා, ඒකෙ අඩුවක් නෑ.

බුදුන් වහන්සේ වජ්ජීන්ට එදා සප්ත අපරිහාණී ධර්ම දේශනා කළා. එහි හයවෙනි කාරණය හැටියට පෙන්නුවේ, **එතෙක් පුද පූජා කරපු පැරණි දේවාල, කෝවිල් ආදී පූජනීය ස්ථානවලට ඒවා කරන්න, ඒකෙන් සතුටු වන දෙව්දේව-තාවන් නිසා ඔවුන්ට අභිවෘද්ධියක් මිස පරාජයක් ලැබෙන්නෙ නෑ කියල.** හැබැයි ලෞකික වශයෙන් මේවා පෙන්නුවාට, නිවන් දකින්න නම් මේ එකක් වත් කරල හරි යන්නෙ නෑ. නමුත් ලෞකික කටයුතු කරගන්න එපා කිව්වෙ නෑ. ඒකෙන් නිවන් දකින්න බෑ කියලයි පෙන්නුවේ. දැන් මේ කාරණය අරගෙන දෙවියන් සම්බන්ධ කරල, ඒක වෙනස් කරල, මේක මිත්‍යා සංකල්පයක්, ශිව ආගමෙන් ගෙනත් තියෙන්නෙ... ආදී වශයෙන් විවිධ මත දෙනවා. නමුත් එහෙම කාරණයක් නෙවෙයි බුදුන් වහන්සේ පෙන්නුවේ. මේ වගේ අවස්ථාවලදී ඊට සුදුසු විශේෂ ගස් වර්ග තියෙනවා. යම් කෙනෙක් විශාල ගොවිතැනක් කරනව නම්, හතර කොනේ කොහොඹ පැළ ටිකක් හිටවල ඒවාට සත්කාර කරනවා. මේ ගහට අධිගෘහිත දේවතාවෙක් ඉන්නව නම් ඒ දේවතාවන්ට විමාන වේවා, මේ කරන පුද සත්කාර නිසා ඒ අයගේ ආශිර්වාදය ලැබී මගේ ගොවිතැන් කටයුතුවලට තියෙන බාධා දුරුවෙන්න මග පෑදේවා කියල ඒ විදියට ලෞකික වන්නා වූ ආධාරයක් උපකාරයක් ලබන්න පුළුවන්. එහෙම ක්‍රමයක් තියෙනවා. මේ සම්බන්ධයෙන් අවුරුදු කිහිපයකට උඩදී දැනගන්න ලැබුනු උදාහරණයක් සඳහන් කළොත්,

එක්තරා කාන්තාවක් කිලෝග්‍රෑම් 300 ක් පමණ බර වට්ටක්ක ගෙඩියක් ප්‍රදර්ශණයකට ඉදිරිපත් කළා. ගොවිතැන් කටයුතු සම්බන්ධ රජයේ මණ්ඩලවලටත් මෙච්චර විශාල එකක් හැදුනෙ කොහොමද කියල හිතාගන්නත් බැරි වුනා. කෘෂිකර්ම නිළධාරීන් අදාල කාන්තාව හමුවෙන්න ගිහින් කොහොමද මේව හැදුනෙ, කොහෙද මේව තිබුනෙ .... ආදී විස්තර අහනකොට, ඒ මගේ දරුවො ඉන්න තැනනෙ කියල වත්තක් පෙන්නුවා. ඒක ඒ කාන්තාව ගොවිතැන් කරන පොඩි බිම් ප්‍රමාණයක්. නමුත් ඇය කැමති නෑ මිරිස් ගහ, වට්ටක්ක වැළ ආදී නම්වලින් ඒවා හඳුන්වනවටවත්. එහෙම කතා කරන්න එපා, ඒ මගෙ දරුවො කියලයි කිව්වෙ. වට්ටක්ක වැලට කියන්නෙ ලොකු දුව කියල. කැකිරි වැලට, පිපිඤ්ඤා වැලට කියන්නෙ පොඩි දුව කියල. මේ වගේ ඒ ගස් වැල්වලටත් එකිනෙකාට සහෝදර සහෝදරියන් විදියට අමතන්න කියල තමයි ඇය කිව්වෙ. නමුත් මේ කාරණය අද දැක්කොත් පිස්සෙකුගේ පිස්සු වැඩක් වගේ තමයි ලෝකයාට පේන්නෙ.

මොනවද දාන රසායන පොහොර වර්ග කියල ඇහුවම, ඔය මොකක්වත් මම දාන්නෙ නෑ, කොම්පෝස්ට් පොහොර දාන්නෙ කියල කිව්වා. මොනවද මේ ගස්වලට ගහන බෙහෙත් වර්ග කියල ඇහුවම, මගේ දරුවො ඉතින් ඒගොල්ලො ඒගොල්ලො රැක ගන්නවනේ! අයියලා, අක්කලා, නංගිලා, මල්ලිලා.... මේ විදියට තමයි උත්තර දුන්නෙ. දැන් මේ නිලධාරීන්ට හිතාගන්නත් බෑ මොනවද මේ උත්තර දෙන්නෙ කියල. මේ තමයි ඒ කාන්තාව උත්තර දුන්නු ක්‍රමය. බටු ගහට යම්කිසි රෝගයක් හැදිල නැත්නම් එතැන හිටවනවා ඒකට ප්‍රතිශක්තිය තියෙන මිරිස් පැළයක්. හිටවල මෙහෙම කියනවා ''ඔන්න මම චූටි අයියට ගෙනත් දුන්න මල්ලි කෙනෙක්, මල්ලි ආරක්ෂා කරගන්න ඕන, පුතාටත් මං මොනව හරි කන්න ගෙනත් දෙන්නම්, මගෙ පුතාට වතුර තිබහද?'' දැන් මේ විදියට පුංචි ළමයින්ට, දූ දරුවන්ට කතා කරනව වගෙයි කතා කර කර තමයි ඒ ගස්වලට පොහොර වතුර දාන්නේ. ඔන්න ලොකු පුතේ මල්ලි බලාගන්න කියල බටු ගහ ළඟින් මිරිස් පැළයක් හිටවනවා. එතකොට මිරිස් පැළේ කොළ කොඩ වෙන්නෙ නෑ. ලොකු ගහක් හිටවල ඒ ලොකු ගහට කියනවා, ඔන්න ලොකු පුතේ මල්ලිලා බලාගන්න, නංගිලා බලාගන්න, කරදර එහෙම වෙන්න දෙන්න එපා, මං ඕගොල්ලන්ටත් මොනවහරි ගේන්නම් කියල.

දැන් මේ අපි දකින්නෙ නැති පැත්තක්. මේ ගස්වල තියෙනවා ශක්ති විශේෂ. ඒ ගස් එකින් එකට ආරක්ෂා කරන කිරණ විශේෂ තියෙනවා. මේවා හැම ගහකින්ම විහිදෙනවා. නවීන විද්‍යාඥයින් පවා අද වෙන කොට ඒව හොයාගෙන තියෙනවා. **කිර්ලියානු ක්‍රමයට ඡායාරූප ගත්තම මේ ගස්වලින් විහිදෙන කිරණ ශක්ති විශේෂයන් අහුවෙනවා.** ඒවායින් විවිධ පරීක්ෂණ කරලත් තියෙනවා. අර විදියට හැඟීම් ඇතිවෙන විදියට කතා කළාම, මේ ශක්ති විශේෂයන් පරිගණක ක්‍රියාත්මක වෙනව වගේ ක්‍රියාත්මක වෙන්න පටන් ගන්නවා. ඒ වගේම **මේ හැම ගහකටම අධිගෘහිතව ඉන්න දේව හෝ අමනුස්ස කොටස් ඉන්නවා. ඉතාම කුඩා තෘණ ශාකවලට පවා ඒ වගේ අය අධිගෘහිතව ඉන්නවා. මේ ගස්වලට කතා කරන කොට ඒ අය ප්‍රිය කරනවා.** ඒ ශාක මළොත් ඒ අය වෙනත් තැන් හොයා ගන්නවා. මෙතනදී ඒ ගස්වලට හිත් තියෙනවා නෙවෙයි. ඒවා හරියට පරිගණක හා සමානයි. පරිගණකයට හිත් නෑ. නමුත් දුන්න දත්තයන්ට අනුකූලව ක්‍රියාත්මක වෙනවා. ඒ වුනත් ඒවා මනුස්සයන් කරන වැඩ. මෙන්න මේ වගේ මිනිස් හිතකින් අර වගේ දේවල් කරනවා, ඒවාට ඒ විදියට ආමන්ත්‍රණය කරනවා. එතකොට ඒවා සරුවට වැඩෙනවා.

ඒ කාන්තාවගේ කොරටුවේ තිබ්බ්ච හැම ගහකටම බොහොම සශ්‍රීක ඵලදාවක් තිබුනා. මේ කාරණය අපි අද දන්නෙ නැතුවට, මීට පෙර අෂ්ඨාංග ආයුර්වේදයේ පවා තිබ්බ්ච ක්‍රමයක්. නමුත් අද වගේ දවසක කිව්වොත් බේතකට ගන්න ඇහැළ ගහක පොත්තක් හෝ මොකක් හරි ගහක පොත්තක් ගේන්න කියල, කැත්තක් හරි පොරවක් හරි අරගෙන කිසිම ඉවක් බවක් නැතිව හොඳ පතුරක් ගහල ගලවගෙන එනවා. මුළු ගහම පෙරළල හරි තමන්ගෙ වැඩේ කරගන්නවා. මේ තමයි අද ගහකින් ප්‍රයෝජන ගන්න හැටි. නමුත් එදා තිබ්බ්ච අෂ්ඨාංග ආයුර්වේදයේ එහෙම නෙවෙයි පෙන්වා තියෙන්නේ. ගහක පොත්තක් ගන්න ඕන නම් ගහ ළඟට ගිහින්, වටපිටාව හොඳට සුද්ද කරල, ගහට පෝර ජලය ආදිය දමල, ගහට ආදරෙන් කතා කරල මෙහෙම කියනවා. ''වෘක්ෂ රාජයාණෙනි, මට මෙහෙම අසනීපයක් තියෙනවා, ඒ සඳහා මට බේත් පොත්තක් අවශ්‍යයි, මට ඒක කරුණාවෙන් ලබාදෙන්න'' මෙහෙම කියල ගහේ යම් තැනක් ලකුණු කරල ඊළඟ දවසෙ ගහට පලුද්දක් කරදරයක් නොවෙන විදියට ඒ ගහට, දිය පොත්තක් ඉතුරු වෙන විදියට අර ලකුණු කරපු පොත්ත හිමින් සීරුවේ ගලව ගන්නවා. ඒ විදියට ලබාගන්න පොත්තේ විශාල ඖෂධ ශක්තියක් ගැබ් වෙනවා. එදා බේත් ගත්තෙ ඒ ක්‍රමයට. පැළයකින් බේතක් ගත්තෙත් මේ ක්‍රමයට. නමුත් මේ ගුප්ත ක්‍රම අද නෑ. ඒවා ගුරු මුෂ්ඨි වශයෙන් තියාගෙන වහගෙන ඉවරයි. එහෙනම් ඒ වගේ ශක්ති විශේෂයන් ගැබ්වෙන ක්‍රම එදත් සොයාගෙන තිබිල තියෙනවා. ඒවා දුන්නෙ ආදියේ හිටපු ඍෂිවරුන්. ඒ ඍෂි භාෂිතය වැහිල ගියාට පස්සෙ අද ඒවා ගණන් ගන්නෙ නෑ.

අපේ පැරැන්නන් මිශ්‍ර බෝග වගාවක් ලෙස තමන්ගෙ ගෙවත්ත සකස් කළා. කොස් ගහට ගම්මිරිස් වැල් හිටෙව්වා. ඒ අතරෙ පුවක් ගස් ආදියත් හිටෙව්වා. ගස් කොළන් අත ගගා උදේට ඒවාට කතා කර කර වත්ත වටේ රවුමක් යනවා. ගොවිරාළ කාලය ගත කළේ මේ ගස් වැල් සමග. ඒ නිසා ඒ අය විශාල ආදායමක් ඒ කාලෙ ලැබුවා. අද මේ සිරිත් වැහිල ගිහින්. ඒ නිසා තමයි අද බෙහෙත් ඖෂධ ශක්ති බොහොම අඩුවෙලා ප්‍රත්‍ය වෙන්නෙ නැති තත්වයට පත්වෙලා තියෙන්නේ. නමුත් එදා ඒ ක්‍රමයට තමයි මිනිස්සු ගස් වැල් ළඟට ගිහින් ඒ කටයුතු සිද්ධ කළේ. මේ ගස් වැල්වල තියෙන අදෘශ්‍යමාන පැත්තක්, පංචේන්ද්‍රිය ගෝචර නොවෙන පැත්තක් දැකපු ඍෂිවරුන්ගෙන් ඒ කාලයේ හිටපු අය ආභාෂය ලැබුවා. ඒ ගස්වලට අධිගෘහිත දේවතාවුන් ඉන්නවා කියන කාරණය ඍෂිවරු දැක්කා. ඒ ගස් කොළන්වලට සාත්තු සප්පායම් ආදිය කරනකොට ඒ දේවතාවන් සන්තෝෂ වෙලා අර විදියට සලකන මිනිස්සුන්ට ආශිර්වාද කරනවා. මල් සුවඳට, මුල් සුවඳට, පොතු සුවඳට, ඵල සුවඳට අරක් ගත් දේවතාවන්, ගස්වලට අධිපති දේවතාවන් විශාල පිරිසක් ඉන්න බව බුදුරජාණන් වහන්සේගේ දේශනාවලත් පෙන්වා තියෙනවා.

මාලුවා කියන වැලේ ඇටයක් සම්බන්ධයෙන් එහෙම අවස්ථාවක කරපු විග්‍රහයක් තියෙනවා. මේ මාලුවා කියන වැලේ ඇටය ඇහැට පේන්නෙ නැති තරම් පුංචි ඇටයක්. අබ ඇටයක් තරම්වත් නෑ. ඒ තරම්ම සියුම් ඇටයක්. මේ ඇටය ගිහින් කොහෙ හරි වැටුනට පස්සෙ කෙස් ගහක අගක් තරම් පුංචි වැළක් තමයි පළමුවෙන්ම හටගන්නේ. ඊට පස්සෙ ඒක ඇදිල ගිහින් පුංචි ගහක එතිල, ක්‍රමයෙන් ලොකු මහත් වෙලා මහ ගහක් වටේ එතිල ගිහින් මුළු ගහම වහගෙන ගහ මරල දානවා. මේ තමයි මාලුවා වැලේ හැටි. දැන් මේ කියන මාලුවා ඇටයක් පුංචි දුහුල් රැනක් එක්ක සුළඟට ගිහින් දේවතාවෙක් ඉන්න විමානයක් තියෙන ගහක් ළඟ වැටුනා. මේ දේවතාවා ඒක දැකල අඬන්න පටන් ගත්තා. ''හරි වැඩේ, මහා විනාශයක් මට වෙන්න යන්නේ! මගේ විමානයත් වැහිල විනාශ වෙලා යනවා...!'' මේ ආදී වශයෙන් අනෙක් දේවතාවුන්ටත් ඇහෙන්න අඬන්න පටන් ගත්තා. ඒක අහපු අනෙක් දේවතාවුන් අඬන්න හේතුව විමසුවා.'' මේ මාලුවා කියන වැළක පුංචි ඇටයක් සුළඟෙ ඇවිත් මගේ විමානය තියෙන වෘක්ෂය ළඟ වැටුනා. දැන් ඉතින් මහා විනාශයක පෙරනිමිත්තක්! ඒකයි මම මේ අඬන්නේ''. මෙහෙම උත්තර දුන්නා. මේක පිළිනොගත් අනෙක් දේවතාවුන් හිනා වෙලා කොළොප්පන් කරල, මේ පුංචි ඇටයකට උඹ අඬන තරම් දුක්වෙන තරම්, මොන තරම් මෝඩකමක්ද උඹ කරන්නෙ කියල කිව්වම, එහෙම කියන්න එපා මේක පුංචි වුනාට ලොකු වුනාම හැටි මෙහෙමයි, මේ මුළු ගහම වැහිල ගිහින් එදාට මගේ විමානෙත් මෙතනින් ඉවරයි, මට වෙන විමන් හොයන්න වෙනවා කියල ඒ දේවතාවා උත්තර දුන්නා. මෙහෙම කියනකොට ඒක ගණන් ගත්තෙ නැති අනෙක් දේවතාවන් අර විදියට, ඕක ගණන් ගන්න එපා, මොණරෙක් හරි ඕක කාල යයි, නැත්නම් ඕක බොල් වෙලා යයි... ආදී කතා කියමින් සනසන්න පටන් ගත්තා. නමුත් ඒ ඇටය මොණරෙකුට, කුඹියෙකුට කන්න පුළුවන් එකක් වත්, සතෙකුට විනාශ

කරන්න පුළුවන් එකක්වත් නෙවෙයි. පසු කාලයක වැහි කාලයක් ඇවිත් ඒ ඇටය පැළවෙලා කෙස් ගහක් වගේ රැනක් හැදිල, ඒක ලොකු වෙලා අන්තිමට මුළු ගහම වහගත්තා. ''මම එදා කිව්වා, උඹල ගණන් ගන්න එපා කිව්වා, අද බලපන් වෙච්ච දේ? දැන් මුළු ගහම විනාශයි ! මගේ විමානෙත් ඉවරයි!'' මෙහෙම කියමින් එදා ඒ දේවතාවා දුක් වුනා.

දැන් මේක බුද්ධ දේශනාවේ තියෙන කතාවක්. මේක පෙන්වා තියෙන්නෙ එක්තරා උපමාවකට. මිනිස්සු පව් කරනවා. සුළු පවක් කරල ඒකට ලතැවුනොත්, ''ඕක සුළු දෙයක් ගණන් ගන්න එපා.....'' මේ ආදී වශයෙන් කියන, ඒක ගණන් ගන්නෙ නැති භෞතික වාදීන් එහෙම නැත්නම් යම්කිසි ආකාර අන්තවාදී පිරිස් ඉන්නවා, නමුත් මේ පාප බීජය අපට පේන්නෙ නෑ. ඒ තරම් පුංචියි. හැබැයි ඒක හැදෙන්න ඉඩ ඇරියොත්, යලි යලිත් පාපයන්ට ගොදුරු වෙවී නොසැළකිල්ලෙන් කටයුතු කළොත්, අර මාලුවා බීජය හීනි කෙස් ගහක් වගේ ඇවිදින් විශාල වෙලා, ගහ වෙලාගෙන විනාශ වුනා වගේ, මුළු අත්බැවම විනාශ කරගෙන සතර අපා ගත වෙනවා. එතැනට යනකල් ඒ පාප බීජය වැඩෙනවා. දැන් මාලුවා ඇටය ගැන සුළුවෙන් නොසිතා ඒ වෙලාවෙම ඒක විනාශ කරල දැම්ම නම් අර ගහේ විනාශය වෙන්නෙ නැතුව වගේ, පාපය සුළුවෙන් හෝ දැක්ක තැනම විනාශ කරල දාපල්ල, එහෙම කරගත්තොත් පාපය නිසා ඇතිවෙන්නා වූ මහා භයානක විපතට උඹල පත්වෙන්නෙ නෑ කියල බුදුරජාණන් වහන්සේ ඔය මාලුවා වැලේ සිද්ධිය උපමා කරල ධර්ම දේශනයක් කළා.

දැන් මේ දේශනාව අපට දෙපැත්තකින් බොහෝ වැදගත් වෙනවා. එකක් තමයි වෘක්ෂ දේවතාවන් ඉන්න බවත්, වෘක්ෂ දේවතාවන්ගේ කතා බහේ හැටිත්, ඔවුන් තමන්ගේ ඒ වෘක්ෂයට තියෙන ආදරයත්, ඒ වෘක්ෂය විනාශ වුනොත් තමන්ගේ විමානය විනාශ වීම දැකල ශෝක වෙන හැටිත් කියන මේ වගේ සිද්ධීන් ලෝකයේ තියෙන බව බුදු ඇසින් දැකල කරපු දේශණා තියෙන බව. (සංයුක්ත නිකාය - දේවතා සංයුක්තය) එහෙනම් අපිට ඒවා නැහැයි කියන්න බෑ. මේ නිසා අපි ඒ අනුසාරයෙන් දෙපැත්තක් දකින්න ඕන.

**එකක් තමයි අංශු මාත්‍ර හෝ පවක් දැක්ක තැන ආයති සංවරයේ පිහිටල, එබඳු පව් නොකර මේ අත්බැව නමැති වෘක්ෂය කරදරයක වැටෙන්න නොදී ආරක්ෂා කරගන්න ඕන කියන කාරණය.** ඒ තමයි ආධ්‍යාත්මික පැත්තෙන් විමුක්තිය පැත්තට මාර්ගය හදාගන්නා හැටි. අනෙක තමයි ඔය දුන්නු උපමාවෙන් ලෝකයේ තියෙන දේවල් තේරුම් ගන්න ඕන. බුදුරජාණන් වහන්සේත් දැක්ක මේ ලෞකික කාරණය සෘෂි වරුත් දැකල තිබුනා. ගස්වලට ආදරයෙන් සළකනකොට ඒ ගහට අධිගෘහිත දේවතාවුන්ට ලොකු සතුටක් ඇතිවෙනවා. ඒ ගහ සරුවට මෝරන කොට ඊට අධිගෘහිත දේවතාවුන් සතුටු වෙලා මිනිස්සුන්ට ආශිර්වාද කරනවා. තමන්ට යහපතක් කරදීම නිසා එසේ සතුටු වන දේවතාවන්, අතදරුවෙක් ආරක්ෂා කරනව වගේ එසේ යහපතක් කරදුන් පුද්ගලයා ආරක්ෂා කරන බවත්, ඒ නිසා ඔහුට අභිවෘද්ධියක් මිස පිරිහීමක් නෑ කියලත් බුදුරජාණන් වහන්සේ දේශනා කරල තියෙනවා.



එහෙනම් එදා සෘෂිවරු පෙන්වා දුන්නෙ බොරුවක් නෙවෙයි. ආදියේ මිනිස්සු ගස් ගල් ඇදහුවා කියන්න හේතුව ඕකයි. හැබැයි ඒක නිවන් මගක් නෙවෙයි. පුතේ අම්ම තාත්ත කියන දේ අහපන්. ඒ අයගෙ රැකවරණයෙන් පිට උඹ හිතුමතේ යන්න එපා කිව්වොත් සහ ඒ පුතා ඒක පිළිගත්තොත් ඒක නිවන් දකින මගක් වෙන්නෙ නෑ. අම්ම තාත්ත කියන දේ ඇහුවට නිවන් දකින්න බෑ. නමුත් බුදුරජාණන් වහන්සේ කියන දේ ඇහුවොත් නිවන් දකින්න පුළුවන්. එතකොට අම්ම තාත්තගෙ අවවාද අනුශාසනා මැද්දේ, ඒ දේ අහන දරුවන්ට අභිවෘද්ධියක් නැද්ද? මොකද අම්ම තාත්ත කියන්නේ ලෝකයේ අත්දැකීම් තියෙන අය. දරුවන්ට ඒ අත්දැකීම් නෑ. දරුවන්ට යහපතක් වෙනවට දෙමවුපියන් කැමතියි. පුතේ දුවේ මෙහෙම හැදියන්, මේ මේ දේවල් කරන්න එපා, මේ මේ යහපත් දේවල් ඉගෙන ගනින්, උඹලට අපි හැම කටයුත්තක්ම කරල දෙන්නම්, කන්න බොන්න දෙන්නම්... ආදී වශයෙන් ඒ අය කරුණාවෙන් අවවාද දෙනවා. ඒ දරුවන් ඒ විදියට දෙමවුපියන් කියන දේ අහල කටයුතු කරගත්තොත් මෙලොව අභිවෘද්ධියක් ලැබෙනවා. හැබැයි ඉතින් දෙමවුපියන් පෘථජ්ජන නම්, බණ අහලත් තිබුනෙ නැත්නම්, අබුද්ධෝත්පාද කාලයක නම් ඒත් දරුවන්ට මේ විදියට අවවාද අනුශාසනා දෙනවා. ඒ ඇහුවත් ඒ දරුවන්ට නිවන් දකින්න නම් බෑ. හැබැයි මෙලොව අභිවෘද්ධියක් ලබන්න නම් පුළුවන්. දැන් ඉතින් දෙමවුපියන් කියන දේ අහල නිවන් දකින්න පුළුවන්ද කියල ඇහුවොත් ඔව් කියන්නද? එහෙනම් ඉතින් අබුද්ධෝත්පාද කාලයෙත් නිවන් දකින්න පුළුවන් වෙන්න ඕන. බුදුරජාණන් වහන්සේගෙන් ඇහුවොත් ස්වාමීනී ඔබ වහන්සේත්, ධර්ම රත්නයත්, සංඝ රත්නයත් අදහන්නෙ නැතිව දෙමවුපියන් කියන දේ අහල නිවන් දකින්න පුළුවන්ද කියල උන් වහන්සේ ඔව් කියයිද? වෙන්න විදියක් නෑ.

එහෙනම් ඒ වගේ ගස් ගල්වලට අධිගෘහිත දෙවි දේවතාවුන්ට සත්කාර උපකාර කළා කියල නිවන් දකින්න බෑ. නමුත් ඒ කාලයෙත් ඒ වගේ දේවල් කරගෙන හිටියම නිවන් දකින්න බෑ කිව්ව මිසක්, බුදුරජාණන් වහන්සේ මෙලොව අභිවෘද්ධිය තහනම් කළේ නෑ, අනුමත කළා. මේ නිසා අදත් අපිට පුළුවන් අපි කරන ගොවිතැන් බත්, බෙහෙත් ආදී කටයුතුවලදී ඉස්සර අපේ පැරැන්නන් භාවිතා කරපු ක්‍රම අනුගමනය කරන්න. එදා ඒ වගේ ක්‍රම භාවිතා කරල තමයි ගොවිතැන් කටයුතුවලට සාත්තු සප්පායම් කළේ. ඒකට අවශ්‍ය කරන ක්‍රම එදා තිබුනා.

පොල් පැළයක් හිටවන කොට පොල් ලෙල්ල වේයො කාල මැරෙනවට අද අපි ලුණු දානවා, පොහොර දානවා, කෘමිනාශක බේත් ගහනවා. නමුත් මෑතක් වෙනකල්ම සමහර පිරිස් කරන වැඩක් තමයි පොල් වලේ පැත්තක හබරල පැලයක් හිටවීම. එතකොට දෙකම ලොකුවට වැඩෙනවා. හබරල ගහ පොල් පැලයට බාධාවක් නෑ. වේයන් වගේ කෘමි සතුන්ගෙන් වගාව ආරක්ෂා කරගන්න හබරල ගහේ එක්තරා ප්‍රතිශක්තිකරණයක් තියෙනවා. හබරල ගහේ මුල, පොල් වලේ හැම තැනම විහිදිලා යන නිසා පොල් පැළය ආරක්ෂා වෙනවා. එතකොට ලුණු දාන්න ඕනත් නෑ, කෘමි නාශක දාන්න ඕනත් නෑ. වේයන්ගෙන් ආරක්ෂා වෙන

පොල් පැළය ලොකු මහත් වෙලා ඒකට අවශ්‍ය කරන කාලය එනකොට හබරල පැලය ස්වභාවයෙන්ම මැරිල ගිහින් පොල් පැළය වැඩෙනවා. ඒ වගේම ආදි පැරැන්නන් කුඹුරු කරනකොට වතුර ගලායන තැනකින් වක්කඩ ළඟ හබරල පැළයකුයි කහ පැළයකුයි හිටෙව්වා. කහ ශාකයේ දිලීර නාශක ශක්තියකුත්, හබරල ගස්වල කෘමීන්ගෙන් ඇතිවෙන්නා වූ විෂ වලක්වන ශක්තියකුත් තියෙනවා. ඒවා වක්කඩ ළඟ හිටවල තමයි කුඹුරු වගා කළේ.

ඒ වගේම මී ගස්, කොහොඹ ගස්, කුඹුක් ගස් වගේ දේවල් හිටවනවා. කුඹුරක් අද්දර මී ගස් කිහිපයක් හිටවනවා. ඒ මී ගස් ඇසුරේ තියෙන ශක්තියක් නිසා කුඹුර පාලු වෙන්නෙ නැතිව සශ්‍රීක වෙනවා. ඒ වගේම පොළවත් එක්ක උෂ්ණව තිබ්ච්ච ප්‍රදේශයක ලිඳක් ළඟ කුඹුක් ගහක් හිටවනවා. කුඹුක් මුල විහිදුනාම ලිඳේ වතුර ඉබේම සීතල වෙනවා. කුඹුක් ගහක් ලිඳක් ළඟ හිටවන්න හේතුව ඕකයි. මේ වගේ දේවල් අදත් අත් දකින්න පුළුවන්.

මේ වගේ, ගස්වලට අධිගෘහිත දේවතාවොත් හිටියා. ඒ දේවතාවෝ ආශිර්වාදයක් කරන කොට ඒ ආශිර්වාදයෙන් අති සියුම් පැත්තක් සකස් වෙනවා. මේ වගේ ක්‍රමවලදී ඒ ඒ ශක්ති විශේෂ තියෙන ගස් කොළන්වලට අනුකූල වන්නා වූ දේවතාවන් අරක් ගන්නවා. **සියලු ගස්වල සියලු දේවතාවන්ට අරක් ගන්න බෑ. ඊට ගැලපෙන ගස්වලට ගැලපෙන දේවතාවන් අරක් ගන්නවා. පුණ්‍ය ශක්තිය, කර්ම ශක්තිය අනුවයි ඒ අයට ඒවා විමන් වශයෙන් ලැබෙන්නේ.** ඊට ගැලපෙන සුදුසු තැනයි ඒ අය තෝර ගන්නෙ. කොහොඹ ගහ සත්තු කන්නෙ නෑ. කෘමීන්ට ඒක ගැලපෙන්නෙ නෑ. ඒ වගේ අවස්ථාවල ඊට ගැලපෙන දේවතාවුන් කොහොඹ ගහට අරක් ගන්නවා. අද යක්ඛ කියන කොට්ඨාශය නම කිව්ව පලියට සියල්ලම මිනී කන යක්කු නෙවෙයි. **යසස් ඇති නිසා යස්ස කියනවා. යසස් ක්ෂය කරපු අයටයි යක්ඛ කියන්නේ.** මෙලොවදී අන්‍යයන්ට උදවු උපකාර කරල යහපතක් කෙරුවොත් ඒ පුණ්‍ය කර්මයට විපාක ඵලයක් ලෙස ඊට අනුකූල වූ ශක්ති විශේෂයක් ඇතිව උපදිනවා. ඉන් පසු ඒ දේවතා අත් බැවට, අපට නොපෙනෙන එක්තරා කිරණ ශක්තියක් විහිදුවන්න පුළුවන් පුණ්‍ය සෘද්ධියක් ලැබෙනවා. මේ විදියට මේ හැම තැනකම මුල ඉතාම සියුම් තැනකින් තමයි පටන් ගන්නේ. ඇහැට පෙනෙන මට්ටමට ආවම විතරයි අපට පේන්නේ. කෘමි උවදුරක් ඇහැට පෙනෙන මට්ටමට එනකොට අපට පේනවා. නමුත් කෘමියාට අවශ්‍ය පරිසරය හැදෙන හැටි අපේ ඇහැට පේන්නෙ නෑ. ඒ පරිසරය හැදෙන මුල් මට්ටම තමයි ඝනීභවන ආපෝ, තේජෝ, වායෝ, පඨවි හෙවත් පස්, ජල, ගිනි, සුළං කියන හතර මතුවීමට පෙර තිබ්ච්ච ඊටත් වඩා ඉතා සියුම් අවස්ථාව. ඒ තමයි ආරම්භය. ඒ ආරම්භක මට්ටමේදී ඇති කරන්නා වූ ප්‍රතිචාර දක්වන දෙයක් ඒකට වෙන් කළා. නරක දෙයක් හටගැනීමේ ආරම්භය ඉතා සියුම්. ඒ සියුම්ව හටගත්ත අවස්ථාව මැඩපවත්වන්න අවශ්‍ය කරන එබඳුම සියුම් කිරණ ශක්තියක් ඇති දෙයක් ඒකට වෙන් කළා නම්, පොරොවෙන් කපන්න තිබ්ච්ච දේ නියපොත්තෙන්ම කඩා දැම්ම වෙනවා. එතකොට මුලින්ම ඒ කරදරය ඉවර කරගන්න පුළුවන්.

ඉතින් අදත් අපිට එදා පැරැන්නන් භාවිතා කරපු ඒ ක්‍රමවේදයන් අපේ ලෞකික වැඩවලට යොදාගන්න පුළුවන්. ගස් කොළන්වලට ඉස්සර මිනිස්සු ආදරය කළා කිව්වෙත් මේ හේතුව උඩ. නමුත් **මෙලොව ජීවත් වෙන්න තිබ්ච්ච මේ වගේ ගුප්ත ක්‍රම ගණන් ගන්නෙ නැතිව අයින් කරපු නිසා තමයි අද කෘමිනාශක බෙත් ගහන්නයි, වල් නාශක බෙත් ගහන්නයි ආදී වශයෙන් කරදරකාරී විනාශකාරී උපක්‍රම භාවිතා කරන්න සිද්ධ වෙලා තියෙන්නේ.** නමුත් අර එදා තිබ්ච්ච වගේ, ඒ වගේ අවස්ථාවලදී තාවකාලික පැලැස්තර නොදමා මුලින්ම කපල දැම්ම නම් මේ වගේ විද්‍යමාන පැත්තට විපාකයක් විනාශයක් එන මට්ටමට නැගෙන්නෙ නෑ. එදා ගොවිතැන් කරපු පැරැන්නෝ ඒ ගොවිතැනට පාඩුවකුත් නොවෙන්න, ඒ වගේම ලෝකයාටත් යහපතක් වෙන ප්‍රධාන ගහක් කොළක් ඒ අතරින් හිටවල සාත්තු සප්පායම් කරල, ඒ ගහත් ඒ ගහට අධිගෘහිතව සිටින්නා වූ දේවතාවුන් ආදී පිරිස්වලටත් ඒ උදව් උපකාර කරල, ඒ අයගේ ආශිර්වාදයන් තුලින්ම තමන්ගේ ස්ථාන හා ඒ ගොවිතැන් ආරක්ෂා කරගත්තා.

මේවා බුදු දහමට පටහැනි දේවල් නෙවෙයි. හැබැයි නිවන් දකින්න බලාගෙන ඕව එකක්වත් කරල හරියන්නෙ නෑ. මේවා ජීවත් වෙන්න කරන ලෞකික ක්‍රම. මිනිස්සු ජීවත් වෙන්න කරන ලෞකික යහපත් වැඩ කටයුතුවලට බුදුන් වහන්සේ දොස් කිව්වෙ නෑ. නමුත් ශ්‍රාවකයන් වහන්සේලාට කිව්වෙ නෑ, මිනිස්සුන්ට ඉස්සෙල්ලම ජීවත් වෙන්න ලෞකිකව මග පාදා දෙන්න කියල. මොකද ඒක භික්ෂූන් වහන්සේලාගේ කාර්යක් නෙවෙයි. ලෝකෝත්තර වූ නිවන් මග පෙන්වලා අනුශාසනා කරන්න කියලයි භික්ෂූන් වහන්සේලා ඇතුළු මහා සංඝ රත්නය ලෝකයට විද්‍යමාන කරල දුන්නේ. මිනිස්සු විවිධාකාර වන්නා වූ දේවතාවුන් ඇසුරු කරගෙන ඒවායින් තමන්ගේ ලෞකික අභිවෘද්ධිය ලබාගන්න ක්‍රමවලට විරුද්ධ වුනේ නෑ. ඒවා කරගෙන ඒවායින් ලබාගත්ත සශ්‍රීකත්වයෙන් භික්ෂූන් වහන්සේලාට දානමාන දීලා තමන්ට උදවු උපකාර කරපු දේවතාදී කොට්ඨාශ ඇත්ද ඒ සියලු දෙනාටත් අර මහා පින අනුමෝදන් කළා. මේ නිසා ශාසනය පහළ වෙන්න පෙර නොතිබුනු මහා වාසනාවක් ශාසනය පහළ වුනාට පස්සෙ පැදුනා. ලැබෙන්න තිබ්ච්ච පොඩි පොඩි පින් වගේ නෙවෙයි මහා පින් කඳන් අර දේවතාවුන්ට ලැබෙන්න පටන් ගත්තා. ඒ නිසා එයින් සතුටු වූ දේවතාවෝ මනුස්සයින්ට අසීමිතව ආශිර්වාද උදවු උපකාර කරන්න පටන් ගත්තා. මේ නිසා මනුස්සයින්ට විශාල සශ්‍රීකත්වයක්, අභිවෘද්ධියක් උදාවුනා.

නමුත් කාලයක් යනකොට විවිධාකාර ක්‍රම රටාවල් මගින් යම් යම් අය තම තමන්ගේ මතිමතාන්තර ඉදිරිපත් කරල, දේව සංකල්පය ඕවට අදාළ වෙන්නෙ නෑ, ඕවා බෞද්ධයන්ට ගැලපෙන්නෙ නෑ, මිත්‍යාදෘෂ්ඨී වැඩ.... මේ ආදී වශයෙන් කියමින් ඒවට පහර ගැහුවා. මේ නිසා සමහර කපටි මිනිස්සු මොකද කළේ, ඒවායින් ආධාර උපකාර ගන්න ක්‍රම රටාව දැනගෙන, අපි ආශ්‍රයෙත් දෙවියො ඉන්නවා, අපිත් දෙවියන්ගේ වැඩ කරන කට්ටිය, අපි ළඟට වරෙල්ල කියල මිනිස්සුන්ගෙන් ගසා කන්න පටන් ගත්තා. විවිධාකාර උපක්‍රම මගින් කපටිකම් කරන්න පටන් ගත්තා, සමාජය දූෂණය කරන්න පටන් ගත්තා. මේ කියන නීච මිනිස්සුන්ගෙ වැඩ නිසා මොකද වුනේ, අර දේව සංකල්පය මගින් ගත් යහපත් පැත්ත නැතිවෙලා ඒ දේව සංකල්පයටත් පහර වදින්න පටන් ගත්තා. මේ නිසා පසුකාලීනව ඒවා ඔක්කොම මිත්‍යාදෘෂ්ඨික වැඩ කියල අර දේවතා සංකල්පයටත් මිත්‍යාදෘෂ්ඨීය කියන නම දැම්මා. නමුත් මිත්‍යාදෘෂ්ඨියක් වුනේ ඒක මුල්කරගෙන කන්න සූත්තර හදාගත්තු අසත්පුරුෂ යන්ගේ වැඩ පිළිවෙල. ඒක ගැලපෙන එකක් නෙවෙයි. ඉන්පස්සෙ මිනිස්සු දූෂ්‍ය පැත්තට යොමු කළා. අපි දෙවියොත් එක්ක එකතුවෙලා වැඩ කරනවා, අපි තමයි මේකෙ ඉන්න ලොකු ප්‍රධාන අය, දේවගැතියෝ... මේ ආදී වශයෙන් කියල අර කපටි සූත්තර කරන මිනිස්සුන්ගෙ උපක්‍රමවලට අහුවෙලා සමාජය විනාශ වුනා. මේ නිසා මිත්‍යාදෘෂ්ඨී වැඩ පිළිවෙල කියන්නේ නියම දේව සංකල්පය නෙවෙයි.

දෙවියන්ගෙන් යම්කිසි විදියේ ආශිර්වාද ලබාගැනීමේ කිසිදු ප්‍රශ්නයක් වැරැද්දක් නෑ. හැබැයි නිවන් දකින්න නෙවෙයි. ලෞකික යහපත සිද්ධ කරගෙන අන්‍යෝන්‍ය සහසම්බන්ධතාව

ගොඩ නගාගෙන කටයුතු කරන්නයි මේ කියන්නේ. එදත් දැහැමින් සාමයෙන් කටයුතු කරගත්තු මිනිස්සුන්ට දෙවියන්ගේ ආශිර්වාදය රැකවරණය ලැබුනා. ඒ තුලින් යහපත ඇසුරු කරල කරපු යහපත් දේවල් නිසා දෙවියන්ටත් නිවන් මග පෑදුනා. මිනිස්සුන්ට නිවන් මඟ පාදගන්න අවස්ථාව ලැබුනා. සියල්ලෝම යහපත උදා කරගත්තා. මේ නිසා අපි දැනගන්න ඕන, බුදුරජාණන් වහන්සේ දෙවියන් විසින් කරන්නා වූ ආශිර්වාදය එපා කියලත් නෑ, දෙවියන්ට කරන පුද පූජාවක් ඇත්නම් ඒක එපා කියලත් නෑ. ඒ කටයුත්ත මුල් කරගෙන නිවන් දැකීමට බුදු දහම වටහාගෙන සියල්ලෝම එකතුවෙලා මේ සසර දුකෙන් නිදහස් වෙන්න මග පාදාගන්න කියල දුන්නු ඒ යහපත් ක්‍රම රටාව අදත් අනුගමනය කරනව නම් යහපත උදා වෙනවා, බාධක නැති වෙනවා. එහෙනම් මෙලොව අභිවෘද්ධියත්, පරලොව අභිවෘද්ධියත් දෙකම ලැබෙනවා. සියලු දුක් නැතිකර ගන්න නිවන් මගත් පෑදෙනවා. මේ කාරණා තුනම සිද්ධ වෙනවා. ඉතින් අපි අදත් දැනගන්න ඕන මේ ක්‍රම අනුගමනය කරල බලන්න.

තණකොළ ගහේ පටන් ඉහලට යනකල් එක්තරා සියුම් දේව අත්බැව්වල ඉඳන් ඉහලට යන අල්පේශාක්‍ය මහේශාක්‍ය කියල දෙවි දේවතාවන් කොටසක් ඉන්නවා. පුංචි පුංචි ගස්වලට සම්බන්ධ වෙච්ච දේවතාවොත් ඉන්නවා. සමහර විට මල් සුවඳට අරක් ගත්තු දේවතාවොත් ඉන්නවා. මේ ලෝකයේ මල් පිපුනම ඒ මල්වල සුවඳ තමයි ඒ ගොල්ලන්ගෙ ආහාරය. මේ නිසා ගෙදර ඉස්සරහ මිදුලේ සමන්පිච්ච වැළක් හිටෙව්වම අපි දන්නෙ නැති පැත්තක් සිද්ධ වෙනවා. මල් සුවඳට අරක් ගත්තු දේවතාවෝ ඒ සමන් පිච්ච මල් සුවඳ ආඝ්‍රාණය කරගන්නවා, ඒ ඇසුරට නිතරම එනවා. ඒ අය නීච අමනුස්සයින් නෙවෙයි. චාතුර් මහාරාජිකයේ ඉඳල එන දේවතා කොට්ඨාශවලට සම්බන්ධ, මල් සුවඳින් ජීවත් වෙන දෙවියන්, දෙවඟනන් ඉන්නවා. අපේ මුතුන් මිත්තන්, ගෙදර ඉස්සරහ මල් වත්තක් වැව්වෙත් මේ හේතුව දැනගෙන ඒ නිසයි. ඒ මල් සුවඳට අරක් ගත්තු දේවතාවන් යම් තැනක් ඇසුරු කළා නම්, ඒ ශාන්තිය ඒ ආශ්‍රයේ ඉන්න පිරිසටත් ලැබෙනවා. ඒ මල් වැල් සකස් කරල දෙන අයට ආශිර්වාදත් කරනවා. ඒ වගේම ඵලබර ගස්වලට අරක්ගත්තු දේවතාවන් ඉන්නවා. ඵලබර ගස් කොලන් හිටවලා සශ්‍රීකත්වයෙන් කටයුතු කරනකොට මිනිස්සුන්ට ඵල ලැබෙනවා වගේ ඒවා ආශ්‍රය කරන දේවතාවන්ටත් දේව විමන් සහිත ස්ථාන ලැබෙනවා. ඒ අයගේ ආශිර්වාදත් ලැබෙනවා. මනුස්සයින්ට බාධක දුරුවෙන්න මග පෑදෙනවා. ඒවා තුලින් බොහෝ යහපත උදාකරගන්න පුළුවන්.

ඒ වගේම ගස් කොළන් හිටවන කොට ප්‍රතිශක්තිය තියෙන ගස් කොළන් පුළුවන් තරම් හිටවගන්න ඕන. එදා බුලත් වැළක් හිටෙව්වම ඒ අතරින් බටු ගහයි මිරිස් ගහයි හිටෙව්වා. එදා බුලත් කොටුවෙ තමයි බටු මිරිස් තිබුනේ. බුලත් වැළ උඩට ගිහින් කොටුවෙ හැදෙනවා. ඒ තරම්ම බුලත් වැළ උස යනවා. බුලත් වැළට හානියකුත් නෑ, බටු මිරිස් ගස්වලට හානියකුත් නෑ. ආදායම් දෙකම ලැබෙනවා. එකින් එක ආරක්ෂා වෙනවා. "බුලත් වැළ මගේ ලොකු දුව, මේ බටු ගහයි මිරිස් ගහයි තමයි මගේ ලොකු පුතයි පොඩි පුතයි'' මෙහෙම කියල, උදේට ඒ ගස් අතගාල ඉඹල තමයි ගොවිරාළ එදා ගොවිතැන් කළේ. නිකන්ම ගහ කියලවත්, වැළ කියලවත් එදා කතා කළේ නෑ. ඒ තරමටම ඒ ගස්කොළන්වලට ආදරෙයි. අදත් ඒ වචන මාළාව විතරක් අරගෙන පරිසරයට අපිත් ආදරෙයි, ආසයි කිය කියා ඉන්නවා මිසක් මේකෙ හේතුඵල සහිත අගමුලක් දකින්නෙ නෑ. නමුත් මේ ක්‍රමයටම තමයි එදත් ආශිර්වාදය ලබාගත්තේ. අදත් මේ ක්‍රම අනුගමනය කරල බොහෝ සශ්‍රීකත්වයක් ලබන්න පුළුවන්. ගොවිතැන් ආදිය කරන කොට ඒකට ගැලපෙන ප්‍රතිශක්තිය තියෙන තවත් ගහක් එතනින් හිටවල, ඒකට ගහ වැළ කියන්නෙ නැතිව බොහොම ආදරෙන් දරුවන්ට වගේ කතා කරල ඒ වගේ සාත්තු කරල බලන්න. හුඟක් සාර්ථක ප්‍රතිඵල ලබන්න පුළුවන්. එතකොට වස විස සහිත තෙල් බෙහෙත් ගහන්න, අමුතුවෙන් පෝර දමන්න ඕන නෑ.

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# හෙළ බොදු පියුම දහම් සඟරාවේ 20 වන කලාපය සඳහා ශ්‍රමය හා මූල්‍යමය දායකත්වය සැපයූ පිංවතුන්

## ශ්‍රම දායකත්වය

♦ ධම්මික සේනාධීර මහතා - නෙක්මෝ කම්පියුටර්ස් ආයතනය - මාලබේ ♦ අසංග මංජුල කුමාර මහතා - හෝමාගම ♦ සමන් සිල්වා මහතා - කළුතර ♦ රාජ් නිල්මිණි විජේවික්‍රම මහතා - ගොඩගම ♦ ඩී.සී.ආර්. ඇක්සස් මුද්‍රණාලයේ චන්දිම පෙරේරා මහතා ඇතුළු කාර්ය මණ්ඩලය - පිටකෝට්ටේ ♦ චිත්‍ර ශිල්පී එස්.එම්. ජයසේකර මහතා - මාලබේ ♦ චන්දන සිරිවර්ධන මහතා - අලපලාදෙනිය ♦ ෆික්රි ඉස්මයිල් මහතා - ගොතටුව ♦ ගයාන් ගුණරත්න මහතා - ගොතටුව ♦ රජිතා විදුරංසි ජයසේකර මහත්මිය - කැළණිය ♦ ඩබ්.ඒ. තිළිණවතී මහත්මිය - කඩවත ♦ ප්‍රසාද් ද සිල්වා මහතා - දෙල්ගොඩ ♦ ඒ.එම්. ධනරත්න අල්විස් මහතා - පැපිලියාන ♦ ඉමාෂි මුද්‍රණාලයේ අධිපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලය ♦ නන් අයුරින් දායක වූ පින්වතුන්

## මූල්‍යමය දායකත්වය

♦ ප්‍රියනාත් ආරියරත්න මහතා ඇතුළු පවුලේ සැම - කුරුණෑගල - රු. 10,000/- ♦ සමන් සිල්වා මහතා - කළුතර - රු. 10,000/- ♦ බිනග සමාධිත් සිල්වත්ගේ පුතා ඇතුළු පවුලේ සැම - බත්තරමුල්ල - රු. 6,000/- ♦ අමිත් හඳුගොඩ මහතා - අත්තිඩිය - රු. 5,000/- ♦ චරිත් ඉන්දික මහතා - ඉතාලිය - රු. 5,000/- ♦ තුසිත නාකන්දල මහතා - ගල්කිස්ස - රු. 5,000/- ♦ කැළුම් ලංකේශ්වර මහතා ඇතුළු පවුලේ සැම - නෙළුව - රු. 5,000/- ♦ ශිරෝමි අත්තනායක මෙනෙවිය - කිරින්ද රු. 3,000/- ♦ බිනාදි යොහන්සා දියණිය ඇතුළු පවුලේ සැම - පානදුර - රු. 2,500/- ♦ කේ. ඒ. ජයරත්න මහතා ඇතුළු පවුලේ සැම - හොරතුඩුව - රු. 2,000/- ♦ සහනි මංජිතා වීරසේකර මෙනෙවිය - නුගේගොඩ රු. 2,000/- ♦ දර්ශන පෙරේරා ☞

මහතා - පිළියන්දල - රු. 2,000/- ♦ කෝෂලා සිරිවර්ධන මෙනෙවිය - ගාල්ල - රු. 2,000/- ♦ නිහාල් රත්නායක මහතා - හිරිපිටිය - රු. 2,000/-♦ අයිරාංගනි තිලකරත්න මහත්මිය - නාවල - රු. 1,500/- ♦ අමිල සල්ගාදු මහතා - බෝමිරිය රු. 1,500/- ♦ චම්පිකා විදානපතිරණ මහත්මිය සහ ජනිත විදානපතිරණ මහතා - අත්තිඩිය රු. 1,300/- ♦ ඉන්ද්‍රානි විශාකා ජයසිංහ මහත්මිය - බොරලැස්ගමුව - රු. 1,000/- ♦ අනුරුද්ධ පෙරේරා මහතා - කිරුලපන රු. 1,000/- ♦ ප්‍රසන්න සිල්වා මහතා - ගල්කිස්ස - රු. 1,000/- ♦ එස්.ඩී.පුණ්‍යාවතී මහත්මිය - පිළියන්දල රු. 1,000/- ♦ දිලිනි රන්දිකා විජේකෝන් දුව - වලස්මුල්ල රු. 1,000/- ♦ පී.ඒ.ඥානවතී මහත්මිය - තුඩුමුල්ල රු. 1,000/- ♦ සුජාන් කරස්නාගොඩ මහතා - ගම්පහ රු.1,000/- ♦ ටී.ජී. කරුණාවතී මහත්මිය - හක්මන රු. 1,000/- ♦ ටී. කරුණාවතී පෙරේරා මහත්මිය - හොරණ රු.1,000/- ♦ කේ.කේ.ඩී. ප්‍රේමතිලක මහතා - කඩවත රු. 1,000/- ♦ රූපවතී රුද්‍රිගු මහත්මිය - පිටිපන රු. 1,000/- ♦ ශ්‍රියා කුමාරි මල්ලිකා මෙන්ඩිස් මෙනෙවිය - අහුංගල්ල රු. 1,000/- ♦ මධුභානි කලුවැව මහත්මිය - මාලබේ රු. 1,000/- ♦ රුවන් රණසිංහ මහතා - පන්නිපිටිය රු. 1,000/- ♦ පී.සංජය රණවීර මහතා ඇතුළු පවුලේ සැම - මහරගම රු. 1,000/- ♦ ශ්‍යාමල් බණ්ඩාර මහතා - කුරුණෑගල රු. 1,000/- ♦ එච්. පී. විජේරත්න මහතා - කිරුලපන රු.1,000/- ♦ මනෝජ් ජයසූරිය මහතා - මහරගම, රංජිත් වික්‍රමසිංහ මහතා - කඩිගමුව, උපුල් විජේනායක මහතා - මාවනැල්ල, ඉසුරු සම්පත් මහතා - කළුතර, කුමාරි ගොඩවිට මහත්මිය - කුරුණෑගල, පතිරණ විජේතිලක මහතා - හෝකන්දර, සුජාතා දසනායක මහත්මිය - දෙහිවල, ශාන්ත මාරසිංහ මහතා - මහනුවර, දුමින්දා සංජීවනී මහත්මිය - නිට්ටඹුව, සුභාෂිනී අබේරත්න මහත්මිය - වත්තල, ශ්‍රී රංජිත්සිංහ මහතා - කැළණිය, මල්කාන්ති තේනබදු මහත්මිය - මොරටුව, විපුල සංජීව මහතා - හෝමාගම - රු. 8,100/- ♦ එකතු වූ සියලු මුදල් පරිත්‍යාග රු. 90,900/- ♦ පළමු පිටපත් 7000 සඳහා මුද්‍රණ වියදම රු. 171,500/- ♦ අනෙකුත් වියදම් - 6,590/- ♦ සම්පූර්ණ වියදම - රු. 178,090/- මුද්‍රණ කටයුතු සඳහා ගිය හිඟ මුදල සඟරා අලෙවියෙන් පියවා ගන්නා ලදී.

**ඉහත නම් සඳහන් පිංවත් පිරිස ඇතුළු ආධාර උපකාර කළ සියලු දෙනා සිදු කරගත් මේ පුණ්‍ය කුසල ආශිර්වාද හේතු කොටගෙන, අනන්ත සසරේ පටන් මේ දක්වා තම තමන් අතින් අවැඩ, අසාධාරණ, වැරදි, ප්‍රමාද දෝෂවලට ලක් වූ සියලු දෙනාට මෙන්ම උදව් උපකාර කළ සැමටත්, මියගිය සතර වරිගයක ඥාති මිත්‍රාදීන්ටත් මේ පුණ්‍ය කුසල ආශිර්වාද විහිදී පැතිරී පිහිටා සුඛිත මුදිත වෙත්වා, සුගතිගාමීව තම තමන්ගේ පැතුම් පරිදි නිර්වාණාවබෝධයටද හේතු වාසනා වේවා!**

**එම ආධාර උපකාර කළ පිංවත් පිරිස් ඇතුළු සිය පවුල්වල සැමටත්, කරන කියන යහපත් රැකී රක්ෂා ව්‍යාපාර ආදියෙන් සියලු ජයග්‍රහණයන් අත් වේවා. දූ දරුවන්ගේ අධ්‍යාපන ආදී කටයුතුවලින් විශිෂ්ඨ ජයග්‍රහණ අත් වී සුචරිත පිරිසක් වී සියලු අභිවෘද්ධිය උදා වේවා!**

**සියවස් ගණනාවකට පෙර සැඟව ගිය නිමල බොදු මග යළි පුබුදුවමින්,**
**හෙළ බොදු පියුම දහම් කරුණු ඔබ වෙත රැගෙන එන්නේ, බුදු පියාණන් වහන්සේ අනුදැන වදාළ,**
**අග්ගඤ්ඤ සූත්‍රය, නිරුත්තිපථ සූත්‍රය සහ අරණවිභංග සූත්‍රය යන සූත්‍රාන්තයන්ට අනුව,**
**දහම් පදවල සැඟවුණු දහම් අරුත් මතු කරන පද නිරුක්ති සහ**
**අතීතය, වර්තමානය, අනාගතය හඟවන තුන්කල් නිරුක්ති සහිත ව්‍යවහාර ශබ්ද**
**නිරුක්ති ක්‍රමවේදය අනුව මිස, උන්වහන්සේ අනුමත නොකළ ලිඛිත භාෂා රීති සහිත**
**බමුණන්ගේ ත්‍රිවේද නිරුක්ති මත නොවන බව සලකන්න.**

**පින්වත් ඔබ වෙනුවෙන් එළි දැක්වූ දහම් ගබඩාවන්...**

www.hiddendhamma.net mp3.hiddendhamma.net www.helabodhupiyuma.net www.aaryadharma.org
විද්‍යුත් ලිපිනයː webmaster@helabodhupiyuma.net දු.අː- 071 3046895

**සැඟවුණු බොදු මග යළි විවර කරමින් වහරක අරිය චින්තාශ්‍රම බෞද්ධ විහාරස්ථානයේ සදහම් වැඩසටහන් පැවැත්වෙන කාල හෝරාවන්ː**

සැම පුන් පොහෝ දිනකම සහ සැම අමාවක පොහොය දිනකම උදෑසන 8.00 සිට සවස 5.00 දක්වා - පෙහෙවත් සමාදානය, දහම් සාකච්ඡා සහ විශේෂ පුණ්‍යානුමෝදනාව.

ගමන් මාර්ගයː නිට්ටඹුව - රුවන්වැල්ල ප්‍රධාන මාර්ගයේ ගෝණගල්දෙනිය හන්දියේ සිට වහරක අතුරු මාර්ගයේ මීටර 350 ක් පමණ දුරින් දකුණු පස.




**සැම පුන් පොහෝ දිනකම සහ සැම අමාවක පොහොය දිනකම උදෑසන 8.00 සිට සවස 5.00 දක්වා පැවැත්වෙන සදහම් වැඩසටහන් මාලාව සජීවීව විකාශනය කෙරෙන අන්තර්ජාල ගුවන් විදුලි සේවාවට සවන්දීම සඳහා www.waharaka.com වෙබ් අඩවිය ඔස්සේ ''දම් සහා ගුවන් හඬ''ට පිවිසෙන්න.**



# පහත් තැනින් දිය බැස යයි...



පහත් තැනින් දිය කඳ බැසගෙන යෑම
නැවැත් විය නොහැකි දම් නියමය සේම
මහත් කම් කියා පොඩි උන් තෙරපීම
තවත් සුලභ කරුණකි ලොව හැම දාම

තමන් කළ වරද වහ ගන්නට ඕන
ගමන් දුබල තැනකට පැන යයි පේන
ගලන්නට නොහැකි විට දිය කඳ ගේන
යොමන්නේ පහත් බිමකටමයි පේන

පහසුව බලා දිය පහළට ගිය දාක
අහනට දෙයක් නොව පොදු කරුණකි ඒක
සහයට නොමැති විට දුදනෙකු හට දේක
දහමට ඔබින බව කුමටද වුව තෝක

ඇතුවට බුදු දහම ලොව තුළ දුලභ තැනේ
පොතු ජන සොබා හැම කල එක ලෙසට වුනේ
මතු එන බවට දැනුනොත් තම වෙතට හෙණේ
නැතුවට කමක් නැත පණ මළ කුණද ගැනේ

ලොව ඇති කාම සම්පත් ලැබ ගැනීමට
පවතින තැනින් බැරි විට වැට පැනීමට
නිවටව ගොසින් අසුවන විට දැනීමට
නවනට බලයි අසරණයෙකු දිනීමට

බල පුළුවන් කමද නිලයද සිතට ගෙන
කල එන විටදී වළ ඉහ ගන්නටම පැන
ගෙල සිර කරන්නට අල්ලන පහසු තැන
කෙළ ගිලගන්න බැරි මිනිසෙකි ලොවෙහි වන

පබැඳුම - නීතිඥ චන්දන සිරිවර්ධන

නීතිඥ චන්දන සිරිවර්ධන විසින් නුගේගොඩ ගංගොඩවිල විහාර පාරේ අංක 96/A දරණ ස්ථානයේ පිහිටි ඉමාෂි මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී

# වෙසක් සඳ
# බැස ගියා...



ලෙල දුන් කුඩු කොඩි වැල් සැරසිලි ආදී
සුළඟින් පොදින් තෙමිලා ඉරිලා සේදී
පෙළකින් පහන් කර වූ නෙක නෙක වීදී
කලකින් වැසී ඇත ලෝ තතු පහදා දී

මුල් වී වෙසක් තුන් ලොව දිනූ මුනිඳු ගැන
ලොල් වී බැතින් සිත් සැරසිලි කෙරුව තැන
දැල් වූ පහන් සිළු අඟුරුව නිවුනු මෙන
වල් වී පෙනෙත් පෙර සිරි ලෝ දහම කින

මලින් වට්ටි පුරවා සුදු වතින් වෙලී
පෙළින් පෙළ සැදී හද මෙත් ගඟින් ගිලී
තෙලින් පැනින් පිදූ සිත් නෙක බැතින් ඇලී
කලින් දුටු එසිරි ඇත හදවතින් හැලී

තැනින් තැන ඇසුණු බැති ගීවල නාදේ
සැණින් ගොළුව යළි ලෝකය ගැන වාදේ
දණින් නැමී පෝ දවසෙම කළ කී දේ
වෙනින් අත දුවයි ගැලවුණු ලෙස රෝදේ

එදා වෙසක් සඳ බැබලුණු අහස් කුස
මෙදා දහස් ගුණයෙන් නැත ගිහින් බැස
වදා මහත් පින්කම් කළ වෙසක් රස
සදා නොමැත ඇවිදින් ගිය දෙයක් මිස

දනට පිනට යොමු වුණු සිත් නොවුණු මඳ
සැමට ඇරයුමින් පෙන්වුණු පිරුණු හද
බණට සවන් යොමු කර සිටි අයුරු සොඳ
දිනට වෙසක් පමණද අන් දිනද වෙද ?

වසරක වෙසක් මාසේ එන සැණකෙළිය
හිස සිට පතුළ තෙක් දන් දෙයි නැත මැළිය
මසකට වඩා දිගු නැති බැති සිත් එළිය
බැස යන විටදී එන්නේ තුන් දොස් දැලිය

වෙසගේ වුවත් ඇති සැරසිලි මෙලෙස දැක
ඇස යොමු කළොත් නිවනට තතු දැකිය හැක
පසටම දිරා යන මේ සැරසිලිද නෙක
තොස නැත ගෙනෙන වැනසෙන විට දෙවන දුක

පබැඳුම - නිහිඟු චන්දන සිරිවර්ධන